පාලි යතුර

05 ශ්‍රේණිය

රාජකීය පණ්ඩිත පදියතලාවේ ඤාණවිමල හිමි

මො / ශ්‍රී විද්‍යානන්ද පිරිවෙණ
යල්කුඹුර - බිබිල

077 8438417
070 6438417

WWW.PIRIVENA.LK

වචනයක්..................

මූලික පිරිවෙන් පස්වැනි ශ්‍රේණියේ අධ්‍යාපන හදාරන සිසු දරුවන් වෙනුවෙන් පාලි පෙළ පොතේ පාඩම් සඳහා සකස් කළ පිළිතුර පොත 'පාලි යතුර - 05' ලෙසින් ඔබ අතට මෙලෙසින් පත් කෙරේ. වර්තමානයේ පැන නැගී ඇති කොවිඩ් වසංගතය හේතුවෙන් සිසු දරුවන්, ගරුභවතුන් දැඩි අසීරුතාවලට ලක් වී ඇති බව අමුතුවෙන් කිව යුත්තක් නොවේ. පෙළ පොත ඇසුරු කර පාඩම් අධ්‍යයනය කරන සිසුන්ට අදාළ අභ්‍යාස සඳහා පිළිතුරු ලියා එය පරීක්ෂා කර බැලීමේ අවස්ථාවක් ලබා දීම මෙම පොත රචනයේ අපේක්ෂාවයි.

මෙම පොතෙහි අකුරු 110,000කට අධික ය. වචන 22000කට ආසන්න ය. අකුරක් පාසා ඇත්තේ වෙහෙස මහන්සිය යි. මෙය මාසයක පමණ කැපවීමේ ප්‍රතිඵලයකි. එබැවින් මෙයින් උපරිම ප්‍රයෝජන සිසුන් ලබා ගනු දැකීම රිසි වෙමි. මෙහි අක්ෂර දෝෂ තිබිය හැකි ය. එවැනි තැන් ඇතොත් නිවැරදි කර සිසුන් වෙත යොමු කිරීම ගුරුභවතුන්ගේ වගකීමකි. පාලි භාෂාවෙන් ව්‍යක්ත පරපුරක් බිහි වනු දැකීම ඒකායන ප්‍රාර්ථනාවයි.

තෙරුවන් සරණයි.

පදියතලාවේ ඤාණවිමල හිමි
පරිවේණාධිපති

මො / ශ්‍රී විද්‍යානන්ද පිරිවෙණ
යල්කුඹුර, බිබිල

2021. ජූලි. 23 (ඇසළ පොහෝ දින)

077 84 38 417
072 24 38 417
070 64 38 417

WWW.PIRIVENA.LK

පිදුම

මුල් ම පාලි අකුර ඉගැන් වූ

සේනාපතියේ විමලරතන පණ්ඩිත හාමුදුරුවන්ට

පාලි ඉගෙනුමේ දෙවැනි ගුරුපියාණන් වන

ජයන්ත බණ්ඩාර ගුරුතුමන්ට

භක්ත්‍යාදරයෙන් ......

WWW.PIRIVENA.LK

පළමු වන පාඩම

අභ්‍යාසය

01. 'නමො මහා කාරුණිකස්ස තස්ස' යටතේ ඇති ගාථා සිංහලට නගන්න.

පඨමො පාඨො

නමො මහාකාරුණිකස්ස තස්ස !!!

යො කප්පකොටීහිපි අප්පමෙය්‍යං
කාලං කරොන්තො අතිදුක්කරානි,
ඛෙදං ගතො ලොකහිතාය නාථො
නමො මහාකාරුණිකස්ස තස්ස.

අසම්බුධං බුද්ධනිසෙවිතං යං
භවාභවං ගච්ඡති ජීවලොකො
නමො අවිජ්ජාදිකිලෙසජාල
විද්ධංසිනො ධම්මවරස්ස තස්ස.

ගුණෙහි යො සීලසමාධිපඤ්ඤා
විමුත්තිඤාණප්පභූතීහි යුත්තො
ඛෙත්තං ජනානං කුසලත්ථිකානං
තමරියසඞ්ඝං සිරසා නමාමි.

(සමන්තපාසාදිකා)

1. ලෝක නායක වූ යම් සර්වඥයන් වහන්සේ නමක් කප් කෙළ ගණනිදු පමණ නොකළ හැකි කලක් මුළුල්ලෙහි අතිශය දුෂ්කර ක්‍රියාවක් කරනුයේ ලෝක සත්ත්වයාට හිත පිණිස, කායික පරිශ්‍රමයට පැමිණියේ ද, මහා කරුණික වූ ඒ ලෝක නායක වූ සර්වඥයන් වහන්සේට මාගේ නමස්කාරය වේවා.

2. බුදුරදුන් විසින් නිති ඇසුරු කරන ලද යම් සපර්යාපත්තික නව ලෝකෝත්තර ධර්මයක් අවබෝධ නොකිරීම හේතු කොටගෙන, සත්ත්ව ලෝකය කුඩු මහත් වූ භවයෙන් භවයට

WWW.PIRIVENA.LK

යේ ද, අවිද්‍යාදි ක්ලේශ සමූහය නසන සුලු වූ ඒ උතුම් ධර්මයට මාගේ නමස්කාරය වේවා.

3. ශීල සමාධි ප්‍රඥා විමුක්ති විමුක්තිඥානාදි ගුණධර්මයන්ගෙන් යම් ආර්ය සමූහයක් යුක්ත වූයේ ද, පින් කැමති ජනයන්හට කෙතක් වැනි වූ ඒ ආර්ය සංඝරත්නය මස්තකයෙන් වදිමි.

02. පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. මහාකාරුණිකො කිත්තකං කාලං අතිදුක්කරානි අකාසි ?
මහාකාරුණිකො කප්පකොටිහිපි කාලං අතිදුක්කරානි අකාසි.

ii. නාථො කස්මා බොධං ගතො ?
නාථො ලොකහිතාය බොධං ගතො.

iii. කස්මා ජීවලොකො භවාභවං ගච්ඡති ?
අවිජ්ජාදිකිලෙස ජාල නිස්සාය ජීවලොකො භවාභවං ගච්ඡති.

iv. අරියසඞ්ඝා පන කස්ස පුත්තා හොන්ති ?
අරියසඞ්ඝා පන තථාගතස්ස පුත්තා හොන්ති.

v. අරියසාවකා කීදිසෙහි ගුණෙහි සමන්නාගතා භවන්ති ?
අරියසාවකා සීලසමාධිපඤ්ඤාදි ගුණෙහි සමන්නාගතා භවන්ති.

03. ගාථා ඇසුරින් පිළිතුරු සපයන්න.

1. 'කප්ප' යන පදය විවරණය කරන්න.

කල්පය මේ යැයි සංඛ්‍යාත්මකව දැක්වීම අපහසු ය. එහෙත් මේ පිළිබඳ උපමාවක් ඇත. එනම් දිග හා පළල යොදුන බැගින් ඇති හතරැස් කොටුවකට අබ ඇට පුරවා වසර සියයකට වරක් එහි අබ ඇටයක් ඉවත් කිරීම නිසා එකී කොටුව හිස් වන්නේ ද එසේ කොටුව හිස් වුණත් කල්පය ගෙවී අවසන් නැත.

WWW.PIRIVENA.LK

සූත්‍ර පිටකයට අයත් සංයුක්ත නිකායෙහි අනමතග්ග සංයුක්තයේ සාසප සූත්‍රයෙන් කල්පය පිළිබඳව උපමාවක් ඇසුරෙන් බුදුරදුන් පැහැදිලි කර දී තිබෙනවා. දිනක් එක්තරා භික්ෂුවක් විසින් ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස කල්පය යනු සංඛ්‍යාත්මකව දැක්විය නො හැකි දෙයක් නම් එය උපමාවක් මගින් හෝ පහදා දෙන මෙන් ඉල්ලා සිටිනු ලැබුවා. එවිට අප ගෞතම බුදුරදුන් මෙලෙස පැහැදිලි කිරීමක් කළ සේක.

මහණෙනි දිගින්-පළලින් හා උසින් යොදුන බැගින් වූ ප්‍රාකාරයකින් (තාප්පයකින්) වට වූ නගරයක (භූමියක) සම්පූර්ණයෙන් ම අබ ඇට පුරවා (අතුරා) කිසියම් කෙනෙකු අවුරුදු සියයකට වරක් එයින් එක අබ ඇටය බැගින් ඉවත් කරයි නම් ඒ අනුව ඉතා දීර්ඝ කාලයක් ගත වීමෙන් එහි අබ ඇට සියල්ල ම ඉවත් වී අවසන් වී යා හැකි ය. එහෙත් කල්පයක් ගෙවී අවසන් නො වේ. කල්පය යනු ඊටත් වඩා දිගු වූවක් තව ද අනමතග්ග සංයුක්තයේ පබ්බත සූත්‍රයෙහි එන කසීසළු හෙවත් පර්වත කල්ප උපමාවෙන් ද ගෞතම බුදුරදුන් කල්පය යනු කොතරම් දීර්ඝ කාල පරාසයක් දල යන්න පිළිබඳව මෙබඳු පැහැදිලි කිරීමක් කර තිබෙනවා.

මහණෙනි යම් සේ දිගින්ල පළලින් හා උසින් යොදුනක් (නූතන සැතපුම් දහසයක්) බැගින් එක සමාන වූ ඒක ඝන (මැද හිස් නැති) මහා කළුගල් පර්වතයක් වේ ද එම කළුගල් පර්වතය (දේවතාවෙකු හෝ අසලින් යන කෙනෙකු) අවුරුදු සියයකට වතාවක් ඉතා සිනිඳු කසී (සේද) සළුවකින් පිරිමැදීම (පිස දැමීම) නිසා ඉතා දීර්ඝ කාලයක් ඇවෑමෙන් මේ මහා පර්වතය සම්පූර්ණයෙන් ගෙවී අවසන් වී යා හැකියි. එය එසේ ගෙවී අවසන් වූවත් කල්පයකට ඇති කාලය හෝ අවුරුදු ගණන අවසන් නො වේ

සංයුක්ත නිකායේ අනමතග්ග සූත්‍රයේම තවත් සූත්‍ර දේශනාවකින් කල්පවල කාලය ගතවීම වගේ ම අපේ භවයේ (සසර) දිගු බව ගැනත් විස්තර කර තිබේ. දවසක් එක්තරා බමුණෙකු බුදු හිමියන් සමීපයට පැමිණ ලෝකයේ කාලය දැනට කොතෙක් ඉක්මවා ගොස් තිබේ දැයි ඒ වගේ ම දැනට ඉක්ම ගොස් ඇති කල්ප ගණන කොපමණ ද යනුවෙන් විමසා සිටියා. එවිට බුදුරදුන් විසින් ඔහුට මෙසේ පිළිතුරු දෙනු ලැබුවා.

WWW.PIRIVENA.LK

බ්‍රාහ්මණය මෙතෙක් ඉක්ම ගොස් ඇති කල්ප ඉතා බොහෝ ය. ඒවා සිය ගණනක් ය දහස් ගණනක් ය ලක්ෂ ගණනක්ය කියා ප්‍රමාණයෙන් දැක්විය නො හැකි තරම් ය. බ්‍රාහ්මණ ය මේ ගංගා නදිය පටන් ගන්නා තැන සිට මුහුදට වැටෙන තැන දක්වා වූ සියලු ම වැලිකැට ප්‍රමාණය ගැණිය (ගණන් කළ) නො හැකි සේ අතීතයේ ගත වූ කල්ප ගණනත් ප්‍රමාණය කළ නො හැකි වේ

ප්‍රඥාධික බුදු කෙනෙකු වූ අප ගෞතම බුදුරදුන් සාරාසංඛ්‍යය කල්ප ලක්ෂයක් පුරා පෙරුම්දම් (පාරමී) සම්පූර්ණ කළා. මෙයටත් පෙර මහා බෝසතාණන් විසින් දීපංකර බුදුන් ඉදිරියේ නියත විවරණ ලැබීමට පෙර මනෝ ප්‍රණිදානය සහ වාක් ප්‍රණිදානය ලෙස දහසය අසංඛ්‍ය කල්ප ලක්ෂයක් අනියත විවරණ සම්මා සම්බුදුවරු 512000 ක් හමුවේ පුරනු ලැබුවා. මේ අනුව ගෞතම බුදුරජුන් ගේ මුළු පාරමී කාලය විසි අසංඛ්‍යකුත් කල්ප ලක්ෂයක් වන අතර එම කාලය තුල හමු වූ සම්මා සම්බුදුවරු ගණන 512027 නමක් වන බව දත යුතු ය.

අනාගතයේ වීර්‍ය්‍යාධික බුදු කෙනෙකු ලෙස මතු බුදුවන මෛත්‍රීය බෝසතුන් සොළසාසංඛ්‍යය කල්ප ලක්ෂයක් තිස්සේ පාරමී දම් පුරා සිටිනවා.

2. ඇඳිලි බැඳ නමස්කාර කිරීම යනු කුමක් ද?

දොහොත් නළලේ තබා වැඳීම

3. අවිද්‍යාව අන්ධකාරයකට සමාන කොට ඇත්තේ කුමක් හෙයින් ද?

අවිද්‍යාව නම් නොදැනීමයි. අන්ධකාරය නම් අඳුරයි. නොදැනීම නිසාත් අන්ධකාරය නිසාත් මිනිසා බොහෝ පීඩාවට පත් වේ. මේ නිසා අඳුරත් අවිද්‍යාවත් එකිනෙකට සමාන කර උපමා කර ඇත.

4. ත්‍රිශික්ෂා නම් කරන්න.

සීල, සමාධි, පඤ්ඤා

5. සංසරත්නය කෙතකට සමාන වන්නේ කෙසේ ද?

මිනිසාගේ ජීවිතය රඳා පවත්වාගැනීමේ දී ආහාරය ප්‍රධාන වෙයි. තමා වපුරන බීජ අනුව සරු අස්වැන්නක් හෝ නිසරු අස්වැන්නක් ලැබෙයි. මිනිසාගේ ලෞකික ජීවිතය සරු කර ගැනීමට උපකාර වන්නේ යම් සේ ද භික්ෂූන් වහන්සේ ආධ්‍යාත්මික ගුණ වර්ධනය කිරීම කෙරෙහිත් ලෞකික ජීවිතය සාර්ථක කර ගැනීම කෙරෙහිත්

WWW.PIRIVENA.LK

අපට උපකාර කරති. උන්වහන්සේලාගේ ගුණ ගත් කල්හි සුපටිපන්න, උජුපටිපන්න ආදි ගුණයන්ගෙන් පිරිපුන් වේ.

එසේ හෙයින් දා සීලාදි ගුණාංගයෙන් යුතු නිසා උන්වහන්සේ කෙතකට උපමා කර ඇත. කෙත මගින් අපට දෙන්නේ අස්වැන්නයි. භික්ෂූන් වහන්සේලා ද අපට දෙන්නේ අස්වැන්නයි. ඒ සීල සමාධි පඤ්ඤා ආදි වශයෙන් අප වෙත දෙන අස්වැන්නයි. එය අපගේ ආධ්‍යාත්මික ජීවිතය සරු කර ගැනීමට ආදර්ශයක් වෙයි.

අභ්‍යාසය

01. සිංහලට නගන්න.

i. අකාරාදයො නිග්ගහීතන්තා එකචත්තාළීසක්ඛරා භවන්ති.

අයන්නේ පටන් බින්දුව තෙක් අකුරු හතළිස් එකක් වෙයි (වෙති)

ii. එකො මනුස්සො අක්ඛරානි දිස්වා ‘කිං හො ඉද’න්ති අක්ඛරඤ්ඤුං මනුස්සං පක්කොසාපෙත්වා දස්සෙසි.

එක් මිනිසෙක් අකුරු දැක ‘මේ කුමක්ද’ යැයි අකුරු දන්නා මිනිසෙකු කැඳවා පෙන්වීය.

iii. යො නිරුත්තිං න ජානාති - ජානාති පිටකත්තයං

පදෙ පදෙ වික්ඛෙබය්‍ය - වනෙ අන්ධගජො විය

යමෙක් ව්‍යාකරණ දැනීමෙන් තොරව ත්‍රිපිටක ධර්මය දනී ද ඔහු වනයෙහි හැසිරෙන අන්ධ වූ ඇතෙකු මෙනි. නොයෙක් තැන්වල හැපෙන්නාක් මෙන් (අන්ධ බැවින්) පදයක් පදයක් පාසා සැක කරන්නෙක් වෙයි.

iv. අක්ඛරචින්තකා සුග්ගහිතසුත්තා නං අත්ථඤ්ච පාළිඤ්ච පටිබුජ්ඣන්ති.

ව්‍යාකරණඥයෝ මනාකොට ගන්නා ලද සූත්‍රවල අර්ථය ද පාළිය (පෙළ) ද අවබෝධ කර ගනිති.

v. ඉදානි පන මුද්දිතපොත්ථකානං සුලභත්තාය තාලපණ්ණෙසු ලිඛන්තා දුල්ලභා හොන්ති.

දැන් වනාහි මුද්‍රිත පොත් බහුල බැවින් තල්පත්වල ලියන්නෝ දුර්ලභ වෙති.

WWW.PIRIVENA.LK

02. පාලියට නගන්න.

i. සාමණේර තෙමේ පෑන ගෙන පොතෙහි අකුරු ලියා ගුරුවරයාට පෙන්වීය.

සාමණෙරො අක්ඛරචඤ්චුං ගහෙත්වා පොත්ථකෙ අක්ඛරානි ලිඛිත්වා ආචරියං/ ආචරියස්ස දස්සෙසි.

ii. පාලි භාෂාවේ ව්‍යඤ්ජනාක්ෂරයෝ තිස් තුනක් වෙති.

පාලි භාසායං බ්‍යඤ්ජනා තෙත්තිංසති/තෙත්තිංසානි භවන්ති.

iii. ඇතැමෙක් බින්දුවට නිග්ගහීත යැයි කියත්.

අඤ්ඤතරො බින්දුං නිග්ගහීතං ඉති වදන්ති.

iv. පුස්කොළ පොත්වල අකුරු රටා තුනක් දක්නට ලැබේ.

තාලපණ්ණෙසු පොත්ථකෙසු අක්ඛරානි තීනි ලක්ඛණානි (තීණි රූපානි) විජ්ජන්තෙ.

v. මුගලන් ඇදුරෝ අකුරුවලට වර්ණ යැයි ව්‍යවහාර කරත්.

මොග්ගල්ලානාචරියා අක්ඛරානං 'වණ්ණ' ඉති වොහරන්ති.

03. අර්ථවත් ඒකාක්ෂර පද 20ක් ලියන්න.

යෙ, සො, ජෙ, චෙ, ක, ඡ, තෙ, වෙ, හි, යා, නො, න, ච, බො, මා, රෙ, භො, හෙ, යා, තු,

04. හිස්තැන් පුරවන්න.

අක්ෂර	උපදින ස්ථානය	බාලාවතාර සූත්‍ර පාඨය
ව	දත් සහ තොල්	වො දන්තොට්ඨජො
ඉ, ඡ	තල්ල	ඉචවග්ගයා තාලුජා
ග, හ	උගුර	අකවග්ගහා කණ්ඨජා
උ, ඵ	තොල්	උපවග්ගා ඔට්ඨජා
ල, ස	දත්වලින්	තවග්ගලසා දන්තජා
ට, ළ	මුදුනින්	ටවග්ගරළා මුද්ධජා

WWW.PIRIVENA.LK

05. පහත දැක්වෙන පදවල අක්ෂර වින්‍යාසය නිවැරදි කොට ලියන්න.

i. අණනො - අනණො
ii. අටටාරස -අටඨාරස
iii. විශෙෂං - විසෙසං
iv. මා නිවත්ථ - මා නිවත්ත
v. අජ්ජබාසි - අජ්ඣහාසි
vi. නිබහත්තති - නිබබත්තති
vii. පුරිසධමමසාරථී - පුරිසදමමසාරථී
viii. චත්තාලීසති - චත්තාළීසති
ix. උචඡාරණ - උච්චාරණ
x. සමබතං - සමහතං

WWW.PIRIVENA.LK

දෙවැනි පාඩම

අභ්‍යාසය

01. 'එතු බො භන්තෙ භගවා ස්වාගතං භන්තෙ' යන ඡේදය සිංහලට නගන්න.

දුතියො පාඨො
එතු බො භන්තෙ භගවා ස්වාගතං භන්තෙ

එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන වච්ඡගොත්තො පරිබ්බාජකො එකපුණ්ඩරීකෙ පරිබ්බාජකාරාමෙ පටිවසති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය වෙසාලියං පිණ්ඩාය පාවිසි. අථ ඛො භගවතො එතදහොසි. අතිප්පගො ඛො තාව වෙසාලියං පිණ්ඩාය චරිතුං. යන්නූනාහං යෙන එකපුණ්ඩරීකො පරිබ්බාජකාරාමො, යෙන වච්ඡගොත්තො පරිබ්බාජකො තෙනුපසඞ්කමෙය්‍යන්ති. අථ ඛො භගවා යෙන එකපුණ්ඩරීකො පරිබ්බාජකාරාමො යෙන වච්ඡගොත්තො පරිබ්බාජකො තෙනුපසඞ්කමි. අද්දසා ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන භගවන්තං එතදවොච. එතු ඛො භන්තෙ, භගවා. ස්වාගතං භන්තෙ, භගවතො, චිරස්සං ඛො භන්තෙ භගවා ඉමං පරියායමකාසි යදිදං ඉධාගමනාය. නිසීදතු, භන්තෙ, භගවා ඉදමාසනං පඤ්ඤත්තන්ති. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. වච්ඡගොත්තොපි ඛො පරිබ්බාජකො අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි.

(තෙවිජ්ජවච්ඡගොත්ත සුත්ත - මජ්ඣිමනිකාය)

එතු බො භන්තෙ භගවා ස්වාගතං භන්තෙ

එක් සමයක භාග්‍යවතුන් වහන්සේ විශාලා මහනුවර සමීපයෙහි වූ මහා වනයෙහි කූටාගාර ශාලාවෙහි වැඩ වසන සේක. ඒ සමයෙහි වච්ඡගොත්ත පරිබ්‍රාජක තෙමේ ඒකපුණ්ඩරික (එක් ඇටඹ ගසක් ඇතියෙන්) නම් පරිබ්‍රාජක ආරාමයෙහි වාසය කරයි. එකල්හි බුදුරජාණන් වහන්සේ පෙරබත් වේලාවෙහි (පෙරබත්හි) හැඳ පොරවා පාසිවුරු ගෙන විශාලා මහනුවරට පිං ඬුසිඟා වැඩි සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේට මේ සිත විය. (මෙසේ සිතූ සේක). විශාලා මහනුවර පිඬු සිඟා යන්නට තව උදෑසන වෙයි. මම 'ඒකපුණ්ඩරික'

WWW.PIRIVENA.LK

නම් පරිබ්‍රාජකාරාමයෙහි වච්ඡගොත්ත පරිබ්‍රාජක යම් තැනක ද එහි එළඹීම නම් මැනවැ'යි යනුවෙනි. එකල්හි බුදුරජාණන් වහන්සේ ඒකපුණ්ඩරික නම් පරිබ්‍රාජකාරාමයෙහි වච්ඡගොත්ත පරිබ්‍රාජකයා යම් තැනෙක්හි ද එහි වැඩි සේක (එළඹුණු සේක).

වච්ඡගොත්ත පරිබ්‍රාජක දුරින් ම වඩිනා භාග්‍යවතුන් වහන්සේ දැක භාග්‍යවතුන් වහන්සේට මෙම වදන් කීවේ ය. 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ පැමිණෙන සේක්වා, වහන්ස, භාග්‍යවතුන් වහන්සේට ස්වාගත ය, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මෙහි පැමිණීමෙන් බොහෝ කලෙකින් මේ පරියාය (කරුණ) කළ සේක. වහන්ස, බුදුහු වැඩහිඳිනා සේක්වා. මේ අස්න පනවන ලදැ'යි. බුදුරජාණන් වහන්සේ පැන වූ ආසනයෙහි වැඩහුන් සේක. වච්ඡගොත්ත පරිබ්‍රාජක තැන ද එක්තරා මිටි අසුනක් ගෙන එකත්පසෙක හුන්නේ ය.

02. පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. තදා භගවා කුහිං විහරි?

තදා භගවා වෙසාලියං මහාවනෙ කූටාගාරසාලායං විහරති.

ii. වච්ඡගොත්තො පරිබ්බාජකො කත්ථ පටිවසති ?

වච්ඡගොත්තො පරිබ්බාජකො එකපුණ්ඩරීකෙ පරිබ්බාජකාරාමෙ පටිවසති.

iii. අතිප්පගො බො තාව වෙසාලියං පිණ්ඩාය චරිතුන්ති කො චින්තෙසි ?

අතිප්පගො බො තාව වෙසාලියං පිණ්ඩාය චරිතුන්ති' භගවා චින්තෙසි.

iv. කො දූරතොව ආගච්ඡන්තං භගවන්තං අද්දස ?

වච්ඡගොත්තො පරිබ්බාජකො දූරතොව ආගච්ඡන්තං භගවන්තං අද්දස.

v. වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං දිස්වා කිං කථෙසි ?

WWW.PIRIVENA.LK

වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං දිස්වා එතු ඛො භන්තෙ භගවා ස්වාගතං භන්තෙ'ති කථෙසි.

03. පහත සඳහන් ප්‍රශ්නවලට සිංහලෙන් පිළිතුරු සපයන්න.

i. වච්ඡගොත්ත පරිබ්‍රාජක තෙමේ කුමන නගරයක වාසය කළේ ද?

විශාලා මහනුවර

ii. බුදුරදුන් වඩින බව දුටු වච්ඡගොත්ත පරිබ්‍රාජක තෙමේ උන්වහන්සේ පිළිගත්තේ කෙසේ ද?

වඩිනු මැනවි ස්වාමීනි, යහපත් පැමිණීමක් වේවා යනුවෙන් සමාදරයෙන් පිළිගත්තේ ය.

iii. 'නීචං ආසනං' යනුවෙන් හැඳින්වූයේ කුමක් ද?

මිටි අසුන / පහත් ආසනය

iv. බුදුහිමියන්ගේ දිනචරියාවේ කවර අංගයක් මෙම ඡේදයෙන් විස්තර වේ ද?

පෙරවරු කාලයේ පිණ්ඩපාත චාරිකාවේ හැසිරීම (පෙරබත් කිස)

v. මෙම ඡේදයෙන් බුදුහිමියන්ගේ කිනම් ගුණයක් ප්‍රකාශ වේ ද?

අන්‍යාගමිකයන් කෙරෙහි වූ සුහදශීලී බව

අභ්‍යාසය

පහත වගුව සම්පූර්ණ කරන්න.

නාමය	චතුත්ථී විභත්ති එකවචන		පංචමී විභත්ති එකවචන		ඡට්ඨී විභත්ති ඒකවචන	
	පාලි පදය	*සිංහල අර්ථය*	*පාලි පදය*	*සිංහල අර්ථය*	*පාලි පදය*	*සිංහල අර්ථය*

WWW.PIRIVENA.LK

ජමබු	අගගි	රැකඛ	වනිතා	කවි	වානර
ජමබුනො	අගගිනො	රැකඛාය, රැකඛස්ස	වනිතාය	කවිනො, කවිස්ස	වානරාය, වානරස්ස
දඹ ගසට	ගින්නට	ගසට	වනිතාවට	පණ්ඩිතයාට	වඳුරාට
ජමබුස්මා	අගගිනා, අගගිම්හා, අගගිස්මා	රැකඛා, රැකඛම්හා, රැකඛස්මා	වනිතාය	කවිම්හා, කවිස්මා	වානරා, වානරම්හා, වානරස්මා
දඹ ගසෙහි	ගින්නෙන්	ගසෙන්	වනිතාවගෙන්	පණ්ඩිතයාගෙන්	වඳුරාගෙන්
ජමබුස්ස	අගගිස්ස	රැකඛස්ස	වනිතාය	කවිනො, කවිස්ස	වානරස්ස
ගඹගසේ	ගින්නේ	ගසේ	වනිතාවගේ	පණ්ඩිතයාගේ	වඳුරාගේ

WWW.PIRIVENA.LK

ඉම	එළ	ගො
ඉමස්ස	එළාය, එළස්ස	ගාවස්ස, ගවස්ස
මොහුට	ගෙඩියට	ගොනාට
ඉමම්හා, ඉමස්මා	එළස්මා, එළම්හා	ගාවස්මා, ගවස්මා, ගාවම්හා, ගවම්හා
මොහුගෙන්	ගෙඩියෙන්	ගොනාගෙන්
ඉමස්ස	එළස්ස	ගාවස්ස, ගවස්ස
මොහුගේ	ගෙඩියේ	ගොනාගේ

2. පහත දැක්වෙන පාලි වාක්‍යයන්හි හිස්තැන්වලට සුදුසු සංඛ්‍යා ශබ්දයන් වරහන් තුළින් තෝරා යොදන්න.

(දසහි, අසීති, දවත්තිංස, සහස්සං, තිසෙසා)

i. භගවතො දවත්තිංස මහාපුරිසලක්ඛණා හොන්ති.

ii. තස්ස කායෙ අසීති අනුබ්‍යඤ්ජනානි දිස්සන්ති.

iii. තිසෙසා ඉමා භික්ඛවෙ ධාතුයො.

iv. සො සහස්සං මානුසෙ සංගාමෙ ජිනාති.

v. දසහි අඞ්ගෙහි සමන්නාගතො අරහාති වුච්චති.

3. සිංහලට නගන්න.

i. එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං.

එක් සමයක භාග්‍යවතුන් වහන්සේ විශාලා මහනුවර මහාවනයෙහි කූඨාගාර ශාලාවෙහි වාසය කරයි.

WWW.PIRIVENA.LK

ii. තීණිමානි භික්ඛවෙ අකුසලමූලානි.

මහණෙනි, මේ අකුසල මුල් තුනයි.

iii. යත්ථ සීලවන්තා භික්ඛවො වසන්ති තත්ථ මනුස්සා සප්පුරිසා හොන්ති.

යම්තැනෙක ශීලවන්ත භික්ෂූහු වාසය කරත් ද එහි මිනිස්සු සත්පුරුෂයෝ වෙති.

iv. භගවා පඨම වස්සං බාරාණසියං ඉසිපතනාරාමෙ විහරි.

භාග්‍යවතුන් වහන්සේ පළමු වස්කාලය බරණැස ඉසිපතනාරාමයේ වාසය කළහ. (විසූ සේක)

v. මාතා දස අම්බානි කිණිත්වා ධීතරානං දදිස්සති.

අම්මා/ මව අඹ ගෙඩි දහයක් මිලට ගෙන දූවරුන්ට දෙන්නී ය.

4. පාලියට නගන්න.

i. රජතුමා බුදුරජාණන් වහන්සේ දකියි.

රාජා/ භූපාලො බුද්ධං පස්සති.

ii. වෙළෙන්දො ගොවීන් සමග ගස් කපති.

වාණිජා කස්සකෙහි සද්ධිං රුක්ඛෙ ඡින්දන්ති.

iii. මසුන් මරන්නෝ කරත්තවලින් ගමට මාළු ගෙනෙත්.

කෙවට්ටා සකටෙහි ගාමං මච්ඡෙ ආනෙන්ති.

iv. මාගේ සහෝදරයා මිත්‍රයන් දෙදෙනෙකු සමග අනුරාධපුරයට ගියේ ය.

මම භාතා ද්වීහි මිත්තෙහි සද්ධිං අනුරාධපුරං ගච්ඡි.

v. මහණෙනි, පැවිද්දා විසින් සේවනය නොකළ යුතු අන්ත දෙකකි.

භික්ඛවෙ, ද්වෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා.

5. සුදුසු සර්ව නාම පද යොදා වාක්‍ය සම්පූර්ණ කර තේරුම ද ලියන්න.

(කො, යො, සො, සා, අහං, සබ්බං, තෙ)

WWW.PIRIVENA.LK

i. යො ගාවං න විජානාති සො ගොගණං න රක්ඛති.
ii. සා කිර එකදිවසං චින්තෙසි. අහං අපි පබ්බජිස්සාමි.
iii. කො අන්ධවනං අජ්ඣොගහෙසුං ?
iv. වාණිජො සබ්බං ධනං යාචකානං දත්වා අඤ්ඤං රට්ඨං අගමි.
v. තෙ නදියා වාපියා ච අන්තරා ධෙනුං හරන්ති ?

❖ සිංහලට නැගීම.

i. යමෙක් ගොනා නොදනී ද ඔහු ගොන් සමූහය නො රකියි.
ii. ඇය වනාහි එක දවසක සිතුවා ය. මමත් පැවිදි වන්නෙමි.
iii. කවුරු අන්ධවනයට බැසගත්තෝ ද?
iv. වෙළෙන්දා සියලු ධනය යාචකයන්ට දී වෙනත් රටකට ගියේ ය.
v. ඔවුහු ගඟ ද වැව ද අතර ධේනුව ගෙනයත් ද?

WWW.PIRIVENA.LK

තෙවැනි පාඩම

අභ්‍යාසය

1. 'අක්කොසමෙව අලත්ථ' ජේදය සිංහලට නගන්න.

තතියො පාඨො | **අක්කොසමෙව අලත්ථ.**

අථ ඛො ආයස්මා රට්ඨපාලො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරං ආදාය යෙන ථුල්ලකොට්ඨිතං තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන ථුල්ලකොට්ඨිතං තදවසරි. තත්‍ර සුදං ආයස්මා රට්ඨපාලො ථුල්ලකොට්ඨිතෙ විහරති රඤ්ඤො කොරව්‍යස්ස මිගාචීරෙ. අථ ඛො ආයස්මා රට්ඨපාලො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය ථුල්ලකොට්ඨිතං පිණ්ඩාය පාවිසි. ථුල්ලකොට්ඨිතෙ සපදානං පිණ්ඩාය චරමානො යෙන සකපිතුනිවෙසනං තෙනුපසංකමි. තෙන ඛො පන සමයෙන ආයස්මතො රට්ඨපාලස්ස පිතා මජ්ඣිමාය ද්වාරසාලාය උල්ලිඛාපෙති. අද්දසා ඛො ආයස්මතො රට්ඨපාලස්ස පිතා ආයස්මන්තං රට්ඨපාලං දූරතොව ආගච්ඡන්තං, දිස්වාන එතදවොච. "ඉමෙහි මුණ්ඩකෙහි සමණකෙහි අම්හාකං එකපුත්තකො පියො මනාපො පබ්බජිතො"ති. අථ ඛො ආයස්මා රට්ඨපාලො සකපිතුනිවෙසනෙ නෙව දානං අලත්ථ, න පච්චක්ඛානං, අඤ්ඤදත්ථු අක්කොසමෙව අලත්ථ. තෙන ඛො පන සමයෙන ආයස්මතො රට්ඨපාලස්ස ඤාතිදාසී ආභිදොසිකං කුම්මාසං ඡඩ්ඩෙතුකාමා හොති. අථ ඛො ආයස්මා රට්ඨපාලො තං ඤාතිදාසිං එතදවොච. "සචෙ තං භගිනි, ඡඩ්ඩනීයධම්මං ඉධ මෙ පත්තෙ ආකිරා' ති.

(රට්ඨපාල සුත්ත - මජ්ඣිමනිකාය)

අක්කොසමෙව අලත්ථ

ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ හුනස්නෙන් නැගී බුදුන් වැඳ පැදකුණු කොට සෙනස්න සකසා තබා පා සිවුරු ගෙන ථුල්ලකොට්ඨිත නියම් ගම කරා චාරිකාවෙහි පිටත් ව ගියහ. අනුක්‍රමයෙන් සැරිසරන්නා වූ ථුල්ලකොට්ඨිත නියම් ගම යම් තැනක ද එතැනට එළඹියේ ය. එහි දී ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ ථුල්ලකොට්ඨිතයෙහි කෝරව්‍ය රජුගේ 'මිගාචීර' නම් උයනෙහි වැඩ වෙසෙති. ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ පෙරවරු වේලාවේ හැඳ පොරවා පාසිවුරු ගෙන ථුල්ලකොට්ඨිත නියම්ගමට

WWW.PIRIVENA.LK

පිඬු පිණිස පිවිසියහ. ථුල්ලකොට්ඨිතයෙහි ගෙපිළිවෙළින් පිඬු සිඟා වඩින්නාහු සිය පියාගේ නිවස කරා එළඹියහ. ඒ සමයෙහි ආයුෂ්මත් රට්ඨපාල තෙරුන්ගේ පියා මධ්‍යම ද්වාරශාලාවෙහි (සන්නාලියා ලවා) කෙස් පීරවයි. ආයුෂ්මත් රට්ඨපාල තෙරුන්ගේ පියතෙමේ ආයුෂ්මත් රට්ඨපාල තෙරුන් දුරින් ම එනු දැක මෙසේ කීවේ ය. 'මේ මුඩු මහණුන් විසින් අපගේ ප්‍රිය මනාප එක ම පුතු පැවිදි කරවන ලදැයි' යනුවෙනි. එකල්හි ආයුෂ්මත් රට්ඨපාල තෙරුන් සිය පියාගේ නිවාසයෙන් දානය නොලැබ, වෙනත් කිසිවක් නොලැබ ඒකාන්තයෙන් දොස් ම ලැබීය. ඒ සමයෙහි වනාහි ආයුෂ්මත් රට්ඨපාල තෙරුන්ගේ ඥාති දාසියක් රාත්‍රියක් පුරා නිවසේ තිබුණු කැවිලි බැහැර කරනු කැමති වෙයි. එකල්හි ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ ඒ ඥාති දාසියට මෙසේ කීවාහු ය. 'ඉඳින් නැගෙණියනි, ඒ බැහැර ලන දෙය මෙහි මාගේ පාත්‍රයට දමන්න' යනුවෙනි.

2. පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. ආයසමා රට්ඨපාලො කුහිං චාරිකං පක්කාමි ?
ආයසමා රට්ඨපාලො ථුල්ලකොට්ඨිතං චාරිකං පක්කාමි.

ii. රඤ්ඤො කොරව්‍යස්ස මිගාචීරෙ කො වසති ?
රඤ්ඤො කොරව්‍යස්ස මිගාචීරෙ ආයසමා රට්ඨපාලො වසති.

iii. ආයසමා රට්ඨපාලො කතරස්මිං කාලෙ පිණ්ඩාය චරි ?
ආයසමා රට්ඨපාලො පුබ්බණ්හ සමයෙ පිණ්ඩාය චරි.

iv. ථෙරස්ස පිතා කස්මා අක්කොසි ?
ථෙරස්ස පිතා ඉමෙහි මුණ්ඩකෙහි සමණෙහි එකපුත්තකො පබ්බජිතො'ති අක්කොසි.

v. සො ථෙරො තං ඤාතිදාසිං කිං කථෙසි ?
සො ථෙරො තං ඤාතිදාසිං 'සචෙ තං භගිනි ඡඩ්ඩනීය ධම්මං ඉධ මෙ පත්තෙ ආකිරා'ති කථෙසි.

3. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. රට්ඨපාල රහතන් වහන්සේගේ ගම කුමක් ද?

ථුල්ලකොට්ඨිතය

ii. කොරව්‍ය රජුගේ උයනේ නම කුමක් ද?

මිගාචීරය

iii. රට්ඨපාල හිමියන් දුටු පියතුමා පැවසූයේ කුමක් ද?

මේ මුඩු ශ්‍රමණයා මගේ එකම ප්‍රිය පුත්‍රයා පැවිදි කළේ ය.

iv. රට්ඨපාල රහතන් වහන්සේට තම ගෙදරින් නොලැබුණේ මොනවා ද?

පිණ්ඩපාතය නොලැබීම

v. 'ආභිදොසිකං කුම්මාසං' යන්න විස්තර කරන්න.

පිළුණු පිට්ටුවක්. පිළුණු වූ ආහාර අනුභවය මිනිසා කොහෙත්ම සිදු කරන්නේ නැත. ඕනෑම ආහාරයක් අනුභවයට ගත හැකි කාලයක් ඇත. එම කාලය ඉක්ම ගිය විට ආහාර නුසුදුසු යැයි කියනු ලැබේ. පිළුණු වූවා යැයි කීම සාමාන්‍ය ව්‍යවහාරයයි. එනම් ආහාරයට ගත නොහැකි තත්ත්වයට පත් වීමයි.

අභ්‍යාසය

1. සිංහලට නගන්න.

i. සෙනාපති යොධෙහි සද්ධිං නගරම්හා නික්ඛමති.

සෙන්පතියා යෝධයන් සමග නගරයෙන් නික්මෙයි.

ii. මුනි සද්ධෙහි ගහපතීහි සද්ධිං ගිරිමභිරූහති.

මුනිවරයා ශ්‍රද්ධාවන්ත ගෘහපතියන් සමග කන්ද නගියි.

iii. තෙන ඛො පන සමයෙන ආයස්මතො රට්ඨපාලස්ස පිතා මජ්ඣිමාය ද්වාරසාලාය උල්ලිඛාපෙති.

ඒ සමයෙහි වනාහි ආයුෂ්මත් රට්ටපාල තෙරුන්ගේ පියා නිවසෙහි මැද සාලයෙහි හිස පීරවයි.

iv. ආයස්මතො රට්ඨපාලස්ස ඤාතිදාසි ආභිදොසිකං කුම්මාසං ඡඩ්ඩෙතුකාමා හොති.

WWW.PIRIVENA.LK

ආයුෂ්මත් රට්ඨපාල තෙරුන්ගේ ඤාතිදාසිය පිළුණු පිට්ටුවක් බැහැර කරනු කැමැත්තී වෙයි.

v. අථ බො ආයස්මා රට්ඨපාලො තං ඤාතිදාසිං එතදවොච.

ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල තෙර වනාහි ඒ ඤාතිදාසියට මෙය කීවේ ය.

2. පාලියට නගන්න.

i. පින් කරන පුද්ගලයා නිතර නිතර පින් කරයි.

පුඤ්ඤවන්තො නිච්චං නිච්චං (පුනප්පුනං) පුඤ්ඤානි කරොති.

ii. මාලාකාරයා මල් රැස් කර මල් දම් ගොතා විකුණා ජීවත් වෙයි.

මාලාකාරො පුප්ඵානි ඔචිනිත්වා මාලා දාමානි ගන්ථෙත්වා වික්කිණිත්වා ජීවති.

iii. මගේ මව උදෙන් ම දානය පිළියෙළ කර විහාරයට ගොස් භික්ෂු සංඝයාට පූජා කළා ය.

මම මාතා පාතොව දානං පටියාදෙත්වා විහාරං ගන්ත්වා භික්ඛු සංඝස්ස පූජෙසි.

iv. ඔහු ධර්මයේ හැසිරෙන්නේ ය. දුශ්චරිතයෙහි නො හැසිරෙන්නේ ය.

සො ධම්මෙ චරිස්සති, දුච්චරිතෙ න චරිස්සති.

v. බෝධිසත්ත්වයන් වහන්සේ ඇසතු රුකමුල වැඩ හිඳ වෙසක් පුන් පොහෝ දින අභිසම්බෝධියට පත්වූහ.

බොධිසත්තා අස්සත්ථ බොධිමූලෙ නිසීදිත්වා වෙසාඛ පුණ්ණමි දිනෙ අභිසම්බොධිං පාපුණිංසු.

3. කෙටි පිළිතුරු සපයන්න.

i. කාරක යනු මොනවාද ?

ක්‍රියා නිෂ්පත්තියට නිමිති වීමෙන් ක්‍රියා නිපදවනුයේ කාරක නම් වෙයි. කරොති කිරියං නිපඵාදෙතී'ති කාරකං යනු සූත්‍ර වෘත්තියයි.

WWW.PIRIVENA.LK

ii. කාරක වර්ග 06 ලියන්න.

- දුතියා - කර්මාර්ථය
- තතියා - කර්තෘ අර්ථය
- කරණ - කරණාර්ථය
- චතුත්ථී - සම්ප්‍රදානාර්ථය
- පඤ්චමී - අපාදානාර්ථය
- සත්තමී - ආධාරාර්ථය

iii. උපපද විභක්ති යනු මොනවාද ?

කිසියම් පදයක් උපසර්ග ධාතු ආදි වූ අන්‍ය පදයක් නිසා ගත යුතු විභක්තිය නොගෙන වෙනත් විභක්තියක් ගනී නම් ඒ උපපද විභක්තිය යි.

iv. 'අච්චන්ත සංයොගය' යන්න විස්තර කරන්න.

කාල, මාර්ග ආදි ප්‍රමාණවාචක පද ද්‍රව්‍ය, ගුණ, ක්‍රියාවාචී පද සමග ඇතිවන සමීප සම්බන්ධය මේ නමින් හැඳින්වේ. මෙය දුතියා විභක්ති ගනී.

- භික්ඛූ තෙමාසං පරිත්තං භණන්ති.
- යොජනං වනරාජී භවති.

v. 'සම්පදානෙ චතුත්ථී' ප්‍රයෝගය සඳහා උදාහරණ 2ක් දෙන්න.

යාචකො බාලකස්ස පොත්ථකං දදාති.

භික්ඛං සංඝස්ස දෙම.

4. පහත සඳහන් වාක්‍යයන්හි කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති ප්‍රයෝගය ලියා සිංහලට නගන්න.

i. තෙන ඛො පන සමයෙන ආයස්මා සංගාමජි අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසින්නො හොති. (කාලාර්ථයේ තතියා)

WWW.PIRIVENA.LK

ii. භගවා තායං වෙලායං ඉමං උදානං උදානෙසි. (කාලාර්ථයේ සත්තමී)

iii. පඤ්චහි භික්ඛුසතෙහි සහ ගොතමී නිබ්බානං යාති. (සහාදි යොගය)

iv. පුත්ත, හාසකාලෙ උපට්ඨිතෙ සොචිතුං න යුත්තං. (කාල සත්තමී)

v. අහං තාසං සබ්බසං ජෙට්ඨා අහොසිං. (නිද්ධාරණාර්ථයේ ඡට්ඨී)

vi. අඤ්ඤතරො සො පනායසමා නන්දො අරහතං අහොසි. (දුතියා විභක්ති)

5. A හි දී ඇති විභක්ත්‍යාර්ථයට උචිත යෙදුම් B කොටසින් තෝරාගෙන ලියා දක්වන්න.

	A කොටස		B කොටස
1	ක්‍රියා පවර්ගාර්ථයේ තතියා - 2	1	උපාසකා අල්ලවත්ථෙහි අල්ලකෙසෙහි භගවන්තං උපසංකමිංසු
2	නිර්ධාරණාර්ථයේ සත්තමී - 6	2	ථෙරා නවහි මාසෙහි සංගීතිං අකංසු
3	අත්‍යන්ත සංයෝගාර්ථයේ දුතියා - 5	3	උපසන්තො සුඛං සෙති.
4	සහාදි යෝගයෙහි තතියා - 4	4	ආචරියො සහ සිස්සෙහි ගච්ඡති.
5	ක්‍රියා විශේෂණාර්ථයේ දුතියා - 3	5	භගවා සත්තාහං එකපල්ලංකෙන නිසීදි
6	නිර්ධාරණාර්ථයේ ඡට්ඨී - 7	6	පඤ්චවග්ගියෙසු භික්ඛූසු කොණ්ඩඤ්ඤො පඨමො අරහා අහොසි.
7	ඉත්ථම්භූතාර්ථයේ තතියා - 1	7	උපාසකො තෙසං අඤ්ඤතරො අහොසි.

WWW.PIRIVENA.LK

8	ද්විකර්මක ධාතුයෝගයෙහි දුතියා - 8	8	පරාභවන්තං පුරිසං මයං පුච්ඡාම ගොතමං
9	නමො යෝගයෙහි චතුත්ථී 10	9	යාචකො කසිරෙන සසච්ඡාදං ලභති.
10	ක්‍රියා විශේෂණාර්ථයෙහි තතියා - 9	10	නමො තෙ බුද්ධවීරත්ථු

WWW.PIRIVENA.LK

සිව්වැනි පාඩම

අභ්‍යාසය

01. උපාසකං මං භවං ගොතමො ධාරෙතු' ඡේදය සිංහලට නගන්න.

චතුතෙථා පාඨො | **උපාසකං මං භවං ගොතමො ධාරෙතු**

එවං වුතෙත කූටදනෙතා බ්‍රාහමණො භගවනතං එතදවොච. අභිකකනතං භො ගොතම, අභිකකනතං භො ගොතම. සෙයයථාපි භො ගොතම නිකකුජ්ජිතං වා උකකුජෙජයය, පටිචඡනනං වා විවරෙයය, මූළහසස වා මගගං ආචිකෙඛයය, අනධකාරෙ වා තෙලපජෙජාතං ධාරෙයය, චකඛුමනෙතා රූපානි දකඛිනතීති. එවමෙව භොතා ගොතමෙන අනෙකපරියායෙන ධමෙමා පකාසිතො, එසාහං භවනතං ගොතමං සරණං ගචඡාමි ධමමඤච භිකඛුසඞඝඤච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතගෙග පාණුපෙතං සරණං ගතං. එසාහං භො ගොතම සතත ච උසභසතානි, සතත ච වචඡතරසතානි, සතත ච වචඡතරීසතානි, සතත ච අජසතානි සතත ච උරබභසතානි මුඤචාමි, ජීවිතං දෙමි. හරිතානි චෙව තිණානි ඛාදනතු, සීතානි ච පානීයානි පිවනතු, සීතො ච නෙසං වාතො උපවායතූති. අථ ඛො භගවා කූටදනතසස බ්‍රාහමණසස ආනුපබබීකථං කථෙසි. සෙයයථීදං? දානකථං සීලකථං සගගකථං කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං නෙකඛමෙම ච ආනිසංසං පකාසෙසි. යදා භගවා අඤඤාසි කූටදනතං බ්‍රාහමණං කලලචිතතං මුදුචිතතං විනීවරණචිතතං උදගගචිතතං පසනනචිතතං. අථ යා බුදධානං සාමුකකංසිකා ධමමදෙසනා, තං පකාසෙසි. දුකඛං සමුදයං නිරොධං මගගං. සෙයයථාපි නාම සුදධං වතථං අපගතකාළකං සමමදෙව රජනං පටිගගණෙහයය, එවමෙව කූටදනතසස බ්‍රාහමණසස තසමිං යෙව ආසනෙ විරජං වීතමලං ධමමචකඛුං උදපාදි. යං කිඤචි සමුදයධමමං සබබං තං නිරොධධමමනති.

(කූටදනතසුතත - දීඝනිකාය)

උපාසකං මං භවං ගොතමො ධාරෙතු

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ කල්හි කූඨදන්ත බමුණු තෙමේ 'වහන්ස, දේශනාව කදිම ය. වහන්ස, දේශනාව කදිම ය. වහන්ස, යටිකුරු කොට තිබුණු භාජනයක් උඩුකුරු කරන්නේ හෝ වේ ද, වැසුණු යමක් වැසුම් හැර දක්වන්නේ හෝ වේ ද, මං මුළාවූවෙකුට මඟ කියන්නේ හෝ වේ ද, ඇස් ඇතියන් රූප දකිතියි අඳුරෙහි තෙල් පහනක් දල්වන්නේ හෝ වේ ද, වහන්ස එසේ ම භාග්‍යවතුන් වහන්සේ විසින් මට නොයෙක් අයුරින් දහම් පැවසිණි, වහන්ස, ඒ මම භාග්‍යවත් ගෞතමයන් වහන්සේගේ දහම ද භික්ෂු සංඝයා ද

WWW.PIRIVENA.LK

සරණ යමි. වහන්ස, අද පටන් දිවි හිමියෙන් සරණ ගිය උපාසකයෙකු කොට භවත් ගෞතමයන් වහන්සේ මා දැන වදාරණ සේක් වා. භවත් ගෞතමයන් වහන්ස, ඒ මම හත්සියයක් ගොනුන් ද හත්සියයක් නාඹු වස්සන් ද හත්සියයක් නාඹු වැස්සියන් ද හත්සියයක් එළුවන් ද හත්සියයක් තරුණ බැටළුවන් ද මුදාලමි. ඔවුන්ට අභය දෙමි. නිල් තණ බුදිත්වයි ද, සිසිල් පැන් බොත්වයි ද ඔවුන්ට සිසිල් පවන ද හමත්වයි කියායි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කූටදන්ත බමුණා හට දානකථා, ශීලකථා, ස්වර්ගකථා, කාමයන්ගේ ආදීනව, කාමයන්ගේ ලාමක බව, කාමයන්ගේ කෙලෙසීම, අත්හැරීමේ ආනිශංස පැවසූ සේක. භාග්‍යවතුන් වහන්සේ යම්විටෙක කූටදන්ත බමුණා (දහම් ඇසීමෙන්) නිරෝගි සිත් වූවාහු, මොලොක් සිත් වූවාහු නීවරණයන්ගෙන් පහ වූ සිතැත්තහු ඔද වැඩීගිය පහන් සිතැත්තහු බව දත් සේක. එකල්හි දුක්ඛ සමුදය, දුක්ඛ නිරෝධ මාර්ග යන බුදුවරුන්ගේ යම් සාමොක්කංසික ධර්ම දේශනාවක් වේ නම් එය පැවසූ සේක. යම් සේ පිරිසිදු වූ පහ වූ කළු බව ඇති වස්ත්‍රයක් මොනවට වර්ණ ගන්නේ ද, එසේ ම කූටදන්ත බමුණා හට ඒ අසුනේ දී ම යමෙක් උපදනා සුලු නම් ඒ සියල්ල නැසෙන සුලු වෙයි යන රජස් රහිත කෙලෙස් මල රහිත දහම් ඇස පහළ විය.

02. පාලියෙන් පිළිතුරු සපයන්න.

i. කො භගවන්තං පාණුපෙතං සරණං ගතො හොති ?

කූටදන්තො බ්‍රාහ්මණො භගවන්තං පාණුපෙතං සරණං ගතො හොති.

ii. අන්ධකාරෙ කිමත්ථාය තෙලපජ්ජොතං ධාරෙති ?

අන්ධකාරෙ චක්ඛුමන්තො රූපානි දක්ඛන්තීති තෙලපජ්ජොතං ධාරෙති.

iii. පුරිසො කෙ සන්තෙ බන්ධනා මුඤ්චි ?

WWW.PIRIVENA.LK

පුරිසො සත්ත ච උසභ සතානි ච සත්ත ච වච්ඡතරසතානි සත්ත ච වච්ඡිසතානි සත්ත ච අජසතානි සත්ත ච උරබ්භ සතානි සත්ත බන්ධනා මුක්ඛවි.

iv. කො නාමෙසො සාමුක්කංසිකා ධම්මදෙසනා ?

දුක්ඛං, සමුදයං, නිරොධං, මග්ගන්ති නාමෙසො සාමුක්කංසිකා ධම්මදෙසනා.

v. කස්ස බ්‍රාහ්මණස්ස තස්මිං යෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි ?

කූටදන්තස්ස (කූටදන්ත) බ්‍රාහ්මණස්ස තස්මිං යෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි.

03. ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.

i. බුදුරදුන්ගේ ධර්මදේශනාවෙන් පැහැදුණු පුද්ගලයා බුදුන්ට ප්‍රශංසා කළ අයුරු ලියන්න.

පින්වත් ගෞතමයන් වහන්ස යටිකුරු දෙයක් උඩුකුරු කරන්නේ යම් සේද වැසුණු දෙයක් විවර කරන්නේ යම් සේ ද මුලා වූ කෙනෙකුට මඟ කියා දෙන්නේ යම් සේ ද ඇස ඇත්තෝ රූප දකිත්වායි තෙල් පහනක් දරන්නේ යම් සේ ද ඔබ වහන්සේ නොයෙක් අයුරින් ධර්මය දේශනා කළ සේක. ඒ මම බුදුරජාණන් වහන්සේ ද උතුම් ධර්ම රත්නය ද සංඝ රත්නය ද සරණ යමි. අද පටන් මා දිවි හිමි කොට සරණ ගියා වූ උපාසකයෙකු කොට දරාගන්නා සේක් වා.

ii. යාගය සඳහා යාගස්ථම්භය වෙත පැමිණ වූ සත්තු කවරහු ද?

ගොනුන්, වස්සන්, වැස්සියන්, එළුවන්, බැටළුවන්,

iii. අනුපිළිවෙළ කතාව ලියන්න.

දාන කථා, ශීල කථා, ස්වර්ග කථා, කාමයන්ගේ ආදීනව, ලාමක බව, කෙළෙස් සහිත බව, ගිහිගෙයින් නික්මී බ්‍රහ්මචාරී වීමේ ආනිසංස යනාදි ලෙස

iv. චතුරාර්ය සත්‍යය නම් කරන්න.

දුක්ඛාර්ය සත්‍යය, දුක්ඛ සමාදයාර්ය සත්‍යය, දුක්ඛ නිරොධාර්ය සත්‍යය, දුක්ඛ නිරොධගාමිණී පටිපදාර්ය සත්‍යය

v. මෙහි එන උපමා දෙකක් උපුටා ලියන්න.

WWW.PIRIVENA.LK

යටිකුරු දෙයක් උඩුකුරු කරන්නේ යම් සේ ද
වැසුණු දෙයක් විවර කරන්නේ යම් සේ ද

04. ඡේදයේ වාක්‍ය රටාව අනුව පාලියට නගන්න.

i. අපගේ ගුරුවරයා විසින් නොයෙක් ආකාරයෙන් කරුණු ප්‍රකාශ කරන ලදි.

අම්හාකං ආචරියෙන අනෙක පරියායෙන කාරණානි පකාසිතො.

ii. අද පටන් දිවි ඇති තාක් මම සතුන් නොමරමි.

අජ්ජතගෙග පාණුපෙතං අහං සත්‍තෙ න මාරෙමි.

iii. වසා තිබූවක් විවෘත කරන්නාක් මෙන් ගුරුවරයා අපගේ මනස ප්‍රබෝධ කරවීය.

පටිච්ඡන්නං වා විවරෙය්‍ය ආචරියො අම්හාකං මනසං පබොධෙසි.

iv. ඔහුට එවෙලේ ම සියලු සංස්කාර අනිත්‍ය යන දහම් ඇස පහළ විය.

තස්ස තස්මිං කාලෙව සබ්බෙ සංඛාරා අනිච්චාති ධම්ම චක්ඛුං උදපාදි.

අභ්‍යාසය

01. පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

i. සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය.

බලවත් මිනිසෙක් හැකිලූ අත දිගහරින්නේ නම් හෝ දිග හැරි අත හකුළුවන්නේ යම් සේ ද.

ii. සබ්බීතියො විවජ්ජන්තු සබ්බරොගො විනස්සතු.

සියලු උපද්‍රවයෝ දුරුවෙත්වා, සියලු රෝග විනාශ වේවා.

iii. වන්දෙ තෙ පිතරං භද්දෙ. තිම්බරුං සුරියවච්චසෙ.

සොඳුර සුරියවච්චසාවෙනි, තිම්බරු නම් වූ නුඹේ පියාට වඳිමි.

WWW.PIRIVENA.LK

iv. ලභෙය්‍යාහං භන්තෙ භගවතො සන්තිකෙ පබ්බජ්ජං.
ස්වාමීනි භාග්‍යවතුන් සමීපයේ පැවිද්ද ලබන්නේ නම් මැනවි.

v. අහං අවෙරො හොමි, අබ්‍යාපජ්ජො හොමි.
මම වෛර නැත්තෙක් වෙමි, තරහ නැත්තෙක් වෙමි.

02. පහත සඳහන් අංකිත ක්‍රියාපදයන්හි ක්‍රියා විභක්ති, වචන හා පුරුෂය ලියා දක්වන්න.

i. වන්දෙ තං බොධිපාදපං. - පඤ්චමී, පඨම, ඒක

ii. පටිජග්ගෙය්‍ය පණ්ඩිතො. සත්තමී, පඨම, ඒක

iii. භජෙථ මිත්තෙ කල්‍යාණෙ. පඤ්චමී, මජ්ඣිම, බහු

iv. අථ පජාපතිස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ. සත්තමී, මජ්ඣිම, බහු

v. සත්තධා මෙ ඵලෙ මුද්ධා ජීවන්තො න සුඛං ලභෙ. පඤ්චමී, උත්තම, ඒක

vi. රාහු චන්දං පමුඤ්චස්සු. පඤ්චමී, මජ්ඣිම, ඒක

vii. තෙ මෙ නමො තෙ ච මං පාලයන්තු. පඤ්චමී, පඨම, බහු

viii. න හි සො භික්ඛවෙ අභිනා දට්ඨො කාලං කරෙය්‍ය. සත්තමී, පඨම, ඒක

ix. සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා. පඤ්චමී, පඨම, බහු

x. අමනුස්සා රිත්තම්හි පත්තං සීසෙ නික්කුජ්ජෙය්‍යුං. සත්තමී, පඨම, බහු

03. සත්තමී ක්‍රියා උපයෝගී කරගෙන පාලියට නගන්න.

i. ඉදින් ඔහු පැවිදි වන්නේ නම් රහත් බව ලබන්නේ ය.
සචෙ සො පබ්බාජෙය්‍ය අරහත්තං ලභෙය්‍ය

ii. මම ගමට යන්නෙමි නම් මව්පියන් දකින්නෙමි.
අහං ගාමං ගච්ඡෙය්‍යාමි මාතාපිතරෙ පස්සිස්සාමි.

iii. කිමෙක් ද ඔබ ධර්මය උගත්තෙහි ද? නැතහොත් විනය ඉගෙන ගත්තෙහි ද?

WWW.PIRIVENA.LK

කිං ත්වං ධම්මං උග්ගණ්හෙය්‍යාසි උදාහු විනයං උග්ගණ්හෙය්‍යාසි.

iv. ඉදින් ඔබ බුදුන් සිහි කරන්නේ නම් භයක් නොවන්නේ ය.
සචෙ ත්වං බුද්ධං අනුස්සරෙය්‍යාසි භයං න භවිස්සති.

v. පවිටු මිතුරන් ඇසුරු නොකරන්නේ නම් මැනවි.
පාපකෙ මිත්තෙ න භජෙය්‍ය. (න භජෙ පාපකෙ මිත්තෙ)

04. පහත වගුව සම්පූර්ණ කරන්න.

ක්‍රියා පදය	පරස්ස පද පඤ්චමී	පරස්ස පද සත්තමී	අත්තනො පද වත්තමානා	අත්තනො පද සත්තමී
	පඨම පුරිස එකවචන	පඨම පුරිස එකවචන	පඨමපුරිස එකවචන	පඨමපුරිස එකවචන
ලභති	ලභතු	ලභෙය්‍ය	ලභතෙ	ලභෙය්‍යං
ජානාති	ජානාතු	ජානෙය්‍ය	ජානතෙ	ජානෙය්‍යං
සුණාති	සුණාතු	සුණෙය්‍ය	සුණෙතෙ	සුණෙය්‍යං
නිසීදති	නිසීදතු	නිසීදෙය්‍ය	නිසීදතෙ	නිසීදෙය්‍යං
කිලමති	කිලමතු	කිලමතෙය්‍ය	කිලමතෙ	කිලමෙය්‍යං
පසසති	පසසතු	පසෙසය්‍ය	පසසතෙ	පසෙසය්‍යං
බන්ධති	බන්ධතු	බන්ධෙය්‍ය	බන්ධතෙ	බන්ධෙය්‍යං
වින්දති	වින්දතු	වින්දෙය්‍ය	වින්දතෙ	වින්දෙය්‍යං
විහරති	විහරතු	විහරෙය්‍ය	විහරතෙ	විහරෙය්‍යං
පවිසති	පවිසතු	පවිසෙය්‍ය	පවිසතෙ	පවිසෙය්‍යං
ආචික්ඛති	ආචික්ඛතු	ආචික්ඛෙය්‍ය	ආචික්ඛතෙ	ආචික්ඛෙය්‍යං

WWW.PIRIVENA.LK

05. 'උපාසකො මං භවං ගොතමො ධාරෙතු' ජේදයේ එන ක්‍රියා පද උපුටා දක්වා පහත වගුවෙහි යොදන්න.

ක්‍රියා පදය	**ක්‍රියා විභක්තිය**	**පුරුෂය**	**වචනය**
අවොච	අජ්ජතනී	පඨම	එක
උක්කුජ්ජෙය්‍ය	සත්තමී	පඨම	එක
විවරෙය්‍ය	සත්තමී	පඨම	එක
ආචික්ඛෙය්‍ය	සත්තමී	පඨම	එක
ධාරෙය්‍ය	සත්තමී	පඨම	එක
පකාසිතො	අතීත කෘදන්ත		
ගච්ඡාමි	වත්තමානා	උත්තම	එක
ධාරෙතු	පඤ්චමී	පඨම	එක
මුඤ්චාමි	වත්තමානා	උත්තම	එක
දෙමි	වත්තමානා	උත්තම	එක
ඛාදන්තු	පඤ්චමී	පඨම	බහු
පිවන්තු	පඤ්චමී	පඨම	බහු
උපවායතු	පඤ්චමී	පඨම	එක
කථෙසි	අජ්ජතනී	පඨම	එක
පකාසෙසි	අජ්ජතනී	පඨම	එක
අඤ්ඤාසි	අජ්ජතනී	පඨම	එක
පටිජග්ගෙය්‍ය	සත්තමී	පඨම	එක

WWW.PIRIVENA.LK

පස්වැනි පාඩම

අභ්‍යාසය

1. 'උට්ඨෙහි සම්ම සුදින්න' යන ඡේදය සිංහලට නගන්න.

පඤ්චමො පාඨො | **උට්ඨෙහි සම්ම සුදින්න**

අථ ඛො සුදින්නස්ස කලන්දකපුත්තස්ස සහායකා යෙන සුදින්නස්ස කලන්දපුත්තස්ස මාතාපිතරො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා සුදින්නස්ස කලන්දකපුත්තස්ස මාතාපිතරො එතදවොචුං. "අම්ම, තාත, එසො සුදින්නො අනන්තරහිතාය භූමියා නිපන්නො 'ඉධෙව මෙ මරණං භවිස්සති පබ්බජ්ජා වා'ති. සචෙ තුම්හෙ සුදින්නං නානුජානිස්සථ අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, තත්ථෙව මරණං ආගමිස්සති. සචෙ පන තුම්හෙ සුදින්නං අනුජානිස්සථ අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, පබ්බජිතම්පි නං දක්ඛිස්සථ. සචෙ සුදින්නො නාභිරමිස්සති අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, කා තස්ස අඤ්ඤා ගති භවිස්සති? ඉධෙව පච්චාගමිස්සති. අනුජානාථ සුදින්නං අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති. "අනුජානාම, තාත, සුදින්නං අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති. අථ ඛො සුදින්නස්ස කලන්දකපුත්තස්ස සහායකා යෙන සුදින්නො කලන්දකපුත්තො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා සුදින්නං කලන්දකපුත්තං එතදවොචුං. "උට්ඨෙහි සම්ම සුදින්න, අනුඤ්ඤාතො'සි මාතාපිතූහි අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති. අථ ඛො සුදින්නො කලන්දකපුත්තො "අනුඤ්ඤාතො'ම්හි කිර මාතාපිතූහි අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති හට්ඨො උදග්ගො පාණිනා ගත්තානි පරිපුඤ්ජන්තො උට්ඨාසි. අථ ඛො සුදින්නො කලන්දකපුත්තො කතිපාහං බලං ගාහෙත්වා යෙන භගවා, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සුදින්නො කලන්දකපුත්තො භගවන්තං එතදවොච. "අනුඤ්ඤාතො'ම්හි අහං භන්තෙ මාතාපිතූහි අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය. පබ්බාජෙතු මං භගවා"ති. අලත්ථ ඛො සුදින්නො කලන්දකපුත්තො භගවතො සන්තිකෙ පබ්බජ්ජං, අලත්ථ උපසම්පදං. අචිරූපසම්පන්නො ච පනායස්මා සුදින්නො එවරූපෙ ධුතගුණෙ සමාදාය වත්තති. ආරඤ්ඤිකො හොති, පිණ්ඩපාතිකො, පංසුකූලිකො, සපදානචාරිකො. අඤ්ඤතරං වජ්ජිගාමං උපනිස්සාය විහරති.

(පඨමපාරාජිකං - පාරාජිකපාළි)

උට්ඨෙහි සම්ම සුදින්න

ඉක්බිති කලන්දක පුත්‍ර වූ සුදින්නගේ යහළුවෝ කලන්දක පුත්‍ර සුදින්නගේ මාපියන් වෙත පැමිණියහ. පැමිණ කලන්දකපුත්‍ර සුදින්නගේ මාපියන්ට මෙසේ කීවෝ ය. 'මෑණියනි, පියාණනි, සුදින්න තෙමේ මෙහි ම මාගේ මරණය හෝ පැවිද්ද වන්නේය'යි කිසිවක් නො අතුළ බිමෙහි වැතිරුණේ වෙයි. ඉදින් තොපි ගිහිගෙන්

WWW.PIRIVENA.LK

නික්ම සසුන් වන්නට සුදින්නට අවසර නොදෙන්නෝහු නම් එහි ම මරණය පැමිණෙන්නේ ය. ඉදින් තොපි ගිහිගෙයින් නික්ම සසුන් වන්නට සුදින්නට අවසර නොදෙන්නෝහු නම් පැවිදි වූ ඔහු දක්නහු ය. ඉදින් සුදින්න තෙමේ ගිහිගෙයින් නික්ම සසුන් වැදී පැවිද්දෙහි සිත් නො අලවන්නේ නම්, ඔහුගේ කිනම් අනෙක් ගතියක් වන්නේ ද? මෙහි ම පෙරළා එන්නේ ය. ගිහිගෙයින් නික්ම සසුන් වැදීමට සුදින්නට අවසර දෙව් යනුවෙනි. ''දරුවනි, ගිහිගෙයින් නික්ම සසුන් වැදීමට සුදින්ට අනුදනිමු.'' කීහ. ඉක්බිති කලන්දක පුත්‍ර සුදින්නගේ යහළුවෝ කලන්දක පුත්‍ර සුදින්න වෙත පැමිණියහ. පැමිණ කලන්දක පුත්‍ර සුදින්නට මෙසේ කීවෝ ය. ''යහළු සුදින්නයෙනි, නැගිටින්න. මාපියන් විසින් ගිහිගෙයින් නික්ම සසුන් වන්නට අවසර දෙනු ලැබූහ'' යනුවෙනි.

ඉක්බිති කලන්දක පුත්‍ර සුදින්න තෙමේ ''මව්පියන් විසින් ගිහිගෙයින් නික්ම සසුන් වැදීමට අනුදක්නා ලද්දේ වෙමි'යි සතුටු වූයේ ඔදවැඩී ගිය සිත් ඇත්තේ, අතින් සිරුර පිරිමදිමින් නැගී සිටියේ ය. ඉක්බිති කලන්දක පුත්‍ර සුදින්න තෙමේ කිහිප දවසක් මුළුල්ලේ කය බලගන්වා බුදුරදුන් වෙත පැමිණියේ ය. පැමිණ බුදුරදුන්ට වැඳ එකත්පසෙක හුන්නේ ය. පසෙක හුන්නා වූ කලන්දක පුත්‍ර සුදින්න තෙමේ බුදුරදුන්ට මෙසේ සැළ කළේ ය. ''වහන්ස, මම ගිහිගෙයින් නික්ම සසුන් වැදීමට මාපියන් විසින් අනුදක්නා ලද්දෙම් වෙමි. භාග්‍යවතුන් වහන්සේ මා පැවිදි කරන සේක්වා.' යනුවෙනි. කලන්දක පුත්‍ර සුදින්න තෙමේ භාග්‍යවතුන් සමීපයෙහි පැවිද්ද ලැබී ය. උපසම්පදාව ලැබී ය. උපසම්පන්න වී නොබෝ කල් ඇති සුදින්න තෙමේ මෙබඳු ධූතංග ගුණයන් සමාදම් ව වෙසෙයි. අරණෙහි වසන්නෙක් වෙයි. පිණ්ඩපාතික වෙයි. පාසිවුරු දරන්නෙක් වෙයි. ගෙපිළිවෙළින් පිඬු සිඟන්නෙක් වෙයි. එක්තරා වජ්ජි ග්‍රාමයක් ඇසුරු කොට වාසය කරයි.

WWW.PIRIVENA.LK

2. පාලියෙන් පිළිතුරු සපයන්න.

i. කො කං නිස්සාය සුදින්නස්ස පබ්බජ්ජාය අනුජානථාති මාතාපිතරං යාචිංසු ?

සහායකෙහි මිත්තෙහි නිස්සාය සුදින්නස්ස පබ්බජ්ජාය අනුජානථාති මාතාපිතරං යාචිංසු.

ii. සචෙ සුදින්නස්ස මාතාපිතරො පබ්බජ්ජං නානුජානෙය්‍යුං තස්ස කිං භවෙය්‍යුං ?

සචෙ සුදින්නස්ස මාතාපිතරො පබ්බජ්ජං නානුජානෙය්‍යුං තස්ස තත්ථෙව මරණං භවෙය්‍ය.

iii. පබ්බජ්ජාය අනුඤ්ඤාතභාවං ඤත්වා කො කං උපසඞ්කමි ?

පබ්බජ්ජාය අනුඤ්ඤාතභාවං ඤත්වා සුදින්නෙන යෙන භගවා තෙන උපසඞ්කමි.

iv. චිත්තාපෙක්ඛා හිනෙනා සුදිනෙනා කස්මිං නිපන්නො අහොසි ?

චිත්තාපෙක්ඛා හිනෙනා සුදිනෙනා 'ඉධෙව මෙ මරණං භවිස්සතීති' නිපන්නො අහොසි.

v. පබ්බජිතො සුදින්නො කීවරූපෙ ධුතගුණෙ සමාදාය වත්තති ?

පබ්බජිතො සුදින්නො පිණ්ඩපාතිකො, පංසුකූලිකො, සපදානචාරිකො ආදි ධුතගුණෙ සමාදාය වත්තති.

3. ඡේදයෙහි එන වාක්‍ය රටාව අනුගමනය කොට පාලියට නගන්න.

i. දකුණු දිසාවෙහි මහඇමතිගේ යහළුවෝ ජනාධිපතිතුමා වෙත එළඹ මෙසේ කීවාහු ය.

අථ ඛො දක්ඛිණ දිසස්මිං මහාමච්චස්ස සහායකා යෙන ජනාධිපති තෙන උපසඞ්කමිත්වා එතදවොචුං.

ii. මේ දරුවා කිසිවක් නො ඇතිරූ බිම වැතිර සිටී.

එසො දාරකො අනන්තරහිතාය භූමියා නිපන්නො.

iii. ඇමතිවරුනි, යැපීම සඳහා වැටුප් අනුමත කරන්න.

භො අමච්චා, යාපනාය වෙතනං අනුජානාථ.

iv. යහළුවනි, නැගිටිව්, ඇමතිවරුන් විසින් තොපගේ වැටුප අනුමත කරන ලදි.

WWW.PIRIVENA.LK

හො සහායකා, උටඨහථ, අමචෙවහි තුමහාකං වෙතනං අනුඤ්ඤාතාති.

v. ගුරුවරයා යම් තැනක ද අපි සියල්ලෝ ම එතනට යමු. යෙන ආචරියො තෙන මයං සබ්බෙව ගච්ඡාම.

4. ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.

i. බලාපොරොත්තු ඉටු කර ගැනීමට පුද්ගලයෙකුට තිබිය යුතු සම්පත් මොනවා ද?

   චුවමනාව, අධිෂ්ඨානය, උත්සාහය, වීර්යය

ii. මව්පියන් දරුවන් කෙරෙහි දක්වන ආකල්පය කුමක් ද?

   දූදරුවන් තම සමීපයෙහිම ජීවත් වනවාට දෙමාපියන් කැමති ය.

   තම පරපුර ඉදිරියට පවත්වාගෙන යනවාට කැමති ය.

iii. පැවිදි වීමට අත්‍යවශ්‍ය වන සාධකය කුමක් ද?

   දෙමාපියන්ගේ කැමැත්ත හා අනුමැතිය

iv. සුදින්නගේ පැවිද්දට අනුමැතිය ගැනීමට යහළුවන් ඉදිරිපත් කළ තර්කය කුමක් ද?

   සුදින්න පැවිදි ජීවිතයට සිත නො ඇලෙන්නේ නම් උපැවිදි වී යළි නිවසට පැමිණෙන්නේ ය.

v. පැවිදි වූ තැනැත්තා තුළ තිබිය යුතු උතුම් ගුණාංග මොනවා ද?

   ධූතාංග රැකීම (ඡේදයට අනුව)

අභ්‍යාසය

01. පහත ක්‍රියාපදයන්හි ආඛ්‍යාත විභක්තිය, පදය, පුරුෂය, වචනය ලියන්න.

ආඛ්‍යාත පදය	විභක්තිය	පදය	පුරිසය	වචනය
උපසඞකමිංසු	අජ්ජතනී	පරස්ස	පඨම	බහු
අවොචුං	අජ්ජතනී	පරස්ස	පඨම	බහු

WWW.PIRIVENA.LK

ආගමිස්සති	භවිස්සන්ති	පරස්ස	පඨම	එක
භවිස්සති	භවිස්සන්ති	පරස්ස	පඨම	එක
අනුජානිස්සථ	භවිස්සන්ති	පරස්ස	මජ්ඣිම	බහු
අනුජානාම	පඤ්චමී	පරස්ස	උත්තම	බහු
උට්ඨෙහි	පඤ්චමී	පරස්ස	මජ්ඣිම	එක
උට්ඨාසි	අජ්ජතනී	පරස්ස	පඨම	එක
නිසීදි	අජ්ජතනී	පරස්ස	පඨම	එක
අවොච	අජ්ජතනී	පරස්ස	පඨම	එක
අලත්ථ	හීයත්තනී	අත්තනො	පඨම	එක

03. දී ඇති ආඛ්‍යාත පද සුදුසු පරිදි යොදා හිස්තැන් පුරවන්න.

(ආගඤ්ජුං/ පරියාපුණාථ/ උපට්ඨහස්සු/ නික්කුජ්ජෙය්‍යුං/ යන්තු / කරොහි/ සමෙමාදිංසු/ භාවෙය්‍ය)

i. ඉති ඉමා චතුරාරක්ඛා භික්ඛු භාවෙය්‍ය සීලවා.

ii. අසෙසා විලයං යන්තු අනන්තගුණතෙජසා.

iii. පරියාපුණාථ භික්ඛවෙ ආටානාටියං රක්ඛං.

iv. අමනුස්සා රිත්තම්පි පත්තං සීසෙ නික්කුජ්ජෙය්‍යුං.

v. අප්පෙකච්චෙ භගවතා සද්ධිං සමෙමාදිංසු.

vi. ආගඤ්ජුං තස්සුපට්ඨානං ඛත්තියා බ්‍රාහ්මණා බහූ.

vii. ඛීණාසවා අනෙනන පානෙන උපට්ඨහස්සු.

viii. යං තං කරණීයං තං කරොහි.

04. හිස්තැන් පුරවන ලද 3 ප්‍රශ්නයෙහි එන වාක්‍ය සිංහලට නගන්න.

i. සිල්වත් භික්ෂුව මෙම සිව් ආරක්ෂා වඩන්නේ (නම් මැනවි)

ii. අනන්ත ගුණ තේජසින් ඉතිරි නොවී දිස්විය.

iii. මහණෙනි ආටානාටිය රකින්න. පුරුදු වන්න.

iv. අමනුෂ්‍යයෝ හිස් වූ පාත්‍රයක් හිසේ නවන්නාහ.

v. ඇතැමෙක් බුදුරජාණන් වහන්සේ සමඟ සතුටු වූහ.

vi. ඔහුට උපස්ථාන පිණිස බොහෝ ක්ෂත්‍රිය බ්‍රාහ්මණයෝ ආවෝ ය.

vii. රහතන් වහන්සේට ආහාර පානයෙන් උපස්ථාන කරහු.

viii. ඔබට කළ හැකි යමක් ඇත්නම් එය කරව.

05. පහත ආඛ්‍යාතයන්හි බහුවචන රූපය, ආඛ්‍යාත විභක්තිය, පදය හා පුරුෂය ලියන්න.

ක්‍රියා පදය	**බහුවචන රූපය**	**ආඛ්‍යාත විභක්තිය**	**පදය**	**පුරුෂය**
පක්කමිස්සං	පක්කමිස්සාමෙහ	භවිස්සන්ති	අත්තනො	උත්තම
වසී	වසිංසු	අජ්ජතනී	පරස්ස	පඨම
ගවෙසෙය්‍යං	ගවෙසෙය්‍යුං	සත්තමී	පරස්ස	පඨම
අනුජානාහි	අනුජානාථ	පඤ්චමී	පරස්ස	මජ්ඣිම
ඛමස්සු	ඛමවෙහා	පඤ්චමී	අත්තනො	මජ්ඣිම
වන්දෙ	වන්දෙය්‍යුං	සත්තමී	පරස්ස	පඨම
අඤ්ඤාසි	අඤ්ඤාසුං	අජ්ජතනී	පරස්ස	පඨම
ජගාම	ජගාමු	පරොක්ඛා	පරස්ස	පඨම
අලභිස්සා	අලභිස්සංසු	කාලාතිපත්ති	පරස්ස	පඨම
අට්ඨාසි	අට්ඨාසුං	අජ්ජතනී	පරස්ස	පඨම
අද්දසා	අද්දසසුං	අජ්ජතනී	පරස්ස	පරස්ස

WWW.PIRIVENA.LK

06. ඒකවචන රූප ලියන්න.

i. පවත්තයුං - පවත්ති
ii. අබ්‍රවුං - අබ්‍රවි
iii. ආහංසු - ආහ
iv. නිබ්බායිස්සාම - නිබ්බායිස්සාමි
v. පරිදෙවිංසු - පරිදෙවි
vi. අලත්ථුං - අලත්ථ
vii. යාචාම - යාචාමි
viii. පමජ්ජන්ති - පමජ්ජති
ix. පරිභවිංසු - පරිභවි
x. කුබ්බන්ති - කුබ්බති
xi. සමාගච්ඡන්තු - සමාගච්ඡති
xii. සමග්ගහුං - සමග්ගි
xiii. අලභිම්හ - අලභිං
xiv. ලභෙය්‍යාම - ලභෙය්‍යාමි

WWW.PIRIVENA.LK

සයවැනි පාඩම

අභ්‍යාසය

01. 'තථාගතස්ස ආළාහනං' ඡේදය සිංහලට නගන්න.

ඡට්ඨො පාඨො

තථාගතස්ස ආළාහනං

අථ ඛො ආයස්මා මහාකස්සපො යෙන කුසිනාරා මකුටබන්ධනං නාම මල්ලානං චෙතියං, යෙන භගවතො චිතකො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකංසං චීවරං කත්වා අඤ්ජලිං පණාමෙත්වා තික්ඛත්තුං චිතකං පදක්ඛිණං කත්වා පාදතො විවරිත්වා භගවතො පාදෙ සිරසා වන්දි. තානිපි ඛො පඤ්චභික්ඛුසතානි එකංසං චීවරං කත්වා අඤ්ජලිං පණාමෙත්වා තික්ඛත්තුං චිතකං පදක්ඛිණං කත්වා භගවතො පාදෙ සිරසා වන්දිංසු. වන්දිතෙසු ච පනායස්මතා මහාකස්සපෙන තෙහිපි පඤ්චහි භික්ඛුසතෙහි සයමෙව චිතකො පජ්ජලි. ඣායමානස්ස ඛො පන භගවතො සරීරස්ස, යං අහොසි ඡවීති වා චම්මන්ති වා මංසන්ති වා නහාරූති වා ලසිකාති වා තස්ස නෙව ඡාරිකා පඤ්ඤායිත්ථ, න මසි, සරීරානෙව අවසිස්සිංසු. සෙය්‍යථාපි නාම සප්පිස්ස වා තෙලස්ස වා ඣායමානස්ස න ඡාරිකා පඤ්ඤායිත්ථ, න මසි. සරීරානෙව අවසිස්සිංසු. තෙසඤ්ච පඤ්චන්නං දුස්සයුගසතානං ද්වෙව ච දුස්සානි න ඩය්හිංසු. යඤ්ච සබ්බබ්භන්තරිමං, යඤ්ච බාහිරං. දඩ්ඪෙ ච ඛො පන භගවතො සරීරෙ අන්තලික්ඛා උදකධාරා පාතුභවිත්වා භගවතො චිතකං නිබ්බාපෙසි. උදකං සාලතොපි අබ්භුන්නමිත්වා චිතකං නිබ්බාපෙසි. කොසිනාරකාපි මල්ලා සබ්බගන්ධොදකෙන භගවතො චිතකං නිබ්බාපෙසුං.

(මහාපරිනිබ්බාණසුත්ත - දීඝනිකාය)

තථාගතස්ස ආළාහනං

ඉක්බිත්තෙන් මහාකාශ්‍යප තෙරණුවෝ කුසිනාරා නුවර මකුට බන්ධන නම් මල්ලයන්ගේ චෛත්‍යය යම් තැනක ද භාග්‍යවතුන් වහන්සේගේ චිතකය යම් තැනක ද එතැනට වැඩි සේක. වැඩම කොට සිවුර එක්ලස් කොට දොහොත් නඟා තුන් වටක් චිතකය පැදකුණු කොට හිස නමා භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ සිරි පා වැන්දාහු ය. ඒ පන්සියයක් භික්ෂූන් වහන්සේලා ද සිවුර එකස් කොට දොහොත් මුදුන් නගා තුන් විටක් චිතකය පැදකුණු කොට හිස නමා භාග්‍යවත් බුදුරදුන්ගේ සිරි පා නැමදූහ. මහාකාශ්‍යප තෙරුන් විසින් ද ඒ පන්සියයක් භික්ෂූන් විසින් ද භාග්‍යවතුන් වහන්සේගේ සිරි පා

WWW.PIRIVENA.LK

වඳනා ලද කල්හි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ චිතකය තෙමේ ම ගිනි ගත්තේ ය.

දැවෙන්නා වූ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී ශරීරය සිවිය හෝ සම හෝ මස් හෝ නහර හෝ සඳමිදුළු හෝ යමෙක් වේ ද එහි අළු නොම වීය. ශාරීරික ධාතුහුම ඉතිරි වූහ. යම් සේ දැවෙන ගිතෙල හෝ තලතෙල අළු නොම පැනේ ද දැලි නොම පැනේ ද එසේ ම දැවෙන භාග්‍යවත් බුදුරදුන්ගේ ශ්‍රී ශරීරය සිවියැයි හෝ සම යැයි හෝ මස යැයි හෝ නහර යැයි හෝ සඳමිදුලු යැයි හෝ යමෙක් ඉතිරි වී ද එහි අළු ද නොපෙනිණි. දැලි ද නොපෙණිනි. ශාරීරික ධාතුහුම ඉතිරි වූහ. ඒ පන්සියයක් වස්ත්‍ර යුගලයන් අතුරෙන් යම් වස්ත්‍රයක් සැමට යටින් වී ද, යම් වස්ත්‍රයක් සැමට පිටින් වී ද ඒ වස්ත්‍ර දෙක ම නොදැවිණි. භාග්‍යවත් බුදුරදුන්ගේ ශ්‍රී ශරීරය දැවුණු කල්හි අහසින් දිය දහර පහළ ව චිතකය නිවී ය. වටා සිටි සල්රුක් හි අතු පතරින් ද ජලය මතු වී චිතකය නිවී ය. කුසිනාරා වාසී මල්ල රජදරුවෝ ද සැම වර්ගයේ සුවඳ කැවූ සුවඳ දියෙන් භාග්‍යවතුන් වහන්සේගේ චිතකය නිවූහ.

02. පාලියෙන් පිළිතුරු සපයන්න.

i. තථාගතස්ස ආළාහනං කත්ථ අහෙසුං ?

   තථාගතස්ස ආළාහනං කුසිනාරා මකුටබන්ධනං නාම මල්ලානං රජ්ජෙ අහෙසුං.

ii. ආයස්මා මහාකස්සපො කතික්ඛත්තුං භගවතො චිතකං පදක්ඛිණං අකාසි ?

   ආයස්මා මහාකස්සපො තික්ඛත්තුං භගවතො චිතකං පදක්ඛිණං අකාසි.

iii. සො කිත්තකෙහි භික්ඛූහි සද්ධිං තත්ථ අගමාසි ?

   සො පඤ්චභික්ඛුසතෙහි සද්ධිං තත්ථ අගමාසි.

iv. ඣායමානස්ස භගවතො සරීරෙ කෙ පන අවස්සිංසු ?

ඣායමානස්ස භගවතො සරීරෙ සරීරෙනෙව අවසිස්සිංසු.

v. කොසිනාරකා පන කෙන භගවතො චිතකං නිබ්බාපෙසුං ?

කොසිනාරකා පන සබ්බගන්ධොදකෙන භගවතො චිතකං නිබ්බාපෙසුං.

03. පිළිතුරු සපයන්න.

i. තථාගත දේහය ආදාහනයේ දී අලු නොවී ඉතිරි වූ වස්ත්‍ර දෙක කුමක් ද?

යම් වස්ත්‍රයක් සමට පිටින්වී ද සැමට යටින් වී ද ඒ වස්ත්‍ර දෙකයි.

ii. මහකසුප් මාහිමි තථාගත ශ්‍රී දේහයට අවසන් බුහුමන් දැක්වීමට ප්‍රමාදවීමට හේතුව කුමක් ද?

උන්වහන්සේ මේ පිළිබඳ නොදැන සිටීම. ආජීවකයෙකු මේ පිළිබඳ පවසා ඇත.

iii. තථාගත දේහය දැවීමේ දී අලු හෝ දැලි ඉතිරි නොවී දැවුණේ කුමන කොටස් ද?

සම, මස, නහර, සඳමිදුලු

iv. මහකසුප් හිමි අවසන් බුහුමන් දක්වන තෙක් තථාගත දේහයට ගිණි නො ඇවිලී තිබුණේ කුමක් නිසා ද?

කාශ්‍යප හිමියන් බුදුහිමියන් පැදකුණු කරන තුරු සෑය ගිනි නොදැල්වේවායි දෙවියන්ගේ අදහස නිසා

v. චිතකයේ ගිනි නිවීමට ජලධාරාවන් පැමිණියේ කොතැනින් ද?

ජලධාරා අහසින් හා සල්ගස් අතුපතරින් මතු විය.

04. ඡේදයේ එන වාක්‍ය රටා අනුගමනය කරමින් පාලියට නගන්න.

i. සාමණේරවරු උදෑසන ම සිවුර ඒකාංශ කොට ඇඳිලිබැඳ තුන්වරක් චෛත්‍ය පැදකුණු කොට හිසින් වඳිති.

සාමණෙරා පාතොව චීවරං එකංසං කත්වා අඤ්ජලිං බන්ධිත්වා තික්ඛත්තුං චෙතිං පදක්ඛිණං කත්වා සිරසා වන්දන්ති.

WWW.PIRIVENA.LK

ii. ජනාධිපති තෙම ඇමතිවරුන් පන්සියයක් සමඟ අනුරාධපුරයට ගියේ ය.

ජනාධිපති පඤ්චහි අමච්චෙහි සද්ධිං අනුරාධපුරං ගච්ඡි.

iii. ළමුන් පන්සියයක් අතුරෙන් දෙසියපනහක් (අඩ්ඪතෙය්‍යසතං) විභාගය සමත් වූහ.

පඤ්චසතෙසු බාලකෙසු අඩ්ඪතෙය්‍යසතං විභාගං සමත්‍ථා අහෙසුං.

iv. අප නගරයට ගිය කල්හි බොහෝ මිනිස්සු එහි රැස් වූහ.

අම්හෙසු නගරං ගතෙ බහු මනුස්සා තත්‍ථ සන්නිපතිංසු.

අභ්‍යාසය

01. සිංහලට නගන්න.

i. ඉදානි පන එකච්චෙ සමණපතිරූපකා පීතානි වත්‍ථානි පාරුපිත්‍වා සාසනවිලොමං කරොන්ති.

දැන් වනාහි ඇතැම් ශ්‍රමණ ප්‍රතිරූපකයෝ කසාවත් පොරවා සසුනට විරුද්ධ දෑ කරති.

ii. ධිතිමන්තො සො පාතොව උට්ඨාය කූජන්තෙ සකුණෙ පස්සති.

ධෛර්වන්ත ඔහු උදේම නැගිට නදදෙන කුරුල්ලන් බලයි.

iii. කතවෙදි සුනඛො අත්තනො සාමිකං ගොපනත්‍ථාය භුඞ්කාරං අකාසි.

කෘතවේදී (කළගුණ දන්නා) බල්ලා තමාගේ ස්වාමියා රැකීම සඳහා බිරුම් කළේ ය. (බිරුවේ ය)

iv. පණ්ඩිතා සප්පුරිසා මනුස්සා අත්තානං උපකාරකානං පච්චුපකාරං කරොන්ති.

පණ්ඩිත සත්පුරුෂ මිනිස්සු තමාට උපකාර කළවුන්ට ප්‍රත්‍යුපකාර කරති.

v. එකො මක්කටො දිවසෙ දිවසෙ තථාගතස්ස උපට්ඨානං කරොති.

WWW.PIRIVENA.LK

එක් වඳුරෙක් දිනපතා (දිනක් දිනක් පාසා) තථාගතයන් වහන්සේට උපස්ථාන කරයි.

02. පාලියට නගන්න.

i. ධර්මය දන්නා වූ නුවණැත්තෝ නොයෙක් කුසල් දහම් පුරා තමන් ම දමනය කරති.

ධම්මඤ්ඤූ මෙධාවිනො නානාවිධ කුසල ධම්මං පූරෙත්වා අත්තනාව දමෙන්ති. (දමයන්ති)

ii. ගුණවත් උපාසිකාවෝ විහාරයට ගොස් එකත්පසෙක හුන්නා හ.

ගුණවන්තී උපාසිකායො විහාරං ගන්ත්වා එකමන්තං නිසීදිංසු.

iii. ගම්වැසි මනුෂ්‍යයෙක් එක් මුගටිපැටියෙක් ගෙනවිත් මහත් සෙනෙහසින් පෝෂණය කරයි.

ගාමවාසී මනුස්සො එකං නකුලපොතකං ආනෙත්වා මහාසිනෙහෙන පොසෙති.

iv. දුම්රියෙන් යන්නා වූ ඔවුහු කුඩා ගෙවල් බොහෝ සෙයින් දැක්කාහ.

ධූමරථෙන ගච්ඡන්තා තෙ ඛුද්දානි ගෙහානි භීයොයාසොමත්ථතාය පස්සිංසු.

v. එක් බළලෙක් ලොකු මීයකු අල්ලා ගනු පිණිස වේගයෙන් දිව්වේ ය.

එකො බිළාලො මහන්තං මූසිකං ගණ්හිතුං වෙගෙන/ සීඝෙන (වෙගං/ සීඝං) ධාවි.

03. පහත සඳහන් පද ලිංගත්‍රයට අනුව බෙදා දක්වන්න.

තිස්සො, පඤ්චහි, වීසති, ඡබ්බීසති, එකූනවීසති, තයො, දුවෙ, දවත්තිංසති, එකපඤ්ඤාසා, එකිස්සං, චතස්සො, තෙරස, නවුති, ඡ, සත්තති, ඡත්තිංසති, තිස්සන්නං, සට්ඨි, පඤ්චවීසති, දස, තීණි, සතං, ද්වීසු, පඤ්චහි, තිණ්ණං, අසීති, ඡාසීති, ඡන්නවුති, නවුති

පුලලිංග	ඉත්ථිලිංග	නපුංසකලිංග	ත්‍රිලිංග
තයො	තිස්සො	තීණි	පඤ්චහි

WWW.PIRIVENA.LK

තිණ්ණං	වීසති	සතං	ද්වෙ
	ඡබ්බීසති	නවුති	තෙරස
	එකූනවීසති		ඡ
	ද්වත්තිංසති		දස
	එකපඤ්ඤාසා		ද්වීසු
	එකිස්සං		පඤ්චහි
	චතස්සො		තිණ්ණං
	නවුති		
	සත්තති		
	ඡත්තිංසති		
	තිස්සන්නං		
	සට්ඨි		
	පඤ්චවීසති		
	අසීති		
	ඡාසීති		
	ඡන්නවුති		

04. වරහන් තුළ දක්වා ඇති ඉලක්කමට ගැළපෙන සංඛ්‍යාවාචී වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. <u>තිස්සො</u> (3) ගාවියො ඛෙත්තෙ ආහිණ්ඩන්ති.

ii. මයං ගාමං ගච්ඡන්තා <u>එකූනතිංසතිං</u> (29) මිගෙ පස්සිමහ.

iii. දසපුරිසා <u>පඤ්ච</u> (5) අම්බෙ ඛාදිංසු.

iv. ඉමස්මිං ගාමෙ <u>ද්වාසත</u> (102) ගෙහා සන්ති.

v. මයං ඉතො <u>අට්ඨහි</u> (8) දිවසෙහි නගරං ගමිස්සාම.

05. පහත මාතෘකා සඳහා වචන පහකට නොඅඩු වාක්‍ය 5 බැගින් ලියන්න.

- ❖ වානරො
- ❖ නගරං
- ❖ මහාවාලුකානදී

WWW.PIRIVENA.LK

❖ සොවණ්ණමාලිමහාචෙතියං

වානරො

අරඤ්ඤෙ වසන්තා වානරො කාළවණ්ණා හොති. තස්ස චතුප්පාදං ච නංගුට්ඨං ච අත්ථි. වානරා සමූහ වසෙන වනෙ ජීවන්ති. වානරො කදාචි ගෙහං න කාරෙති. සො සබ්බදා රුක්ඛලතාදිසු ඨානෙසු ජීවති. වානරො අම්හාකං මිත්තො භවති.

නගරං

නගරෙ පන බහු මනුස්සා ජීවන්ති. තස්මා නගරං පන සංකිණ්ණ භාවං විජ්ජති. නගරෙ නානා ඨානෙසු ආපණානි සන්ති. මනුස්සා භණ්ඩානි කිණිතුං වා වික්කිණිතුං වා නගරං පවිසන්ති. තෙන හෙතුනා අනුදිනං නගරෙ බහුමනුස්සා සඤ්චරන්ති. නගරෙ පාඨාලයඤ්ච ගිලානසාලඤ්ච අධිකරණසාලඤ්ච නානාවිධ පාසාදා ච සන්ති.

මහාවාලුකානදී

මහාවාලුකානදී පන සමන්තකූට පබ්බතම්හා සන්දති. සා අතිමහොහරා ච මහාජලක්ඛන්ධං ච භවති. ලංකාදීපෙ බහුමනුස්සා තෙන ජලං ලභිත්වා කසිකම්මං කරොන්ති. මහාවාලුකා නදී පන ලංකාදීපෙ දීඝතම ගංගා භවති. වස්සාන කාලෙ වාලුකා නදී අතිරමණීයා භවති.

සොවණ්ණමාලිමහාචෙතියං

දුට්ඨගාමිණි මහාරාජා අනුරාධපුර නගරෙ මහාමෙඝවනෙ සොවණ්ණමාලිමහාචෙතියං කාරාපෙසි. රතනමාලි චෙතිං ඉති ච තං ලංකාදීපෙ පාකටං අහොසි. තස්ස සමීපෙ ලොවාමහාපාසාදඤ්ච මරිචවට්ටි චෙතිං ච ජයසිරිමහබොධිං ච සන්ති. ලංකාදීපෙ වසන්තා මනුස්සා අතිසය ගාරවෙන තං වන්දන්ති. අනුසංවච්ඡරානි සොවණ්ණමාලිමහාචෙතියට්ඨානෙ මහාපූජොස්සවං පවත්තෙන්ති. බහුමනුස්සා ච සන්නිපතිත්වා පුප්ඵානි කත්වා අතීව සන්තුට්ඨා හොන්ති.

WWW.PIRIVENA.LK

හත්වැනි පාඩම

අභ්‍යාසය

01. පස්සථ අය්‍යා උපසන්තාය කම්මං’ ඡේදය සිංහලට නගන්න.

සත්තමො පාඨො | **පස්සථ අය්‍යා උපසන්තාය කම්මං**

භූතපුබ්බං භික්ඛවෙ, ඉමිස්සායෙව සාවත්ථියා වෙදෙහිකා නාම ගහපතානී අහොසි. වෙදෙහිකාය භික්ඛවෙ ගහපතානියා එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතොඃ සොරතා වෙදෙහිකා ගහපතානි, නිවාතා වෙදෙහිකා ගහපතානි, උපසන්තා වෙදෙහිකා ගහපතානීති. වෙදෙහිකාය ඛො පන භික්ඛවෙ ගහපතානියා කාළී නාම දාසී අහොසි, දක්ඛා අනලසා සුසංවිහිතකම්මන්තා. අථ ඛො භික්ඛවෙ කාළියා දාසියා එතදහොසිඃ මය්හං ඛො අය්‍යාය එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතොඃ සොරතා වෙදෙහිකාය ගහපතානී, නිවාතා වෙදෙහිකා ගහපතානී, උපසන්තා වෙදෙහිකා ගහපතානීති. කින්නු ඛො මෙ අය්‍යා සන්තංයෙව නු ඛො අජ්ඣත්තං කොපං න පාතුකරොති? උදාහු අසන්තං? උදාහු මය්හමෙවෙතෙ කම්මන්තා සුසංවිහිතා, යෙන මෙ අය්‍යා සන්තංයෙව අජ්ඣත්තං කොපං න පාතුකරොති? නො අසන්තං? යන්නූනාහං අය්‍යං වීමංසෙය්‍යන්ති. අථ ඛො භික්ඛවෙ කාළී දාසී දිවා උට්ඨාසි. අථ ඛො භික්ඛවෙ වෙදෙහිකා ගහපතානී කාළිං දාසිං එතදවොච. හෙ ජෙ කාළීති. කිං අය්‍යෙති? කිං ජෙ දිවා උට්ඨාසීති? 'න ඛො අය්‍යෙ කිඤ්චීති.' නො වත රෙ කිඤ්චි පාපී දාසී දිවා උට්ඨාසී'ති කුපිතා අනත්තමනා භාකුටිං අකාසි.

අථ ඛො භික්ඛවෙ කාළියා දාසියා එතදහොසිඃ සන්තංයෙව ඛො මෙ අය්‍යා අජ්ඣත්තං කොපං න පාතුකරොති නො අසන්තං මය්හමෙවෙතෙ කම්මන්තා සුසංවිහිතා, යෙන මෙ අය්‍යා සන්තංයෙව අජ්ඣත්තං කොපං න පාතුකරොති නො අසන්තං. යන්නූනාහං භිය්‍යොසොමත්තාය අය්‍යං විමංසෙය්‍යන්ති අථ ඛො භික්ඛවෙ කාළී දාසී දිවාතරං උට්ඨාසි. අථ ඛො භික්ඛවෙ වෙදෙහිකා ගහපතානි කාළිං දාසිං එතදවොචඃ හෙ ජෙ කාළීති. 'කිං අය්‍යෙ'ති? කිං ජෙ දිවාතරං උට්ඨාසීති? 'න ඛො අය්‍යෙ කිඤ්චී'ති. නො වත රෙ කිඤ්චි පාපී දාසී, දිවාතරං උට්ඨාසීති කුපිතා අනත්තමනා අනත්තමනවාචං නිච්ඡාරෙසි. අථ ඛො භික්ඛවෙ කාළියා දාසියා එතදහොසිඃ සන්තංයෙව ඛො මෙ අය්‍යා අජ්ඣත්තං කොපං න පාතුකරොති නො අසන්තං, මය්හමෙවෙතෙ කම්මන්තා සුසංවිහිතා යෙන මෙ අය්‍යා සන්තංයෙව අජ්ඣත්තං කොපං න පාතුකරොති, නො අසන්තං. යන්නූනාහං භිය්‍යොසොමත්තාය අය්‍යං වීමංසෙය්‍යන්ති. අථ ඛො භික්ඛවෙ කාළී දාසී දිවාතරංයෙව උට්ඨාසි. අථ ඛො භික්ඛවෙ වෙදෙහිකා ගහපතානි කාළිං දාසිං එතදවොච. හෙ ජෙ කාළීති. 'කිං අය්‍යෙති? කිං ජෙ දිවාතරං උට්ඨාසීති? න ඛො අය්‍යෙ කිඤ්චීති. නො වත රෙ කිඤ්චි පාපී දාසී, දිවාතරං උට්ඨාසීති කුපිතා අනත්තමනා අග්ගළසූචිං ගහෙත්වා සීසෙ පහාරං අදාසි. සීසං වොභින්දි. අථ ඛො භික්ඛවෙ කාළී දාසී භින්නෙන සීසෙන ලොහිතෙන ගළන්තෙන පටිවිස්සකානං උජ්ඣාපෙසිඃ 'පස්සථය්‍යා සොරතාය කම්මං, පස්සථය්‍යා නිවාතාය කම්මං, පස්සථය්‍යා උපසන්තාය කම්මන්ති.

(කකචූපම සුත්ත - මජ්ඣිමනිකාය)

WWW.PIRIVENA.LK

පසසථ අයයා උපසනතාය කමමං

මහණෙනි, පෙර වූවක් කියමි. මේ සැවැත්නුවරම වේදේහිකා නම් ගෘහපතිනියක් වූවා ය. මහණෙනි, වේදේහිකා ගෘහපතිනියගේ මෙබඳු කල්‍යාණ කීර්ති ශබ්දයක් පැන නැගිණි. වේදේහිකා ගෘහපතිනිය දැමුණු ඉඳුරන් ඇත්තී ය. වේදේහිකා ගෘහපතිනිය යටත් පැවතුම් ඇත්තී ය. වේදේහිකා ගෘහපතිනිය ශාන්ත ය. කියා ය. මහණෙනි, වේදේහිකා ගෘහපතිනියට කාළි නම් දාසියක් විය. දක්ෂය. අනලස් ය. මනාව සංවිධානය කළ කටයුතු ඇත්තී ය.

මහණෙනි, කාළී දාසියට ''මාගේ ආර්යාව පිළිබඳව -වේදේහිකා ගෘහපතිනිය සුරතභාවයෙන් යුක්තයි, වේදේහිකා ගෘහපතිනිය යටපත් පැවතුම් ඇත්තී ය. වේදේහිකා ගෘහපතිනිය උපශාන්තය යැයි කල්‍යාණ කීර්ති ශබ්දයක් පැන නැගිණි. කිමෙක් දෝ? මාගේ ආර්යාව තමා තුළ ඇත්තා වූ කෝපය පහළ නොකෙරේ ද? නැතහොත් නැත්තා වූහ කෝපය පහළ නොකෙරේ ද? එසේත් නැතහොත් යම් හෙයකින් මවිසින් ම සැම කර්මාන්තයෝ මැනවින් කරන ලදහුද එහෙයින් මාගේ ආර්යා තොමෝ තමා තුළ ඇත්තා වූ ම කෝපය පහළ නොකෙරේ ද විමසා බලන්මේ නම් ඉතා මැනවි යැයි මේ සිත විය. මහණෙනි, ඉක්බිති කාළී දාසී තොමෝ දහවල් කොට නැගී සිටියා ය. මහණෙනි, ඉක්බිති වේදේහිකා ගෘහණී තොමෝ කාළී දාසියට මෙය කිවූය. ''එම්බල කාළිය, ආර්යාවෙනි, කිම? එම්බල කෙල්ල, කිම, දහවල් කොට නින්දෙන් නැගිට්ටෙහි ද? 'ආර්යාවෙනි, කිසිත් නැත, එම්බල පව්ටු දාසිය, කිසිත් නැත්නම් දහවල් කොට නැගී සිටියෙහි ද? යැයි කෝප වූවා නොසතුටු වූවා මුහුණ හැකිළී ය.

මහණෙනි, එකල කාළී දාසියට මේ අදහස විය. ''මාගේ ආර්යාව තමා තුළ ඇත්‍ා වූ ම කෝපය පහළ නොකරන්නී ය. නැත්තා වූ ම කෝපය පහළ නොකරන්නී නොවේ. යම් හෙයකින් මා විසින් ම තෙල කර්මාන්තයෝ මැනවින් කරන ලද්දේ වීම් ද ඒ නිසා ආර්යා තොමෝ තමා තුළ ඇත්තා වූ ම කෝපය පහළ නොකෙරේ ද, නැත්තා වූ ම කෝපය පහළ නොකෙරේදැයි මම ආර්යාව බොහෝ සේ විමසා බලන්නෙම් නම් යෙහෙකි' කියා ය. මහණෙනි, ඉක්බිති කාළී දාසිය වඩාත් දහවල් කොට නින්දෙන් නැගී සිටියා ය.

WWW.PIRIVENA.LK

මහණෙනි, ඉක්බිති වේදේහිකා ගෘහපතිනිය කාළී දාසියට මෙසේ කීවා ය. 'එම්බල කෙල්ල, කාළිය. 'කිම ද ආර්යාවෙනි, කෙල්ල කුමක් නිසා ඉතා දහවල් කොට නැගී සිටිහි ද?, ආර්යාවෙනි කිසිත් නැත' ''එම්බල පවිටු දාසිය කිසිවක් නැතිව දහවල් කොට නැගිට්ටා දැයි' කිපියා වූ නොසතුටු වූවා නොසතුටු වචන පිට කළාය. එකල කාළී දාසියට මේ අදහස ඇති විය. 'මාගේ ආර්යාව තමා තුළ ඇත්තා වූ ම කෝපය පහළ නොකරන්නී ය. නැත්තා වූ කෝපය පහළ නොකරන්නී නොවෙයි. යම් හෙයකින් මා විසින් ඒ කර්මාන්ත මනාව කරන්නී ද ඒ නිසා ආර්යා තොමෝ තමා තුළ ඇත්තා වූ ම කෝපය පහළ නොකෙරේ ද නැත්තා වූ හ කෝපය පහළ නොකෙරේ දැයි මම ආර්යාව තවත් බොහෝ කොට විමසා බලන්නෙම් නම් මැනවැයි කියායි. මහණෙනි, ඉක්බිති කාළී දාසිය පෙරටත් වඩා දහවල් කොට නැගී සිටියා ය. මහණෙනි, ඉක්බිති වේදේහිකා ගෘහපතිනි තොමෝ කාළී දාසියට මෙසේ කීවා ය. 'එම්බල කාළිය, ආර්යාවෙනි, කිම? කෙල්ල කුමක් නිසා පෙරටත් වඩා දහවල් කොට නැගී සිටියෙහි ද? ආර්යාවෙනි, කිසිත් නැත. එම්බල පවිටු දාසිය, කිසිත් නැත්මි පෙරටත් වඩා දහවල් කොට නැගී සිටියෙහි දැයි කිපී නොසතුටු වූවාහු දොරඅගුල ගෙන හිසට පහරක් දුන්නා ය. හිස පැළුවා ය. මහණෙනි, ඉක්බිති කාළී දාසිය පැළුණු හිසින් ද ගලන ලෙයින් ද යුතුව අසල්වැසියන්ට අඬ ගා නුගුණ කීවා ය. ආර්යයෙනි දැමුණු ඉඳුරන් ඇති ස්ත්‍රියගේ ක්‍රියාව බලව. යටහත් පැවතුම් ඇත්තියගේ ක්‍රියාව බලව. උපශාන්ත තැනැත්තියගේ ක්‍රියාව බලව' යනුවෙනි.

02. පාලියෙන් පිළිතුරු සපයන්න.

i. වෙදෙහිකාය ගහපතානියා දාසී කා නාම අහොසි ?

   වෙදෙහිකාය ගහපතානියා දාසී කාළි නාම අහොසි.

ii. සා කිර දාසී කීදිසා අහොසි ?

   සා කිර දාසී දක්ඛා, අනලසා, සුසංවිහිතකම්මන්තා නියුත්තී අහොසි.

iii. සා අත්තනො චෙතසා කිං චින්තෙසි ?

   සා අත්තනො චෙතසා අය්‍යාය මානසික ගුණානි වීමංසෙතුං චින්තෙසි.

iv. අත්තනො අය්‍යං වීමංසිතුං සා කිං අකාසි ?

WWW.PIRIVENA.LK

අත්තනො අයයං වීමංසිතුං සා දිවාතරං උට්ඨාසි.

v. කුපිතා අනත්තමනා වෙදෙහිකා තං දාසිං කිං අකාසි ?

කුපිතා අනත්තමනා වෙදෙහිකා තං දාසිං අග්ගළසූචිං ගහෙත්වා සීසෙ පහාරං අදාසි.

03. පිළිතුරු සපයන්න.

i. බුද්ධකාලීන භාරතයේ දාසීන්ගේ ස්වරූපය පිළිබඳ කරුණු 2ක් ලියන්න.

ඔවුහු අනලස් ය. මනා කර්මාන්තාදියේ නියුත්තෝ ය. දක්ෂ ය.

ii. වෛදේහිකාවගේ ඉවසීම පරීක්ෂා කිරීමට දාසිය කළේ කුමක් ද?

දහවල් වන තෙක් නිදා ගැනීම

iii. ඇතුළාන්ත කෝපය දුරුකිරීමට අනුගමනය කළ යුතු ප්‍රතිපදාව කුමක් ද?

මෛත්‍රී සහගතව කටයුතු කිරීම, ඉවසීමේ ගුණය වර්ධනය කර ගැනීම

iv. මෙම පාඩමෙන් උගත හැකි ආදර්ශ 03ක් ලියන්න.

කළයුත්ත සුදුසු වේලාවේම සිදු කිරීම, අලස නොවීම, සියලු කටයුතු මනාව කළමනාකරණය කරගැනීම, උත්සාහය, විචක්ෂණශීලී වීම

v. නිලීනව (සැඟව) පවත්නා කෙළෙස් හඳුනාගත හැක්කේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

කෝප වූ විටෙක, අපේක්ෂා කළ දෑ නොලැබුණු විට, සන්තකයේ ඇති යම් වස්තුවක් අහිමි වූ විට

අභ්‍යාස

01. සිංහලට නගන්න.

i. සො කාලස්සෙව උට්ඨාය උපාහනා ඔමුඤ්චිත්වා දන්තකට්ඨං දාතබ්බං, ආසනං පඤ්ඤාපෙතබ්බං හොති.

ඔහු කලින්ම නැගිට පාවහන් ගලවා දත්කූර දිය යුතුය, ආසනය පැනවිය යුතු වෙයි.

ii. උපජ්ඣායස්ස පච්ඡාසමණෙන හොතබ්බං. නාතිදූරෙ ගන්තබ්බං, පත්තපරියාපන්නං පටිග්ගහෙතබ්බං හොති.

උපාධ්‍යායන් වහන්සේට පසුගමන් විය යුතුය. සමීපයෙන් යා යුතු ය. පාත්‍රයෙහි ඇති දෑ පිළිගත යුතු වෙයි.

iii. සචෙ උපජ්ඣායො ජන්තාඝරං පවිසිතුකාමො හොති චුණ්ණං සන්නෙන තබ්බං හොති.

ඉදින් උපාධ්‍යායන් වහන්සේ ගිනිහළගෙයට පිවිසීමට කැමැත්තේ වෙයි ද සුණු ගෙන දිය යුතු ය.

iv. පතිකුලෙ වසන්තියා නාම අන්තො අග්ගි බහි න නීහරිතබ්බො. බහි අග්ගි අන්තො න පවෙසෙතබ්බො.

පතිකුලයෙහි වසන්නී නම් ඇතුළත ගිනි පිටත නොදිය යුතු ය. පිටත ගිනි ඇතුළට නොගත යුතුය.

v. ඛජ්ජභොජ්ජලෙය්‍යපෙය්‍යවසෙන චතුබ්බිධා හොන්ති මනුස්සානං ආහාරා.

කෑම බීම ලෙවකෑම ලෙවබීම යැයි ආහාර වර්ග හතරක් මිනිසුන්ට වෙති.

02. පහත දැක්වෙන වාක්‍ය නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ යොදා දිගු කොට ලියන්න.

i. බාළකො ගාමං ගච්ඡති.

දක්ඛො බාලකො ගාමං සනිකං ගච්ඡති.

ii. වාණිජා භණ්ඩානි වික්කිණන්ති.

ඤාණවන්තා වාණිජා භණ්ඩානි සාධුකං වික්කිණන්ති.

iii. පුරිසො විහාරං ගච්ඡති.

සීලවන්තො පුරිසො විහාරං නිච්චං ගච්ඡති.

iv. කස්සකා ඛෙත්තං කසන්ති.

උස්සාහවන්තා කස්සකා ඛෙත්තං සුඛෙන කසන්ති.

v. මයං ධම්මං සුණාම.

පුඤ්ඤවන්තා මයං ධම්මං නිච්චං සුණාම

WWW.PIRIVENA.LK

03. පහත දැක්වෙන වාක්‍ය නිපාත හා උපසර්ග පද ද යොදා ගනිමින් දිගු කොට ලියන්න.

i. භික්ඛු පිණ්ඩාය පාවිසි.

සො භික්ඛු පිණ්ඩාය උපාවිසි.

ii. චොරා අසෙස චොරෙන්ති.

අථ චොරා අසෙස අනුබන්ධිත්වා චොරෙන්ති.

iii. දාරිකා විහාරං ගච්ඡති.

සා දාරිකා විහාරං ආගච්ඡති.

iv. භගවා ධම්මං දෙසෙසි.

සො භගවා සද්ධම්මං දෙසෙසි.

v. පුරිසා අසෙස කිණන්ති.

ඉමෙ පුරිසා නගරං ආගන්ත්වා අසෙස ච සකුණෙ ච කිණන්ති.

04. පහත දැක්වෙන වාක්‍ය තුමන්ත ක්‍රියා හා පූර්ව ක්‍රියා ද යොදමින් දිගු කොට ලියන්න.

i. මාතා භත්තං පචි.

මාතා භත්තං පචිතුං අග්ගිසාලං ගන්ත්වා භත්තං ච ව්‍යඤ්ජනඤ්ච පචි.

ii. පිතා නගරං ගච්ඡති.

පිතා වත්ථං කිණිතුං ගෙහම්හා නික්ඛම්ම නගරං ගච්ඡති.

iii. දාසා ගොණෙ හරන්ති.

දාසා ගොණෙ කිණිතුං අජෙ වික්කිණිත්වා ගෙහානි හරන්ති.

iv. බාලකො පොත්ථකං පඨති.

බාලකො වාචොදග්ගහිතුං පොත්ථකං හත්ථං ගහෙත්වා පඨති.

v. බාලිකා දාරුණි ආහරති.

බාලිකා දාරුණි සම්පාදෙතුං වනං ගන්ත්වා ආහරති.

WWW.PIRIVENA.LK

අටවැනි පාඩම

අභ්‍යාසය

01. 'බ්‍රහ්මාතිමාතාපිතරො' පාලි ඡේදය සිංහලට නගන්න.

අට්ඨමො පාඨො

බ්‍රහ්මාති මාතාපිතරො

සබ්‍රහ්මකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. සපුබ්බදෙවතානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. සපුබ්බාචරියකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. සාහුණෙය්‍යකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. බ්‍රහ්මාති භික්ඛවෙ මාතාපිතූනං එතං අධිවචනං. පුබ්බදෙවතාති භික්ඛවෙ මාතාපිතූනං එතං අධිවචනං. පුබ්බාචරියාති භික්ඛවෙ මාතාපිතූනං එතං අධිවචනං. ආහුණෙය්‍යාති භික්ඛවෙ මාතාපිතූනං එතං අධිවචනං. තං කිස්ස හෙතු? බහූපකාරා භික්ඛවෙ මාතාපිතරො පුත්තානං, ආපාදකා පොසකා ඉමස්ස ලොකස්ස දස්සෙතාරොති. එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති.

බ්‍රහ්මාති මාතාපිතරො - පුබ්බාචරියාති වුච්චරෙ
ආහුණෙය්‍යා ච පුත්තානං - පජාය අනුකම්පකා

තස්මා හි නෙ නමස්සෙය්‍ය - සක්කරෙය්‍යාථ පණ්ඩිතො
අන්නෙන අථ පානෙන - වත්ථෙන සයනෙන ච
උච්ඡාදනෙ නහාපනෙ - පාදානං ධොවනෙන ච

තාය නං පාරිචරියාය - මාතාපිතූසු පණ්ඩිතා
ඉධෙව නං පසංසන්ති - පෙච්ච සග්ගෙ ච මොදති.

(ඉතිවුත්තකපාළි)

බ්‍රහ්මාති මාතාපිතරො

මහණෙනි, යම් කුල පුත්‍ර කෙනෙකුන් විසින් මවුපිය දෙදෙන ස්වකීය ගෘහයෙහි පුදන ලද්දාහු වෙද්ද, ඒ කුලයෝ බ්‍රහ්මයා සහිතයෝ වෙති. මහණෙනි, යම් පුත්‍ර කෙනෙකුන් විසින් මව්පිය දෙදෙන ස්වකීය ගෘහයෙහි පුදන ලද්දාහු වෙද්ද, ඒ කුලයෝ පූර්ව දේවතාවන් සහිත වෙති. මහණෙනි, යම් පුත්‍ර කෙනෙකුන් විසින් මව්පිය දෙදෙන

WWW.PIRIVENA.LK

ස්වකීය ගෘහයෙහි පුදන ලද්දාහු වෙද්ද හ් කුලයෝ පූර්වාචාර්යයන් සහිතයෝ වෙති. මහණෙනි යම් පුත්‍ර කෙනෙකුන් විසින් මව්පිය දෙදෙන ස්වකීය ගෘහයෙම් පුදන ලද්දාහු වෙද්ද ඒ කුලයෝ පමුණුවා දන් දිය යුත්තන් සහිතයෝ (සාහුණෙය්‍ය) වෙති.

මහණෙනි බ්‍රහ්ම යන මෙය මවුපියන්ට නමකි. මහණෙනි පූර්වදේව යන මෙය මව්පියන්ට නමකි. මහණෙනි පූර්ව ආචාර්ය යන මෙය මව්පියන්ට නමකි. මහණෙනි ආහුණෙය්‍ය යන මෙය මව්පියන්ට නමකි. ඒ කවර හෙයින් ද යත්?

මහණෙනි මව්පිය දෙදෙන පුත්‍රයන්ට බොහෝ උපකාර ඇත්තෝ වෙති. ජීවිත අරක්ෂකයෝ වෙති. අත් පා වඩා පෝෂණය කරන්නෝ වෙති. මෙලොව ඉෂ්ට අනිෂ්ට අරමුණු දක්වන්නෝ වෙති.

මේ කරුණ භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි මේ අර්ථය මෙසේ කියනු ලැබේ. (ගාථා වශයෙන්)

1. පුත්‍ර ප්‍රජාවට අනුකම්පා කරන මව්පිය දෙදෙනා පුත්‍රයන්ට බ්‍රහ්මයෝ යැයි ද පූර්ව ආචාර්යවරයෝ යැයි ද දුරින් ගෙනවුත් දිය යුතු ආහාරයන්ට සුදුසු (ආහුණෙය්‍ය) යැයි ද කියනු ලැබෙති.

2. එහෙයින් නුවණැති පුද්ගල තෙමේ ඒ මව්පියන්ට නමස්කාර කරන්නේ ය. යළි ආහාරයෙන් පානයෙන් ද වස්ත්‍රයෙන් ද සයනයෙන් ද ඇඟ ඉලීමෙන් ද නැහැවීමෙන් ද පා දෙවීමෙන් ද සත්කාර කරන්නේ ය.

3. පණ්ඩිතයෝ මව්පියන් කෙරෙහි ඒ (අත්පා මෙහෙකිරීම් ආදි) උවටැන් කිරීම නිසා මෙලොව දී ඔහු පසසති. මරණින් මතු ස්වර්ගයෙහි ඉපිද අතිශයින් සතුටු වේ. යනුවෙනි.

WWW.PIRIVENA.LK

02. ඡේදය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. ඉමස්මිං සුත්තෙ කෙසං ගුණං පාකටං කරොති ?

ඉමස්මිං සුත්තෙ මාතාපිතුන්නං ගුණං පාකටං කරොති.

ii. කතමානි තානි ගුණානි ?

ආපාදකා, පොසකා, ඉමස්ස ලොකස්ස දස්සෙතාරො'ති තානි ගුණානි.

iii. පුත්තෙහි මාතාපිතුන්නං කිං කාතබ්බං ?

පුත්තෙහි මාතාපිතුන්නං නමස්සෙය්‍ය, සක්කාරෙය්‍ය, පරිචරෙය්‍යාදි කම්මානි කාතබ්බං.

iv. මාතාපෙත්තිභරං ජන්තු කානි ආනිසංසානි ලභති.

මාතාපෙත්තිභරං ජන්තු ඉධෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙ පමොදතී'ති ආනිසංසානි ලභති.

v. මාතාපිතුන්නං කානි අධිවචනානි භවන්ති ?

මාතාපිතුන්නං බ්‍රහ්ම, පුබ්බාචරිය, ආහුණෙය්‍යාදි අධිවචනානි භවන්ති.

3. ඡේදය කියවා පහත සඳහන් ප්‍රශ්නවලට සිංහලෙන් පිළිතුරු සපයන්න.

i. දෙමව්පියො හැඳින්වීමට යොදා ඇති පර්යාය පද 03ක් ලියන්න.

බ්‍රහ්ම, පූර්ව ආචාර්ය, ආහුණෙය්‍ය

ii. ආහුණෙය්‍ය ගුණය පහදන්න.

ආහුණෙය්‍ය ගුණය යනු වෙහෙස වී උපයාගන්නා ධනධාන්‍යවලින් දුර සිට වුවත් ගෙනැවිත් පිදීමට සුදුසු බවයි. ආහුණෙය්‍ය ගුණය භික්ෂූන් වහන්සේලා තුළ ඇති බව සඟගුණ පාඨයෙන් විද්‍යමාන වේ. දෙමාපියන් ද එකී ගුණයෙන් පරිපූර්ණ ය. දූදරුවන් වෙහෙස වී ලබා ගන්නා දැයින් පෝෂණය ලැබීමට දෙමාපියන් සුදුසු ය.

WWW.PIRIVENA.LK

iii. දෙමව්පියෝ දරුවන්ට දක්වන උපකාර මොනවා ද?

දරුවන් බිහි කිරීම, පෝෂණය කිරීම, ශිල්ප ලබා දීම, දායාද පැවරීම, පමා වූ විට රැකගැනීම, යහපතේ යෙදවීම, හොඳ නරක කියා දීම

iv. නුවණැති පුද්ගලයෝ මව්පියන්ට සිදු කරන යුතුකම් මොනවා ද?

දෙමාපියන්ට ගරුසත්කාර කිරීම, ඔවුන්ගේ දායාද ආරක්ෂා කිරීම, දෙමාපියන්ගේ සිත් නොරිදවීම, නෑවීම් කැවීම් පෙවීම් ආදිය ආදරගෞරවයෙන් කිරීම, කුලපරම්පරාව රැක ගැනීම.

v. මව්පිය දූදරු සම්බන්ධයේ වටිනාකම ඡේදය ඇසුරෙන් පහදන්න.

දෙමාපියන් දූදරුවන් අතර ඇත්තේ ඉතාමත් ළෙංගතු සම්බන්ධතාවකි. දරුවන්ගෙන් දෙමාපියන් හෝ දෙමාපියන්ගෙන් දරුවන් වෙන්කළ නොහැකිය. දෙමාපියන් තුළ දරුවන් පිළිබඳ පවතින්නේ වදනින් කිව නොහැකි තරම් වූ අසීමිත ආදරයකි. ඒ නිසා බිහි වූ දා පටන් ඔවුන් දරුවන්ගේ අනාගත දිවිය යහපත් කිරීම සඳහා නොයෙකුත් දෑ සිදුකරන බව නොකිව මනා ය. ළදරු කාලයේ දී යාම්, ඊම්, ඉඳුම්, හිටුම් ආදියත් විළි වසා ගැනීම ආදි දෑත් ක්‍රමානුකූලව හුරු කරන අතර සමාජයේ ජීවත් විය යුතු ආකාරය පෙන්වා හුරු කර දෙති. පාසල් අධ්‍යාපනයත් තෘතීක අධ්‍යාපනයත් ලබා දෙන දෙමාපියෝ තම දූපුතුන්ට සුදුසු කාලයේ ආවාහ විවාහ කටයුතු ද කර දෙති. තම පරම්පරාවෙන් හෝ තමා උපයා ගත් භෞතික වස්තු දරුවන් අතර බෙදා දෙති. දරුවන් සමාජයේ යහපත් ලෙස කීර්ති රාවයෙන් යුතුව ජීවත් වනු දැකීම දෙමාපියන්ගේ ඒකායන අපේක්ෂාවයි.

දෙමාපියෝ දරුවන් බිහි වූ දා සිට තමන් මියයන තෙක්ම දරුවන් ගැන සිතමින් කටයුතු කරති. ඔවුන්ගේ ලෙඩේ දී දුක්වෙති, සැපේ දී දරුවන්ට වඩා සතුටු වෙති.

දෙමාපියන් මෙසේ දරුවන් වෙනුවෙන් යුතුකම් ඉටු කළ විට දරුවන් ද දෙමාපියන් විෂයයෙහි යුතුකම් වගකීම් ඉටු කළ යුතු ය. එය ප්‍රත්‍යුපකාරයකි. දෙමාපියන් මහලුවියට පත් වූ විට මනා පෝෂණයක් ලබා දිය යුතුය. ඔවුන්ගේ සිත් සතුටු කළ යුතුය. ඉඳුම්හිටුම්, කෑම බීම ආදිය මෙන්ම සුවපහසු වටපිටාවක් සකස් කර දිය යුතු ය. බණභාවනා සඳහා යොමු

WWW.PIRIVENA.LK

කිරීම, දෙමාපියන්ගේ සිතැඟි අවබෝධ කරගෙන කටයුතු කිරීම ආදිය නිසා දෙමාපිය දූදරු සම්බන්ධතා දිනෙන් දින පෝෂණය වනු නො අනුමාන ය.

අභ්‍යාසය

01. උදාහරණය සැලකිල්ලට ගෙන පහත වගුව සම්පූර්ණ කරන්න.

නිපාත පදය	සිංහල අර්ථය	පාලි වාක්‍ය
ආවුසො	ඇවැත්නි	මා ආවුසො සොචිත්ථ
අමෙභා	පින්වත	අමෙභා පුරිස කිං තුය්හමිනා පාපකෙන දුජ්ජීවිතෙන
ජෙ	බොල	හෙ ජෙ කාළි කිං දිවාතරං උට්ඨාහි?
සෙය්‍යථීදං	ඒ කවරේ ද	සෙය්‍යථීදං, කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා
හි	වනාහි	න හි වෙරෙන වෙරානි
චෙ	ඉදින්	නො චෙ ධම්මං අනුස්සරෙය්‍යාථ
යදි	ඉදින්	යදිදං චත්තාරි පුරිසයුගානි

02. නිපාත පදවල අර්ථය ලියන්න.

අතිප්පගොබො	ඉතා උදෑසන
කුහිං	කොහි
මිච්ඡා	අසත්‍යය, බොරුව
මුධා	හිස්, නිකම්
සුවෙ	හෙට
හුරං	පරලොව
කීවචිරං	කොපමණකලක්

WWW.PIRIVENA.LK

කතිධා	කී අයුරකින්
කතික්ඛත්තුං	කී වරක්
තිරියං	හරහට

03. පූර්ව ක්‍රියා පද යොදා පහත වාක්‍ය තනි වාක්‍ය සේ ලියන්න.

උදාහරණ :- අහං විහාරං ගච්ඡාමි / අහං බුද්ධං වන්දාමි

අහං විහාරං ගන්ත්වා බුද්ධං වන්දාමි.

i. කුමාරෝ නගරං ගච්ඡති / සෝ ආපණා භණ්ඩානි කිණාති.

කුමාරෝ නගරං ගන්ත්වා ආපණා භණ්ඩානි කිණාති.

කුමාරයා නගරයට ගොස් කඩයෙන් බඩු මිළදී ගනියි.

ii. මාතා පුප්ඵං ඕචිනාති / සා බුද්ධං වන්දති.

මාතා පුප්ඵං ඕචිනිත්වා බුද්ධං වන්දති.

අම්මා මල් නෙළා බුදුන් වඳියි.

iii. දෙවෝ ධම්මං සුණාති / සෝ ආකාසෙන ගච්ඡති.

දෙවෝ ධම්මං සුණිත්වා ආකාසෙන ගච්ඡති.

දෙවියා ධර්මය අසා අහසින් යයි.

iv. මිගෝ සීහං පස්සති / සෝ වේගෙන ධාවති.

මිගෝ සීහං පස්සිත්වා වේගෙන ධාවති.

මුවා සිංහයා දැක වේගයෙන් දුවයි.

v. ථෙරා පිණ්ඩාය චරන්ති / තෙ විහාරං පවිසන්ති.

ථෙරා පිණ්ඩාය චරිත්වා විහාරං පවිසන්ති.

තෙරහු පිඬු පිණිස හැසිර විහාරයට පිවිසෙති.

WWW.PIRIVENA.LK

04. තුමන්ත ක්‍රියා පද යොදා පහත වාක්‍ය තනි වාක්‍ය සේ ලියන්න. අර්ථය ද ලියන්න.

උදාහරණ : අහං විහාරං ගච්ඡාමි / අහං බුද්ධං වන්දාමි

අහං බුද්ධං වන්දිතුං විහාරං ගච්ඡාමි.

i. සාමණේරො පරිවෙණං ගච්ඡති / සො තත්ථ පාලිභාසං උග්ගණ්හාති.

සාමණේරො පාලිභාසං උග්ගණ්හිතුං පරිවෙණං ගච්ඡති.

සාමණේරයන් වහන්සේ පාලි භාෂාව ඉගෙන ගැනීමට පිරිවෙණට යයි.

ii. පුරිසො පාතොව ධූමරථෙන නගරං ගච්ඡති / සො නගරෙ කම්මං කරොති.

පුරිසො නගරෙ කම්මං කත්තුං පාතොව ධූමරථෙන නගරං ගච්ඡති.

පුරුෂයා නගරයෙහි කර්මාන්ත කිරීමට උදේම දුම්රියෙන් නගරයට යයි.

iii. භික්ඛවො පණ්ණරසියං උපොසථාගාරං ගච්ඡන්ති / තෙ තත්ථ විනයං වාචෙන්ති.

භික්ඛවො විනයං වාචෙතුං පණ්ණරසියං උපොසථාගාරං ගච්ඡන්ති.

භික්ෂූන් වහන්සේලා විනය වාචනය කිරීමට පොහෝ දා පෝයගෙට යති.

iv. කම්මකාරා වෙසාඛෙ පාටිපදියං සන්නිපතන්ති / තෙ තෙසං කම්මකාරදිවසං සමනුස්සරන්ති.

කම්මකාරා කම්මකාරදිවසං සමනුස්සරතුං වෙසාඛෙ පාටිපදියං සන්නිපතන්ති.

කම්කරුවෝ කම්කරු දිනය සැමරීමට වෙසක් පළමු දා එක්රැස් වෙති.

05. පහත වාක්‍යයන්හි කළු අකුරින් මුද්‍රිත පදවල උපසර්ග වෙන් කර ලියන්න. සිංහලට පරිවර්තනය කරන්න.

WWW.PIRIVENA.LK

i. කෙවලකප්පං ගිජ්ඣකූටං <u>ඔභාසෙත්වා</u> යෙන භගවා තෙනුපසංකමිංසු. අව + භාසෙත්වා (අව+**භාස**+ත්වා)

ii. යෙභුය්‍යෙන බො පන භන්තෙ යක්ඛා <u>අප්පටිවිරතායෙව</u> පාණාතිපාතා. න + පටිවිරතායෙව (න+පටි+වි+**රමු**)

iii. තෙ යානෙ <u>අභිරුහිත්වා</u> සබ්බා දිසා අනුපරියන්ති. අභි + රුහිත්වා (අභි+**රුහ**+ ත්වා)

iv. <u>පච්චෙසන්තෙ</u> <u>පකාසෙන්ති</u> තතොලා තත්තලා තතොතලා. පති + එසන්තෙතා, ප+ කාසෙන්ති (පති + **එස**), (ප + **කාස**)

v. <u>නිපජ්ජ</u> පාදමූලම්හි තං ඨානං අභිපත්ථයිං. නි + පජ්ජ, (නි + **පද**)

❖ සිංහලට පරිවර්තනය කිරීම

i. සකල ගිජ්ඣකූටය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක ද එතැනට එළඹියාහු ය.

ii. ස්වාමීනි, යක්ෂයෝ බොහෝ සෙයින් පරපණ නැසීමෙන් නොවෙන්වූවාහු ම ය.

iii. ඔවුහු යානයෙහි නැගී සියලු දිශා වටකොට ඇවිදිති.

iv. වෙන් වෙන් වශයෙන් කරුණු පරීක්ෂා කරන්නා වූ තතෝලා නම් යක්ෂයෙකි, තත්තලා නම් යක්ෂයෙකි, තතෝතලා නම් යක්ෂයෙකි, හසුන් ප්‍රකාශ කරති.

v. පාදමූලයෙහි වැතිරී ඒ කාරණය ප්‍රාර්ථනා කළේ ය.

06. වගුව සම්පූර්ණ කරන්න.

ක්‍රියා පදය	අර්ථය	පූර්ව ක්‍රියාව	තුමන්ත ක්‍රියාව
ඔතරති	බසියි	ඔතරිත්වා	ඔතරිතුං
නිරුජ්ඣති	විනාශ වේ	නිරුජ්ඣිත්වා	නිරුජ්ඣිතුං
ආරුහති	නගියි	ආරුහිත්වා	ආරුහිතුං
නීහරති	නෙරපයි	නීහරිත්වා	නීහරිතුං

WWW.PIRIVENA.LK

අබ්භුග්ගච්ඡති	පැන නගී	අබ්භුග්ගන්ත්වා	අබ්භුග්ගන්තුං
උපසංකමති	එළඹෙයි	උපසංකමිත්වා	උපසංකමිතුං

07. පහත වාක්‍ය සිංහලට නගන්න.

i. අජ්ජ උපාසකා විහාරං ගන්ත්වා ධම්මං සුණන්තු.
අද උපාසකවරු විහාරයට ගොස් ධර්මට අසත්වා.

ii. මයං සුවෙ ගගනයානෙන ජම්බුදීපං ගච්ඡිස්සාම.
අපි හෙට අහස්යානයෙන් ඉන්දියාවට යන්නෙමු.

iii. හෙ මිත්ත, අජ්ජෙව සීලානි සමාදියාහි. අකුසලං පජහිත්වා කුසලං භාවෙහි.
පින්වත් මිතුර, අදම සිල් සමාදන් වෙහි. අකුසල් දුරුකොට කුසල් වඩහි.

iv. අහං ආහාරං පටියාදෙතුං ගෙහං පවිසාමි.
මම ආහාර පිළියෙළ කිරීමට නිවසට පිවිසෙමි.

v. යක්ඛිනී සහායිකාය වණ්ණනාගන්ත්වා ගෙහං පාවිසි.
යක්ෂණිය සහායිකාවගේ වර්ණය (වෙස්) ගෙන නිවසට පිවිසියා ය.

08. පහත වාක්‍ය පාලියට නගන්න.

i. අනේපිඬු සිටුතුමා දවසට දෙවරක් බුදුහිමියන් බලන්නට ජේතවනාරාමයට යයි.
අනාථපිණ්ඩික සෙට්ඨී දිවසං දුක්ඛත්තුං භගවා දස්සනාය/ පස්සිතුං ජෙතවනං ගච්ඡති.

ii. පින් කරන පුද්ගලයෝ නිතර නිතර පින් කරන්නට සිත යොමු කරති.
පුඤ්ඤවන්තා සතතං පුඤ්ඤානි කත්තුං චින්තෙන්ති.

iii. මහා ප්‍රජාපතී ගෝතමිය පැවිදි වීමට බුදුහිමියන්ගෙන් අවසර ඉල්ලුවා ය.
මහා පජාපතී ගොතමී පබ්බජිතුං බුද්ධමහා ඔකාසං යාචි.

WWW.PIRIVENA.LK

iv. පිරිවෙන් ශිෂ්‍යයෝ සැමදා පිරිවෙනට ගොස් පාලි භාෂාව ඉගෙනීමට සිතා ගත්හ.

පාරිවෙණික සිස්සා සදා පරිවෙණං ගන්ත්වා පාලිභාසං උග්ගණ්හිතුං චින්තෙසුං/ චින්තයිංසු.

v. නැණවත් බුද්ධිමත් දරුවෝ නිතර බුදුන් වඳින්නට වෙහෙරට යත්.

ඤාණවන්තා බුද්ධිමන්තා දාරකා නිච්චං බුද්ධං වන්දිතුං විහාරං ගච්ඡන්ති.

09. දී ඇති නිපාත පද සුදුසු තැන්හි යොදා පහත වාක්‍ය පාලියට නගන්න.

(ආවි වා රහො වා, අද්ධා, අබ්භුමෙම, කිං, ජෙ, දීඝරත්තං)

i. එම්බල කාළිය කුමක් හෙයින් දවල් වී නැගිට්ටා ද?

හෙ ජෙ කාලි කස්මා දිවාතරං උට්ඨාසි?

ii. එළිපිට හෝ රහසින් හෝ පව් නොකළ යුතු ය.

ආවි වා රහො වා පාපානි න කත්තබ්බං.

iii. මෙය මට දීර්ඝ කාලයක් අහිත පිණිස පවතියි.

ඉදං මෙ දීඝරත්තං අහිතත්ථාය හොති.

iv. ඒකාන්තයෙන් මේ ප්‍රතිපත්තිය නිවන් පිණිස ම පවතී.

අද්ධා ඉදං පතිපත්තිං නිබ්බාණත්ථාය සංවත්තති.

v. හපොයි අම්මේ මේ කුමන විපත්තියක් ද?
අබ්භුමෙම ඉදං කිං විපත්තිං ?

10. පහත ආඛ්‍යාත පදයන්ගෙන් නිපදවෙන පූර්ව ක්‍රියාපද හා තුමන්ත ක්‍රියා පද දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

කරොති	කත්වා	කත්වාන	කාතුන	කාතුං	කාතවෙ
භුඤ්ජති	භුඤ්ජිත්වා	භුඤ්ජිත්වාන	භුඤ්ජිතුන	භුඤ්ජිතුං	-
සයති	සයිත්වා	සයිත්වාන	සයිතුන	සයිතුං	-
වන්දති	වන්දිත්වා	වන්දිත්වාන	වන්දිතුන	වන්දිතුං	-
චරති	චරිත්වා	චරිත්වාන	චරිතුන	චරිතුං	-

ධාවති	ධාවිත්වා	ධාවිත්වාන	ධාවිතුන	ධාවිතුං	-

WWW.PIRIVENA.LK

නවවැනි පාඩම

අභ්‍යාසය

01. 'කස්මා ලිච්ඡවී'ති වදන්ති' ඡේදය සිංහලට නගන්න.

නවමො පාඨො

කස්මා ලිච්ඡවීති වදන්ති?

තෙන ච සමයෙන අඤ්ඤතරො තාපසො ගොපාලකුලං නිස්සාය ගඞ්ගාතීරෙ විහරති. සො පාතොව ගඞ්ගං ඔතරන්තො භාජනං ආගච්ඡන්තං දිස්වා පංසුකූලසඤ්ඤාය අග්ගහෙසි. තතො තත්ථ තං අක්ඛරපට්ටකං රාජමුද්දිකාලඤ්ඡනඤ්ච දිස්වා මුඤ්චිත්වා තං මංසපෙසිං අද්දස. දිස්වානස්ස එතදහොසි. 'සියා ගබ්භො. තථා හිස්ස දුග්ගන්ධපූතිභාවො නත්ථී'ති. තං අස්සමං නෙත්වා සුද්ධෙ ඔකාසෙ ඨපෙසි. අථ අඩ්ඪමාසච්චයෙන ද්වෙ මංසපෙසියො අහෙසුං. තාපසො දිස්වා සාධුතරං ඨපෙසි. තතො පුන අඩ්ඪමාසච්චයෙන එකමෙකිස්සා පෙසියා හත්ථපාදසීසානමත්ථාය පඤ්ච පඤ්ච පීළකා උට්ඨහිංසු. තාපසො දිස්වා පුන සාධුතරං ඨපෙසි. අථ අඩ්ඪමාසච්චයෙන එකා මංසපෙසි සුවණ්ණබිම්බසදිසො දාරකො. එකා දාරිකා අහොසි. තෙසු තාපසස්ස පුත්තසිනෙහො උප්පජ්ජි. අඞ්ගුට්ඨකතො චස්ස ඛීරං නිබ්බත්ති. තතොප්පභුති ච ඛීරභත්තං ලභති. සො භත්තං භුඤ්ජිත්වා ඛීරං දාරකානං මුඛෙ ආසිඤ්චති. තෙසං යං යං උදරං පවිට්ඨං, තං සබ්බං මණිභාජනගතං විය දිස්සති. එවං ලිච්ඡවී අහෙසුං. එවං තෙ නිච්ඡවිතාය ලිච්ඡවීති පඤ්ඤායිංසු.

(ඛුද්දකපාඨට්ඨකථා)

කස්මා ලිච්ඡවීති වදන්ති

එකල්හි එක්තරා තාපසයෙක් ගොපලු කුලයක් ඇසුරු කොට ගං තෙර වාසය කරයි. ඔහු උදෑසනම ගඟට බැස්සේ ඒ භාජනය ගසාගෙන එනු දැක පාංශුකූල සංඥාවෙන් හෙවත් අයිතිකරුවෙකු නැතැයි යන හැඟීමෙන් ගත්තේ ය. ඉක්බිති එහි අක්ෂර පත්‍රිකාවත් රාජ මුද්‍රිකා ලාංඡනයත් දැක විවෘත කොට එහි ඇති මස් වැදැල්ල දැක්කේ ය. දැක ඔහුට මෙසේ සිත් විය. ''දරු ගැබක් විය යුතුය. එසේ වුවත් මෙහි දුගඳක් හෝ කුණු වූ බවක් හෝ නොමැත.'' යනුවෙනි. අසපුවට ගෙන ගොස් පිරිසිදු තැනක තැබී ය. ඉක්බිති අඩමසක් ඇවෑමෙන් එක් එක් වැදැල්ලක අත්පා හිස සඳහා බිබිලි පහ බැගින් පැන නැංගේ ය. ඉක්බිති තවත් අඩමසක් ඇවෑමෙන් එක් මස්

WWW.PIRIVENA.LK

වැදැල්ලක රන් පිළිමයක් හා සමාන දරුවෙක් විය. අනෙක දැරියක් වූවා ය. ඔවුන් කෙරෙහි තාපසයාට දරු සෙනෙහස පහළ විය. ඔහුගේ ඇඟිල්ලෙන් කිරි එරුණි. එතැන් පටන් කිරි හා බත් ලබයි ද ඔහු බත් අනුභව කොට කිරි දරුවන්ට පොවයි. ඒ දරුවන්ගේ උදරයට යමක් යමක් පිවිසෙන්නේ වේ ද ඒ සියල්ල මැණික් බඳුනක දැමූවක් සේ පෙනෙන්නේ ය. මෙසේ ඡවි හෙවත් උඩසම නැත යන අර්ථයෙන් නිච්ඡවි වූහ. සමහරු මෙසේ කීහ. මසා තැබුවාක් මෙන් ඔවුනොවුන්ගේ සම අප්‍රකට විය. මෙසේ ඔවුහු සමෙන් තොර වූ නිසා හෝ අප්‍රකට සම ඇති බැවින් හෝ 'ලිච්ඡවි' යයි ප්‍රකට වූහ යනුවෙනි.

02. පහත දැක්වෙන ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. තාපසො කුහිං වසති ?
තාපසො ගොපාල කුලං නිස්සාය ගංගාතීරෙ වසති.

ii. තාපසො අක්ඛරපට්ටකං රාජමුද්දිකලඤ්ඡනං ච දිස්වා කිං චින්තෙසි ?
තාපසො අක්ඛරපට්ටකං රාජමුද්දිකලඤ්ඡනං ච දිස්වා 'සියා ගබ්භො තථා හිස්ස දුග්ගන්ධ පූතිභාවො නත්ථී'ති චින්තෙසි

iii. කස්මා මංසපෙසියා පඤ්ච පඤ්ච පීළකා උට්ඨහිංසු ?
හත්ථපාදසීසානමත්ථාය මංසපෙසියා පඤ්ච පඤ්ච පීළකා උට්ඨහිංසු.

iv. දාරිකං ච දාරකං ච දිස්වා තාපසො කිං අකාසි ?
දාරිකං ච දාරකං ච දිස්වා තාපසො භත්තං භුඤ්ජිත්වා ඛීරං මුඛෙ ආසිඤ්චති.

v. කස්මා ලිච්ඡවීනං ඉමං නාම අහෙසුං ?
තෙ නිච්ඡවිතාය ලිච්ඡවීනං ඉමං නාම අහෙසුං.

03. පිළිතුරු සපයන්න.

i. තාපස දිනචරියාවේ ඇති මූලික ලක්ෂණයක් ලියන්න.
දිනපතා උදෑසන ගඟට බැසීම

WWW.PIRIVENA.LK

ii. රාජ්‍යමුද්‍රා තැබීමෙහි ගූඪාර්ථය (සැඟවුණු අර්ථය) කුමක් ද?

එය රාජ්‍යයට අයත් දෙයක් බව ප්‍රකට කිරීම

iii. තවුස් දිවියේ අල්පේච්ඡත්වය ප්‍රකට වන කරුණු දෙකක් දක්වන්න.

බඩුභාණ්ඩවලින් තොර බව, ගෝපාල කුලයක් නිසා ගං ඉවුරෙහි විසීම

iv. දරු සෙනෙහස පිළිබඳ බුදුරදුන්ගේ ඉගැන්වීම කෙබඳු ද?

දෙමාපියන්ගේ වටිනාම සම්පත වන්නේ දරුවන් ය. එබැවින් දෙමාපියන් තුළ දරුවන් කෙරෙහි වූ හැඟීම සුද්ධෝදන රජතුම රාහුල කුමරු පැවිදි කිරීමේ සිදුවීමෙන් පසු පෙන්වා දුන්නේ ය.

දරු සෙනෙහස නිසා පටාචාරාවගේ සිත විකල් වීම, කිසාගෝතමියගේ සිත විකල් වීම ආදිය බුදුරදුන් ජීවමාන සමයේ සිදුවූ දෑ ය. එසේම කාලි යක්ඛණීගේ කතාපුවතේ දීත් දරුවෙකු පිළිබඳ කියවේ.

ගෘහ ජීවිතයේ දී දරුවා දෙමාපියන්ට මහඟු සම්පතකි. ඒ නිසා දෙමාපියන් දරුවන් වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් රැසක් සිගාලෝවාද සූත්‍රයේ දක්වා ඇත. එහෙත් නිර්වාණගාමී මාවතට පිවිසෙන්නෙකුට දරුවා යනු බැඳීමකි. තවතවත් සසරේ සිර කිරීමකි. රාහුලො ජාතො බන්ධනං ජාතං යනුවෙන් සිද්ධාර්ථ රජු ප්‍රකාශ කළේ එයයි.

v. ලිච්ඡවීන්ගේ රාජ්‍ය පාලන ක්‍රමයේ පැවති සුවිශේෂත්වය කුමක් ද?

සප්ත අපරිහානීය ධර්ම ආරක්ෂා කිරීම

අභ්‍යාසය

01. සිංහලට නගන්න.

i. ආචරියො සිසෙස 'සන්ධි' නාම පාඨං පාඨයති.

ගුරුවරයා සිසුන්ට 'සන්ධි' නම් පාඩම උගන්වයි.

ii. පුත්තාමත්ථි ධනමම්ත්ථි ඉති බාලො විහඤ්ඤති.

මට පුතුන් ඇත මට ධනය ඇත යනුවෙන් බාලයා වෙහෙසෙයි.

WWW.PIRIVENA.LK

iii. මයං සබ්බෙව ධම්මං සුත්වා තං සාධුකං මනසිකරොම.

අපි සියල්ලෝම ධර්මය අසා එය මනා සේ සිහිකරමු.

iv. දාරකා පුප්ඵානොචිනිතුං වනං ගන්ත්වා සෙතානි'පි නීලානි'පි පුප්ඵානාහරිංසු.

දරුවෝ මල් නෙලීමට වනයට ගොස් සුදුත් නිලුත් මල් ගෙනාවෝ ය.

v. උග්ගණ්හිතුකාමා භික්ඛූ පාතොවුට්ඨාය බාලාවතාරඤ්ච නිසණ්ඩුඤ්ච වාචෙන්ති.

ඉගෙන ගැනීමට කැමති භික්ෂූන් වහන්සේලා උදෙන්ම නැගිට බාලාවතාරය ද නිසණ්ඩුව ද වාචනා කරති.

02. සන්ධි කළ හැකි තැන් සන්ධි කොට පාලියට නගන්න.

i. දේවතාවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනක ද එතැනට එළඹියේ ය.

දෙවතා යෙන භගවා තෙනුපසඞ්කමි.

ii. මහණෙනි පෙර මේ සැවැත් නුවර ම වේදේහිකා නම් ගෘහපතිනියක් වූවා ය.

භූතපුබ්බං භික්ඛවෙ ඉමිස්සායෙව සාවත්ථියා වෙදෙහිකා නාම ගහපතානි අහොසි.

iii. අපි ද පැවිදි වන්නෙමු'යි යන සිතිවිල්ල යසකුල පුත්‍රයාට ද ඔහුගේ යහළුවන්ට ද ඇති විය.

මයඤ්ච පබ්බජිස්සාමාති චෙතනා යසකුලපුත්තඤ්ච තස්ස සහායකානඤ්ච අහොසි.

iv. අනේපිඬු සිටුතුමා ද විශාඛා මහා උපාසිකාව ද නිතර තථාගතයන් වහන්සේට උපස්ථානයට යති.

අනාථපිණ්ඩික සෙට්ඨි ච විසාඛා මහොපාසිකා ච නිච්චං තථාගතුපට්ඨානං ගච්ඡන්ති.

v. පෙර රජවරු සතුරන් නසා ලක්දිව එක්සේසත් කළහ.

පුබ්බෙ රාජානො අරයෙ හන්ත්වා ලංකාදීපං එකච්ඡත්තං කාරෙසුං / කාරයිංසු.

WWW.PIRIVENA.LK

03. පහත දැක්වෙන විසන්ධි පද සූත්‍රානුසාරයෙන් සන්ධි කරන්න.

i. ධනමෙම + අත්ථි - ධනමමත්ථි (සරා සරෙ ලොපං)

ii. සබ්බෙ + එව - සබ්බෙව (සරා සරෙ ලොපං)

iii. ඉති + ආදි - ඉත්‍යාදි/ ඉච්චාදි (ඉවණ්ණො යං නවා/ පරද්වෙභාවො ඨානෙ)

iv. දෙව + ඉති - දෙවාති (පුබ්බො ච)

v. බුද්ධානං + එව - බුද්ධානමෙව (මදාසරෙ)

vi. පරි + අන්තං - පරියන්තං (යවමදනතරළාචාගමා)

vii. චක්කං + ඉව - චක්කංව (වා පරො අසරූපා)

viii. ගච්ඡාමි + ඉති - ගච්ඡාමීති (දීඝං)

ix. පාතු + අහොසි - පාතුරහොසි (යවමදනතරළාචාගමා)

x. කිඤ්චි + එව - කිඤ්චිදෙව (යවමදනතරළාචාගමා)

xi. කසා + ඉව - කසාමිව (යවමදනතරළාචාගමා)

xii. ප + උච්චති - පවුච්චති (යවමදනතරළාචාගමා)

xiii. පති + එති - පත්‍යෙති/ පච්චෙති (ඉවණ්ණො යං නවා/ පරද්වෙභාවො ඨානෙ)

xiv. මධු + උදකං - මධූදකං (දීඝං)

xv. අ + කමති - අක්කමති (පරද්වෙභාවො ඨානෙ)

xvi. සං + ලෙඛ - සල්ලෙඛ (වග්ගන්තං වා වග්ගෙ)

xvii. යං + අනිච්චං - යදනිච්චං (මදාසරෙ)

xviii. චක්ඛු + උදපාදි - චක්ඛුංඋදපාදි (නිග්ගහීතඤ්ච)

xix. පඤ්ච + ඛන්ධා - පඤ්චක්ඛන්ධා (වග්ගෙ ඝොසාඝොසානං තතිය පඨමා)

xx. තං + ජාතං - තඤ්ජාතං (වග්ගන්තං වා වග්ගෙ)

04.'කස්මා ලිච්ඡවීති වදන්ති' යන ඡේදයේ සන්ධි පද උද්ධෘත කොට විසන්ධිය සමග අදාළ සූත්‍රය දක්වන්න.

උද්ධෘත පදය	විසන්ධිය	අදාළ සූත්‍රය

WWW.PIRIVENA.LK

උදා :- පාතොව	පාතො + එව	වා පරො අසරූපා
දිසවානසස	දිසවාන + අසස	සරා සරෙ ලොපං
එතදහොසි	එතං + අහොසි	මදාසරෙ
අඩඪමාසචචයෙන	අඩඪමාස + අචචයෙන	සරා සරෙ ලොපං
සීසානමතථාය	සීසානං + අතථාය	මදාසරෙ
තතොපපභූති	තතො + පභූති	පරදෙව භාවො ඨානෙ

WWW.PIRIVENA.LK

දසවැනි පාඩම

අභ්‍යාසය

'සබ්බං කිර පහාය ගන්තබ්බං' ඡේදය සිංහලට නගන්න.

දසමො පාඨො

සබ්බං කිර පහාය ගන්තබ්බං

සෙතව්‍යවාසිනො හි චූළකාලො මජ්ඣිමකාලො මහාකාලොති තයො භාතරො කුටුම්බිකා. තෙසු ජෙට්ඨකනිට්ඨා දිසාසු විචරිත්වා සකටෙහි භණ්ඩං ආහරන්ති. මජ්ඣිමකාලො ආහතං වික්කිණාති. අථෙකස්මිං සමයෙ තෙ උභොපි භාතරො පඤ්චහි සකටසතෙහි නානා භණ්ඩං ගහෙත්වා සාවත්ථිං ගන්ත්වා සාවත්ථියා ච ජෙතවනස්ස ච අන්තරෙ සකටානි මොචයිංසු. තෙසු මහාකාලො සායණ්හසමයං මාලාගන්ධාදිහත්ථෙ සාවත්ථිවාසිනො අරියසාවකෙ ධම්මසවණත්ථාය ගච්ඡන්තෙ දිස්වා "කුහිං ඉමෙ ගච්ඡන්තී"ති පුච්ඡිත්වා තමත්ථං සුත්වා 'අහම්පි ගමිස්සාමී'ති චින්තෙත්වා කනිට්ඨං ආමන්තෙත්වා, "තාත සකටෙසු අප්පමත්තො හොහි. අහං ධම්මං සොතුං ගච්ඡාමී"ති වත්වා තථාගතං වන්දිත්වා පරිසපරියන්තෙ නිසීදි. සත්ථා තං දිස්වා අජ්ඣාසයවසෙන ආනුපුබ්බීකථං කථෙන්තො දුක්ඛක්ඛන්ධසුත්තාදිවසෙන අනෙකපරියායෙන කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං ච කථෙසි. තං සුත්වා මහාකාලො සබ්බං කිර පහාය ගන්තබ්බං, පරලොකං ගච්ඡන්තං නෙව භොගා න ඤාතයො අනුගච්ඡන්ති. කිං මෙ ඝරාවාසෙන, පබ්බජිස්සාමීති චින්තෙසි.

(චූළකාලමහාකාලවත්ථු - ධම්මපදට්ඨකථා)

සබ්බං කිර පහාය ගන්තබ්බං

සෙතව්‍ය නගරවාසී චූළකාල මජ්ඣිම කාල මහාකාල යයි කෙළෙඹි පුත්‍රයෝ තිදෙනෙක් විසූහ. එයින් වැඩිමහලු බාල දෙදෙන ඒ ඒ දිනවල ගොස් ගැල්වලින් බඩු ආනයනය කරති. මජ්ඣිමකාල ගෙනා බඩු විකුණයි. පසුකලක මේ සහෝදරයන් දෙදෙනා ගැල් පන්සියයක නොයෙක් බඩු පටවාගෙන සැවැත්නුවරට ගොස් සැවැත්නුවරත් ජේතවනාරාමයත් අතර ගැල් මිදුවාහු ය. ඔවුන්ගෙන් මහාකාල සවස් වරුවෙහි සුවඳ මල් ආදිය රැගෙන බණ අසනු පිණිස යන සැවැත්නුවර වාසී ආර්ය ශ්‍රාවකයන් දැක මේ අය කොහේ යන්නහු දැයි අසා දැන ගෙන තමනුත් යා යුතු යැයි සිතා බාල සොහොයුරාට කතා කොට, දරුව ගැල් පිළිබඳ සැලකිලිමත් වන්න. මම බණ

WWW.PIRIVENA.LK

ඇසීමට යන්නෙහි, යි කියා ගොස් බුදුන් වැඳ පිරිස් කෙළවර හුන්නේ ය.

බුදුරජාණන් වහන්සේ ඔහු දැක ඔහුට ගැළපෙන පරිදි පිළිවෙළ කතාව දේශනා කරමින් දුක්ඛක්ඛන්ධ ආදි නොයෙක් ආකාරයෙන් කාමයන්ගේ දෝෂ ද ලාමක බව ද කිළුටු සහිත බව ද ප්‍රකාශ කළහ. ඒ අසා සිටි මහාකාල තෙමේ. සියල්ල හැරදමා යා යුතුය. පරලොව යන්නෙකු සමග වස්තු ද නෑයෝ ද පිටුපසින් නො එත්. මේ ගෘහවාසයෙන් මට වැඩක් නැත. පැවිදි වන්නෙමි'යි සිතුවේ ය.

02. ඡේදය ඇසුරෙන් පාලියෙන් පිළිතුරු සපයන්න.

i. තයො භාතරා කත්ථ වසිංසු ?
තයො භාතරා සෙතව්‍ය නගරෙ වසිංසු.

ii. කෙ භණ්ඩානි ආහරන්ති ?
ජෙට්ඨකණිට්ඨා භණ්ඩානි ආහරන්ති.

iii. කො භණ්ඩානි වික්කිණාති ?
මජ්ඣිමකාලො භණ්ඩානි වික්කිණාති.

iv. මහාකාලො ධම්මං සොතුං කත්ථ නිසීදි ?
මහාකාලො ධම්මං සොතුං පරිසපරියන්තෙ නිසීදි.

v. ධම්මං සොතුං ගච්ඡන්තා කස්මිං සමයෙ ගච්ඡන්ති ?
ධම්මං සොතුං ගච්ඡන්තා සායණ්හ සමයෙ ගච්ඡන්ති.

vi. මහාකාලො කිං නිස්සාය පබ්බජිතුං චින්තෙසි ?
මහාකාලො සබ්බං කර පහාය ගන්තබ්බං නිස්සාය පබ්බජිතුං චින්තෙසි.

03. ඡේදයේ එන වාක්‍ය රටාව අනුව පහත වාක්‍යය පාලියට නගන්න.

i. අපගේ පිරිවෙණෙහි ධම්මජෝති, සුමනජෝති, විමලජෝති යනුවෙන් යහළු සාමණේරවරු තිදෙනෙක් වෙති.

WWW.PIRIVENA.LK

අම්හාකං පරිවෙණෙ ධම්මජොති, සුමනජොති, විමලජොතී'ති තයො සාමණෙරා භවන්ති.

ii. ඔවුන් අතුරින් විමලජෝති සාමණේර තෙම උදෑසන පිණ්ඩපාතය පිණිස යයි.

තෙසු විමලජොති සාමණෙරො පාතො පිණ්ඩාය ගච්ඡති.

iii. ධම්මජෝති, සුමනජෝති සාමණේරවරු දහවල් පිණ්ඩපාතය පිණිස යයි.

ධම්මජොති, සුමනජොති සාමණෙරා දිවා පිණ්ඩාය ගච්ඡන්ති.

iv. සවස් කාලයේ තිදෙනා ම පිරිවෙණට ගොස් පාලි භාෂාව උගනිති.

සායණ්හ තයොපි පරිවෙණං ගන්ත්වා පාලිභාසං උග්ගණ්හන්ති.

v. ගුරුවරයා ඔවුන්ගේ අදහස්වලට ගැළපෙන ලෙස පාඩම උගන්වයි.

ආචරියො තෙසං අජ්ඣාසවසෙන පාඨං උග්ගණ්හාපෙති.

04. ඡේදය ඇසුරින් සිංහලෙන් පිළිතුරු සපයන්න.

i. පෙර සැවැත්නුවර වැසියෝ සවස් කාලයෙහි කුමක් කළාහු ද?

සුවඳ මල් රැගෙන බුදුරදුන් හමුවට ගොස් ධර්මය ශ්‍රවණය කළහ.

ii. අතීතයෙහි පැවති වෙළඳාම පිළිබඳ ඡේදයේ එන තොරතුරු මොනවාද ?

ගැල්වලින් භාණ්ඩ පුරවා ගෙන දේශදේශාන්තරයේ යෑම.

iii. පරලොව යන්නෝ ගෙන නොයන දේ මොනවා ද?

වස්තු, ඤාතීන්

iv. අනුපිළිවෙළ කථාව යනු කුමක් ද?

ධර්මදේශනාවක කතා පිළිවෙළයි. දානකථා, සීලකථා, සග්ගකථා, කාමයන්ගේ ආදීනව, ළාමක බව ආදිය

v. සැදැහැ සිත් ඇති වන හේතු දෙකක් ඡේදය ඇසුරින් පෙන්වා දෙන්න.

WWW.PIRIVENA.LK

සවස මල් රැගෙන යන්නවුන්ගෙන් කොහිදැයි යන්නේ ඇසීම.

ධර්මය ඇසීමට යාම.

පැවිදි වීමට සිත පහළ වීම.

අභ්‍යාසය

01. වරහන් තුළ ඇති සමාස පද යොදමින් පහත සඳහන් වාක්‍යය පාලියට නගන්න.

(ගෙහද්වාරානි, අප්පමත්තො, දක්ඛිණදෙසං, රථසතෙහි, නගරවාසී, පුරෙභත්තං, සායණ්හසමයෙ, උපොසථදිවසෙ, මාලාපදීපානි, මහාවීථියා)

i. රථය කොළඹත් කැලණියත් අතර මහපාරේ නතර විය.

රථං අන්තරා ච කොළම්බං අන්තරා ච කල්‍යාණිං ච <u>මහාවීථියා</u> නිවත්ති.

ii. මව ගෙවල් දොරවල් ගැන සැලකිලිමත් වන්න යයි දියණියට කියා බණ අසන්නට ගියා ය.

මාතා <u>ගෙහද්වාරානි</u> ආරබ්භ <u>අප්පමත්තො</u>ති දුහිතාරං කථෙත්වා ධම්මං සොතුං ගච්ඡි.

iii. මන්ත්‍රීතුමා වාහන සියයකින් දකුණු ප්‍රදේශයට ගියේ ය.

මන්තී <u>රථසතෙහි</u> <u>දක්ඛිණදෙසං</u> අගච්ඡි.

iv. නගරවාසීන් අතුරෙන් ඇතැමෙක් උදෑසන දන් දී සවස් කාලයේ බණ අසති.

<u>නගරවාසීසු</u> අඤ්ඤතරො <u>පුරෙභත්තං</u> දත්වා <u>සායණ්හ සමයෙ</u> ධම්මං සුණන්ති.

v. අපි පසළොස්වක පොහොය දා මල් පහන් පිදීමට පන්සලට යමු.

මයං <u>උපොසථදිවසෙ</u> <u>මාලාපදීපානි</u> පූජෙතුං පණ්ණසාලං ගච්ඡාම.

02. පහත සඳහන් අසමස්ත පද සමාස කර ලියන්න.

WWW.PIRIVENA.LK

i. ජෙට්ඨො ච කනිට්ඨො ච - ජෙට්ඨකනිට්ඨා
ii. රඤ්ඤො ධීතා - රාජධීතා
iii. රාහුලො කුමාරො - රාහුලකුමාරො
iv. මාතා ච පිතා ච - මාතාපිතරො
v. තිස්සො විජ්ජා - තෙවිජ්ජා
vi. සතං යොජනානි - යොජනසතානි
vii. චන්දො ච සුරියො ච - චන්දසුරියා
viii. විධුරො පණ්ඩිතො - විධුරපණ්ඩිතො
ix. වාතස්ස පටි - පටිවාතං
x. කම්මං යථා - යථාකම්මං
xi. අස්සානං වාණිජා - අස්සවාණිජා
xii. ධම්මස්ස දෙසනා - ධම්මදෙසනා

03. වරහන් තුළින් සුදුසු වචන යොදා වාක්‍ය සම්පූර්ණ කර සිංහලට නගන්න.

(නදීසතෙහි, සතතාහං, මහාවනෙ, නරාදිච්චං, භික්ඛුනීනිලයා, දෙවනාගාසුරා)

i. නරසාරථී වෙසාලියං <u>මහාවනෙ</u> කූටාගාරසාලායං වසති.

   බුදුරජාණන් වහන්සේ විශාලාවෙහි මහාවනයේ කූටාගාරශාලාවෙහි වාසය කරයි.

ii. සා ගොතමී සබ්බාහි භික්ඛුනීහි <u>භික්ඛුනීනිලයා</u> ජෙතවනං අගමාසි.

   ඒ ගෝතමී සියලු භික්ෂුණීන් සමග භික්ෂුණී අරමින් ජේතවනයට ගියා ය.

iii. පඤ්චගඞ්ගායො <u>නදීසතෙහි</u> භූමිං අලඞ්කරොන්තී සාගරං යන්ති.

   ගංගාවෝ පහක් නදී සියයකින් භූමිය අලංකාර කරමින් සාගරයට යති.

iv. අහං ආදිච්චකුලකෙතුකං <u>නරාදිච්චං</u> සිරසා පණමාමි.

WWW.PIRIVENA.LK

මම සූර්යවංශයට කොඩියක් බඳු වූ බුදුරජාණන් වහන්සේ හිසින් වඳිමි.

v. තෙ සඝස්සස නරනායකස්ස <u>සත්තාහං</u> මහාදානං අදංසු.

ඔවුහු සංඝයා සහිත බුදුරජාණන් වහන්සේට දින හතක් මහදන් දුන්හ.

vi. <u>දෙවනාගාසුරා</u> පුප්ඵවුට්ඨිං ගගනා අභිවස්සාපෙසුං.

දේවියෝ ද නාගයෝ ද අසුරයෝ ආදීහු මල් වැසි අහසින් වැස්සූහ.

04. පහත වගුව සම්පූර්ණ කරන්න.

සමාස පදය	සමාස නාමය	අසමස්ත පදය
නිද : චූලකාලො	කම්මධාරය සමාසය	චූළො සො කාලො
පුරාණදුතියිකා	කම්මධාරය සමාසය	පුරාණ දුතියිකා
රුක්ඛමූලෙ	තප්පුරිස සමාසය	රුක්ඛස්ස මූලෙ
බුද්දපුත්තා	කම්මධාරය සමාසය	බුද්දා තෙ පුත්තා
දහරමාණවිකා	කම්මධාරය සමාසය	දහරී සා මාණවිකා
බ්‍රහ්මචරියං	කම්මධාරය සමාසය	බ්‍රහ්ම චරියං
මෙරුරාජා	කම්මධාරය සමාසය	මෙරු රාජා
සත්ථුසාසනං	තප්පුරිස සමාසය	සත්ථුනො සාසනං
බුද්ධමාතා	තප්පුරිස සමාසය	බුද්ධස්ස මාතා
යථාබලං	අව්‍යයීභාව සමාසය	බලස්ස යථා
යථාසත්ති	අව්‍යයීභාව සමාසය	සත්ති යථා
දෙවමනුජා	ද්වන්ද සමාසය	දෙවො ච මනුජා ච
මෙඝදුන්දුභි	කම්මධාරය සමාසය	මෙඝො සො දුන්දුභි
මහාමුනි	කම්මධාරය සමාසය	මහන්තො සො මුනි

WWW.PIRIVENA.LK

ආයතපණ්හි	කම්මධාරය සමාසය	ආයත පණ්හි
නරුත්තමො	කම්මධාරය සමාසය	නර උත්තමො

05. පහත දැක්වෙන ගර්භ සමාසයන්හි ඇති සමාස වර්ග වෙන් කර දක්වන්න.

i. සත්ථුසාසනකාරිකා - තප්පුරිස සමාසය
ii. බුද්ධසාසනවච්ඡලා - තප්පුරිස සමාසය
iii. ලොකගගනායකො - කම්මධාරය සමාසය
iv. ඔක්කාකකුලසම්භවො - කම්මධාරය සමාසය
v. චතුසාගරතොයානි - දිගු සමාසය

WWW.PIRIVENA.LK

එකොළොස්වැනි පාඩම

අභ්‍යාසය

01. 'ආහඤ්ඡං අමතදුන්දුභිං' පාඨය සිංහලට නගන්න.

එකාදසමො පාඨො

ආහඤ්ඡං අමතදුන්දුභිං

තස්ස මය්හං රාජකුමාර; එතදහොසි කස්ස නු ඛො අහං පඨමං ධම්මං දෙසෙය්‍යං? කො ඉමං ධම්මං ඛිප්පමෙව ආජානිස්සතීති? තස්ස මය්හං; රාජකුමාර; එතදහොසි. බහුකාරා ඛො මෙ පඤ්චවග්ගියා භික්ඛූ යෙ මං පධානපහිතත්තං උපට්ඨහිංසු. යන්නූනාහං පඤ්චවග්ගියානං භික්ඛූනං පඨමං ධම්මං දෙසෙය්‍යන්ති. තස්ස මය්හං; රාජකුමාර, එතදහොසි; කහං නු ඛො එතරහි පඤ්චවග්ගියා භික්ඛූ විහරන්තීති. අද්දසං ඛ්වාහං; රාජකුමාර, දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන පඤ්චවග්ගියෙ භික්ඛූ බාරාණසියං විහරන්තෙ ඉසිපතනෙ මිගදායෙ. අථ ඛ්වාහං, රාජකුමාර, උරුවෙලායං යථාභිරන්තං විහරිත්වා යෙන බාරාණසී තෙන චාරිකං පක්කමිං. අද්දසා ඛො මං; රාජකුමාර, උපකො ආජීවකො අන්තරා ච ගයං අන්තරා ච බොධිං අද්ධානමග්ගප්පටිපන්නං. දිස්වාන මං එතදවොච. විප්පසන්නානි ඛො තෙ; ආවුසො, ඉන්ද්‍රියානි, පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො. කංසි ත්වං, ආවුසො, උද්දිස්ස පබ්බජිතො? කො වා තෙ සත්ථා? කස්ස වා ත්වං ධම්මං රොචෙසීති? එවං වුත්තෙ; අහං; රාජකුමාර, උපකං ආජීවකං ගාථාහි අජ්ඣභාසිං.

සබ්බාභිභූ සබ්බවිදූහමස්මි, සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තො
සබ්බඤ්ජහො තණ්හක්ඛයෙ විමුත්තො, සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං.

න මෙ ආචරියො අත්ථි, සදිසො මෙ න විජ්ජති
සදෙවකස්මිං ලොකස්මිං, නත්ථි මෙ පටිපුග්ගලො.

අහඤ්හි අරහා ලොකෙ, අහං සත්ථා අනුත්තරො
එකොම්හි සම්මාසම්බුද්ධො, සීතිභූතොස්මි නිබ්බුතො.

ධම්මචක්කං පවත්තෙතුං, ගච්ඡාමි කාසිනං පුරං
අන්ධභූතස්මිං ලොකස්මිං, ආහඤ්ඡං අමතදුන්දුභින්ති.

(බොධිරාජකුමාරසුත්ත - මජ්ඣිමනිකාය)

ආහඤ්ඡං අමතදුන්දුභිං

රජ කුමරුවෙනි,මට මෙසේ සිත් වීය. ''මම කවරෙක්හට පළමු කොට දහම් දෙසම් ද? කවරෙක් මේ දහම වහා දැන ගන්නේ දැයි''. රජකුමරුවෙනි, මට මෙසේ සිත් විය. ''පධන් පිණිස මෙහෙය වූ සිත් ඇති මට උවටැන් කළ පස්වග මහණුන් මට බොහෝ උපකාර

WWW.PIRIVENA.LK

ඇතියහ. මම පස්වග මහණුන්ට පළමු කොට දහම් දෙසම් නම් මනා ම ය. රජකුමරුවෙනි. මට මෙසේ සිත් විය. පස්වග මහණහු මේ කල්හි කොහි වාසය කරත් ද කියායි. රජකුමරුවෙනි, මම පිරිසිදු මිනිස් ඇස ඉක්ම දිවසින් පස්වග මහණුන් බරණැස ඉසිපතන නම් මිගදායේ වාසය කරන බැව් දුටුවෙමි. රජකුමරුවෙනි. ඉක්බිති මම උරුවෙල් දනව්වෙහි කැමතිතාක් වාසය කොට බරණැස කරා චාරිකාවට නික්මිණිමි.

රජ කුමරුවෙනි, උපක නම් ආජීවක ගයාව හා බෝධිය හා අතර තුර මඟට මා දැක්කේ ය. දැක මට මෙසේ කීවේ ය. ''ඇවැත්නි, තොපගේ ඉඳුරන් ප්‍රසන්න ය. ඡවිවර්ණය පරිශුද්ධ ය. සුසුදු ය. ඇවැත්නි, තෙපි කවර ශාස්තෘවකු උදෙසා පැවිදි වූයේ ද? තොපගේ ශාස්තෘ කවරහු ද? තෙපි කවරක්හුගේ දහමක් කැමති වෙහි ද? රජකුමරුවෙනිථ මෙසේ කී කල උපක ආජීවක හට ගාථාවෙන් කීවෙමි.

''මම හැම ත්‍රෛභූමක ධර්මය මැඬගෙන සිටියෙමි. හැම චාතුර්භූමක දහම දත්මි. හැම ත්‍රෛභූමක ධර්මයෙහි ක්ලේශලේපනයෙන් උපලිප්ත නොවෙමි. හැම ත්‍රෛභූමක ධර්ම හැරපියා සිටිමි. තෘෂ්ණාකාය සංඛ්‍යාත නිවනෙහි අරමුණු විසින් විමුක්තියෙමි. මෙසේ තමා විසින් ම හැම චාතුර්භූමක ධර්ම දැනගෙන අන් කවරක්හු නම් ගෙන (මේ මා ආචාර්යය හ'යි) උදෙසම් ද?

(ලෝකෝත්තර ධර්මයෙහි ලා) මට ගුරුවරයෙක් නැත. මට සමයෙක් නැත සදේවක ලෝකයෙහි මට සදෘශ පුද්ගලයෙක් නැත.

මම වනාහි ලෝකයෙහි අර්හත් වෙමි. මම අනුත්තර ශාස්තෘවෙමි. එකලාව සිටි සම්‍යග් සම්බුද්ධ වෙමි. සියලු කෙලෙසුන් නැසූ හේතුවෙන් ශීතිභූතයෙමි. (එයින් ම) නිර්වෘතයෙමි.

WWW.PIRIVENA.LK

'දම්සක් පවත්වන්නට කසීපුර යෙමි. අන්ධභූත ලෝකයෙහි අමා බෙර වයන්නෙමි' යනුවෙනි.

ඇවැත්නි, තොප යම් සේ පිළින කරවූ ද එසේ හෙයින් අනන්ත ජින වන්නට නිසි ය.

02. පාලි භාෂාවෙන් පිළිතුරු සපයන්න.

i. බුද්ධො කෙසානං පඨමං ධම්මං දෙසෙසි ?
බුද්ධො පඤ්චවග්ගියානං භික්ඛූනං පඨමං ධම්මං දෙසෙසි.

ii. කහං නු ඛො පඤ්චවග්ගියා භික්ඛූ විහරිංසු ?
බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ පඤ්චවග්ගියා භික්ඛූ විහරිංසු.

iii. උපකො ආජීවකො කිං අභාසි ?
උපකො ආජීවකො 'විප්පසන්නානි ඛො තෙ ආවුසො ඉන්ද්‍රියානි පාරිසුද්ධො'ති අභාසි.

iv. කස්ස පටිපුග්ගලො නත්ථි ?
බුද්ධස්ස පටිපුග්ගලො නත්ථි.

v. බුද්ධො ධම්මචක්කං පවත්තෙතුං කිං නාම පුරං ගච්ඡි ?
බුද්ධො ධම්මචක්කං පවත්තෙතුං කාසිනං පුරං ගච්ඡි.

03. පාලියට නගන්න.

i. කවරෙක් මේ දහම වහා ම දැනගන්නේ ද?
කො ඉමං ධම්මං ඛිප්පමෙව ජානිස්සති ?

ii. පස්වග මහණුහු දැන් කොහි වෙසෙත් ද?
පඤ්චවග්ගියා භික්ඛූ එතරහි කහං නු ඛො විහරන්ති ?

iii. පළමුව පස්වග මහණුන්ට ධර්මය දෙසන්නේ නම් මැනවි.
පඨමං පඤ්චවග්ගියානං භික්ඛූනං ධම්මං දෙසෙය්‍යං.

iv. ඔබ කවරෙකුගේ ධර්මය රුචි කෙරෙහි ද?
ත්වං කස්ස ධම්මං රොචෙසි ?

WWW.PIRIVENA.LK

v. දම්සක් පැවැත්වීමට කාසි පුරයට යමි.

ධම්මචක්කං පවත්තෙතුං කාසිනං පුරං ගච්ඡාමි.

04. පිළිතුරු ලියන්න.

i. බුදුන් වහන්සේ පළමුව පස්වග මහණුන්ට දහම් දෙසන්නට සිතුවේ කුමක් නිසා ද?

තමන් බුද්ධත්වය සඳහා වීර්ය කරන කල්හි සමීපයෙහි හිඳ උපස්ථාන කළ නිසා.

ii. පළමු දහම් දේශනාවට යන අතරමඟ දී හමු වූ ආජීවකයා කවුද ?

උපක ආජීවකයා

iii. බුද්ධත්වය ලබා ගැනීමට හේතු වන කරුණු 03ක් ලියන්න.

- සංසාරයෙහි ඝොරතර බව දැනීම
- ලෝක සත්ත්වයන් දුකින් මිදවීමේ හැඟීම ඇති වීම
- දසපාරමිතා ත්‍රිවිධාකාරයෙන් පූරණය කිරීම

iv. බුදුන් වහන්සේ පළමුව දේශනා කළ සූත්‍රය කුමක් ද?

ධම්මචක්කප්පවත්තන සූත්‍රය

v. මිනිසත් බව ඉක්ම සිටි දිවැස යනු කුමක් ද?

දිබ්බචක්ඛු

අභ්‍යාසය

01. තද්ධිත පද භාවිත කරමින් පාලියට නගන්න.

i. ඒ මානවකයා වහා ධර්මය අවබෝධ කරගනී.

සො මානවො ඛිප්පං ධම්මං විජානාති.

ii. මේ දොරටුපාලකයා මා රජු බව දැනත් මහහඬින් සිනාසෙයි.

අයං දොවාරිකො මං රාජා'ති ජානිත්වා'පි උච්චසද්දෙන හසති.

iii. තෙරුන් වහන්සේ මානසික සුව විඳින සේක.

ථෙරො මානසික සුඛං වින්දති.

WWW.PIRIVENA.LK

iv. ගැල් පදවන්නා කරත්තයෙන් ගොස් බඩු විකුණයි.
සාකටිකො සකටෙන ගන්ත්වා භණ්ඩානි වික්කිණාති.

v. කුසිනාරාවෙහි උපන් මිනිස්සු පින්වත් වූහ.
කොසිනාරායං ජාතමනුස්සා පුඤ්ඤවන්තා භවිංසු.

02. පහත වගුව සම්පූර්ණ කරන්න.

නාමය	**අර්ථය**	**තද්ධිත පදය**
උදා : කත්තික	කාර්තිකාවගේ පුතු	කත්තිකෙය්‍ය
සමණ	ශ්‍රමණහුගේ පුතු	සාමණෙර
ධම්ම	ධර්මයෙහි හැසිරෙන්නා	ධම්මික
මනුස්සජාති	මිනිස් බවේ උපන්	මනුස්සජාතියා
මහිස	මීමාගේ අඟ	මාහිස
කසාව	කහ පැහැ ගැන්වූ	කාසාව
මනු	මනුහුගේ පුත්	මානව
තිල	තෙලෙන් මිශ්‍ර වූ දෙය	තෙලික
තණ්ඩුල	සහල් බඩු ඇත්තා	තණ්ඩුලික
උළුම්ප	පහුරෙන් එතෙර වූයේ	ඔළුම්පික
උපගු	උපගුගේ පුතු	ඔපගව

03. පහත සඳහන් තද්ධිත පද සෑදුණු ආකාරය පියවරෙන් පියවර දක්වන්න.

i. වාසිට්ඨ - වසිට්ඨ + ණ
ii. වච්ඡායන - වච්ඡ + ණායන
iii. සාමණෙර - සමණ + ණෙර
iv. ඔපගව - උපගු + ණව

WWW.PIRIVENA.LK

v. ආභිධම්මික - අභිධම්ම + ණික

04. පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

තද්ධිත පදය	ප්‍රකෘති ප්‍රත්‍ය වෙන් කිරීම	අර්ථය
උදා :- වාසුදෙව	වසුදෙව + ණ	වසුදේවගේ පුතු
සාකටික	සකට + ණික	කරත්තයෙන් යන
මානසික	මනස + ණික	මනසික් කරන ලද
වෙණික	වීණා + ණික	වීණා දත්
ඔළුම්පික	උලුම්ප + ණික	පහුරෙන් එතෙර වූ
වෙනතෙය්‍ය	විනතා + ණෙය්‍ය	විනතාවගේ පුත්
කොසිනාරක	කුසිනාරා + ණක	කුසිනාරාවේ උපන්
ආභිධම්මික	අභිධම්ම + ණික	අභිධර්මය දන්නා
මොග්ගල්ලාන	මොග්ගල්ල + ණායන	මොග්ගලීගේ පුතා
නාවික	නාවා + ණික	නැවෙහි නියුක්ත
පච්ඡිම	පච්ඡා + ඉම	පශ්චිම

05. පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

තද්ධිත පදය		සිදු ව ඇති වෘද්ධිය
උදා : සාකටික	සකට+ණික	අ ආ වෘද්ධි වීම
කොසිනාරක	කුසිනාරා+ණක	උ ඔ වෘද්ධි වීම
මානව	මනු+ණව	අ ආ වෘද්ධි වීම
වෙනතෙය්‍ය	විනතා+ණෙය්‍ය	ඉ එ වෘද්ධි වීම
ඔලුම්පික	උලුම්ප+ණික	උ ඔ වෘද්ධි වීම

WWW.PIRIVENA.LK

වෙණික	වීණා+ණික	ඊ එ වෘද්ධි වීම

WWW.PIRIVENA.LK

දොළොස් වැනි පාඩම

අභ්‍යාසය

01. 'තථාගතස්ස මහිද්ධිකතා මහානුභාවතා' ඡේදය සිංහලට නගන්න.

ද්වාදසමො පාඨො

තථාගතස්ස මහිද්ධිකතා මහානුභාවතා

එකං සමයං භගවා මල්ලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසංඝෙන සද්ධිං යෙන ථූනං නාම මල්ලානං බ්‍රාහ්මණගාමො තදවසරි. අස්සොසුං ඛො, ථූනෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා 'සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො මල්ලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසංඝෙන සද්ධිං ථූනං අනුප්පත්තො'ති. උදපානං තිණස්ස ච භුසස්ස ච යාව මුඛතො පූරෙසුං 'මා තෙ මුණ්ඩකා සමණකා පානීයං අපංසූ'ති. අථ ඛො භගවා මග්ගා ඔක්කම්ම යෙන රුක්ඛමූලං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. 'ඉඞ්ඝ මෙ ත්වං ආනන්ද, එතම්හා උදපානා පානීයං ආහරා'ති. එවං වුත්තෙ, ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච. ඉදානි සො, භන්තෙ, උදපානො ථූනෙය්‍යකෙහි බ්‍රාහ්මණගහපතිකෙහි තිණස්ස ච භුසස්ස ච යාව මුඛතො පූරිතො 'මා තෙ මුණ්ඩකා සමණකා පානීයං අපංසූ'ති. දුතියම්පි ඛො............ අපංසූ'ති. තතියම්පි ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. ඉඞ්ඝ මෙ ත්වං ආනන්ද, එතම්හා උදපානා පානීයං ආහරා'ති. එවං, භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා පත්තං ගහෙත්වා යෙන සො උදපානො තෙනුපසඞ්කමි. අථ ඛො සො උදපානො ආයස්මන්තෙ ආනන්දෙ උපසඞ්කමන්තෙ සබ්බං තං තිණඤ්ච භුසඤ්ච මුඛතො ඔවමිත්වා අච්ඡස්ස උදකස්ස අනාවිලස්ස විප්පසන්නස්ස යාව මුඛතො පූරිතො විස්සන්දන්තො මඤ්ඤෙ අට්ඨාසි. අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි. අච්ඡරියං වත! භො, අබ්භුතං වත! භො, තථාගතස්ස මහිද්ධිකතා මහානුභාවතා. අයං හි සො උදපානො මයි උපසඞ්කමන්තෙ සබ්බං තං තිණඤ්ච භුසඤ්ච මුඛතො ඔවමිත්වා අච්ඡස්ස උදකස්ස අනාවිලස්ස විප්පසන්නස්ස යාව මුඛතො පූරිතො විස්සන්දන්තො මඤ්ඤෙ අට්ඨාසීති. පත්තෙන පානීයං ආදාය යෙන භගවා තෙනුපසඞ්කමි.

(උදපානසුත්ත - උදානපාලි)

තථාගතස්ස මහිද්ධිකතා මහානුභාවතා

එක් සමයක භාග්‍යවතුන් වහන්සේ මහත් භික්ෂු සංඝයා සමග මල්ල රට සැරි සරන සේක, මල්ලයන්ගේ ථූන නම් වූ බමුණුගමට වැඩම කළ සේක. ශාක්‍ය පුත්‍ර වූ ශාක්‍ය කුලයෙන් පැවිදි වූ මහණ ගෞතමයන් වනාහි මහත් භික්ෂු සංඝයා සමග මල්ල රට සැරිසරණුවෝ ථූන ගමට පැමිණියාහුයැයි ථූන ගම්වැසි බමුණු

WWW.PIRIVENA.LK

ගෘහපතියෝ ඇසූහ. ඔහු ඒ මුඩු මහණහු පැන් නොබොත්වයි තණකොළින් ද පිදුරෙන් ද ළිඳ මුවවිට දක්වාට පිරවූහ.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ මාර්ගයෙන් ඉවත් වී එක්තරා රුක්මුලක් කරා වැඩම කළ සේක. එළඹ පණවන ලද ආසනයෙහි වැඩ හුන් සේක. වැඩ හිඳම භාග්‍යවතුන් වහන්සේ ආනන්ද තෙරුන්ට කතාකොට 'ආනන්දයෙනි, තෙල ළිඳෙන් මට පැන් ගෙනෙව'යි වදාළ සේක. එසේ වදාළ කල්හි ආනන්ද තෙරණුවෝ 'වහන්ස, ඒ මුඩු මහණහු පැන් නොබොත්වයි' කියා ථූන ගම් වැසි බමුණු ගෘහපතියන් විසින් ඒ ළිඳ තණකොළින් හා පිදුරෙන් මුවවිට දක්වාම දැන් පුරවන ලදැයි සැළකළ සේක. දෙවෙනි වර ද භාග්‍යවතුන් වහන්සේ ආනන්ද තෙරුන් අමතා ඉහත පරිදි පැවසූ සේක. දෙවෙනි වර ද ආනන්ද තෙරණුවෝ පෙර පරිදි ම 'පැන් නොබොත්වයි' තණකොළිනුත් පිදුරෙනුත් ළිඳේ මුවවිට දක්වාම පුරවන ලදැයි සැල කළේ ය. තෙවෙනි වර ද භාග්‍යවතුන් වහන්සේ 'ආනන්දයෙනි' තෙල ළිඳෙන් මට පැන් ගෙනෙව'යි වදාළ සේක. 'එසේය වහන්ස' කියා ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී පාත්‍රය ගෙන ඒ ළිඳ කරා එළඹි සේක.

එකල්හි ඒ ළිඳ ආනන්ද තෙරුන් වෙත එළඹෙන විට ඒ සියලු තණකොළත් පිදුරුත් මුවවිටින් බැහැර කොට මුවවිට දක්වාම පිරිසිදු නොකැළඹුණු විශේෂයෙන් පැදුණු දියෙන් පිරුණේ පිටතට දිය නික්මවන්නක්හු මෙන් සිටියේ ය. එකල්හි ආනන්ද තෙරණුවන් හට පින්වත්නි තථාගතයන් වහන්සේගේ මහත් ඍද්ධි ඇති නියාව මහත් ආනුභාව ඇති නියාස ආශ්චර්ය ය. අද්භූත ය. මේ ළිඳ මා එළඹෙන කල්හි සියලු තණකොළත් පිදුරුත් මුවවිටින් බැහැර කොට පියා පිරිසිදු නොකැළඹුණු විශේෂයෙන් පහන් වූ දියෙන් මුවවිට දක්වා පිරුණේ පිටතට දිය නික්මවමින් මෙන් සිටියේ යැයි මේ සිත විය.

WWW.PIRIVENA.LK

මෙසේ සිතා පාත්‍රයෙන් පැන් ගෙන භාග්‍යවතුන් වහන්සේ කරා එළඹුණා හ.

02.පාලියෙන් පිළිතුරු ලියන්න.

i. භගවා කෙන සද්ධිං කිං නාම බ්‍රාහමණගාමෙ තදවසරි ?

භගවා භික්ඛු සඞෙඝන සද්ධිං ථූනං නාම මල්ලානං බ්‍රාහමණගාමෙ තදවසරි.

ii. ථූනෙය්‍යකා බ්‍රාහමණගහපතිකා උදපානං කෙහි පූරෙසුං ?

ථූනෙය්‍යකා බ්‍රාහමණගහපතිකා උදපානං තිණඤ්ච භුසඤ්ච පූරෙසුං.

iii. භගවා ආනන්දං ආමන්තෙත්වා කිං අභාසි ?

භගවා ආනන්දං ආමන්තෙත්වා ඉඞ්ඝ මෙ ත්වං ආනන්ද, එතමහා උදපානා පානීයං ආහරා'ති අභාසි.

iv. ආනන්දො කෙන පානීයං ආදාය භගවන්තං උපසඞ්කමි ?

ආනන්දො පත්තෙන පානීයං ආදාය භගවන්තං උපසඞ්කමි.

v. ආනන්දෙ උදපානං ගතෙ උදපානො කීදිසො අහවි ?

ආනන්දෙ උදපානං ගතෙ තිණඤ්ච භුසඤ්ච මුඛතො ඔවමිත්වා අච්ඡස්ස උදකස්ස අනාවිලස්ස විප්පසන්නස්ස යාව මුඛතො පූරිතො විස්සන්දෙන්තො අහවි.

02. ඡේදයේ සඳහන් වාක්‍ය රටාව අනුගමනය කොට පාලියට නගන්න.

i. එක් කලෙක මලියදේව මහරහතන් වහන්සේ බොහෝ භික්ෂූන් සමග වට්ටාරම් විහාරයට (මණ්ඩලාරාම) පැමිණි සේක.

එකං සමයං අරහතො මලියදෙවො බහු භික්ඛූහි සද්ධිං මණ්ඩලාරාමං තදවසරි.

ii. ජනාධිපතිතුමා සෙංකඩගල නුවරට පැමිණියේ යැයි සෙන්කඩගල නුවර වැසියෝ ඇසූහ.

ජනාධිපති සෙලකණ්ඩපුර නගරං අනුප්පත්තො'ති සෙලකණ්ඩපුර නගරවාසිනො සුණිංසු.

WWW.PIRIVENA.LK

iii. නුවර වැසියෝ තෙරුන් වහන්සේලාගේ පාත්‍ර කට දක්වා කෑයුතු පියයුතු දැයින් (ඛාදනීය භොජනීය) පිරවූහ.

නගරවාසිනො භික්ඛූනං පත්තානි යාව මුඛතො පූරිතො ඛාදනීය භොජනීයාදීසු පූරෙසුං.

iv. ස්වාමීනි, එසේයයි ශිෂ්‍යයෝ ගුරුවරයාට පිළිතුරු දී පොත් රැගෙන බෝධි මණ්ඩපය වෙත එළඹුණහ.

ආම සවාමීනි, සිස්සා ආචරියස්ස පටිපුච්ඡිත්වා පොත්ථකානි ආදාය (ගහෙත්වා) යෙන බොධි මණ්ඩපං තෙන උපසඞ්කමිංසු.

v. ළිඳේ ජලය පිරිසිදුව නොකැළඹී පෑදී කටතෙක් පිරී ඇත.

උදපානෙ ජලං අච්ඡස්ස අනාවිලස්ස විප්පසන්නස්ස යාව මුඛතො පූරිතො අත්ථි.

03. ඡේදය ඇසුරෙන් පිළිතුරු ලියන්න.

i. ථූන ජනපදය පිහිටා තිබුණේ කවර රාජධානියක ද?

මල්ල දේශයේ (රටේ)

ii. ආනන්ද තෙරුන් දැරූ තනතුරු මොනවා ද?

ධර්ම භාණ්ඩාගාරික තනතුර, බුදුරදුන්ගේ අග්‍ර උපස්ථායක

iii. බුදුරදුන්ගේ මහානුභාවය ප්‍රකට වූයේ කවර කරුණක් නිසා ද?

පිදුරුවලිනුත් තෘණවලිනුත් වසා දමා තිබූ ළිඳේ ජලය පිරිසිදු වී නොකැළඹී පිටතට නික්මෙමින් තිබීම

iv. බුද්ධ චරිතය සම්බන්ධ ඡේදයෙන් අනාවරණය වන කරුණු තුනක් ලියන්න.

එළඹෙන කරදර අභියෝග ජය ගැනීම

භික්ෂූන් වහන්සේලා සමග සාමූහිකව වැඩම කිරීම (පිරිවර සහිත වීම)

මහත් ඍද්ධි ඇති බව

v. බුදුරදුන්ගේ චාරිකාවට අකැමැති වූවෝ කවරහු ද? ඔවුන් අකැමැත්ත ප්‍රකාශ කළේ කෙසේ ද?

ථූන ගමෙහි වැසි බමුණෝ, පිදුරුවලින් හා තෘණපත්වලින් ළිඳ වැසීම

WWW.PIRIVENA.LK

අභ්‍යාස

01. පාලියට නගන්න.

i. සඤ්ජය පිරිවැජියා පිරිවැජියන් දෙසිය පණහක් (අඩ්ඪතෙය්‍ය සතෙහි) සමග රජගහනුවර වසයි.

සංජය පරිබ්බාජකො අඩ්ඪතෙය්‍ය සතෙහි පරිබ්බාජකෙහි සද්ධිං රාජගහෙ වසති.

ii. ගුණවන්ත කුමාරවරු සිල්වත් උපාසකවරුන්ට උවටැන් කරති.

ගුණවන්තො කුමාරා සීලවන්තානං උපාසකානං උපට්ඨානං කරොන්ති.

iii. දිළිඳු බව වැඩි වූ කල්හි සොරකම විපුල බවට ගියේ ය.

දාලිද්දියං වෙපුල්ල ගතෙ අදින්නාදානං වෙපුල්ලමගමාසි.

iv. මම පළමුවත් දෙවනුවත් තෙවනුවත් බුදුන් සරණ යමි.

අහං පඨමම්පි දුතියම්පි තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි.

v. චුල්ලපන්ථක තෙර රහත් බව ලැබ තමා දහස්වරක් මවා අඹ වනයේ හුන්නේ ය.

චුල්ලපන්ථකත්ථෙරො අරහත්තං පාපුණිත්වා අත්තනො සහස්සක්ඛත්තුං මාපෙත්වා (නිම්මිණිත්වා) අම්බවනෙ නිසීදි.

02. සිංහලට නගන්න.

i. ගුණවන්තා මනුස්සා පාණාතිපාතම්හා විරමන්ති.

ගුණවත් මිනිස්සු ප්‍රාණඝාතයෙන් වැළකෙති.

ii. අපරභාගෙ සො ආරඤ්ඤකමහාභයත්ථෙරො'ති පාකටං අහොසි.

පසුකල්හි ඔහු වනවාසී මහා අභය තෙර යැයි ප්‍රසිද්ධ විය.

iii. මෙධාවිනො සිස්සා ගරුනො ගාරවං කත්වා නානාසත්ථෙසු පාටවං ලභන්ති.

ඥාණවන්ත ශිෂ්‍යයෝ ගුරුවරයාට ගරු කොට නොයෙක් ශිල්පවල නිපුණත්වය (දක්ෂබව) ලබති.

iv. සච්චවාදී තපස්සිනො වාචාලා න භවන්ති.

WWW.PIRIVENA.LK

සත්‍යවාදී තාපසයෝ වාචාල නොවෙති.

v. සත්තධා මෙ ඵලෙ මුදධා ජීවනෙතා න සුඛං ලභෙ.

මගේ හිස සත්කඩකට පැලෙයි. ජීවත් වූවත් සැපක් නොලබමි.

03. පහත වගුව සම්පූර්ණ කරන්න.

තද්ධිත පදය	ප්‍රත්‍යය වෙන් කිරීම	තද්ධිත ප්‍රභේදය	තද්ධිත පදයේ අදහස
උදා : ධම්මික	ධම්ම + ණික	අනේකාර්ථ	ධර්මයෙහි හැසිරෙන්නා
ථූනෙය්‍යකා	ථූන + එය්‍යක	අනේකාර්ථ	ථූන ගමේ උපන්
ගහපතිකා	ගහපති + ඉකා	අනෙකාර්ථ	ගෘහපතිනිය
ගොතමො	ගොතම + ණ	අපච්චත්ථ	ගෞතම පුත්
සමණකා	සමණ + ක	අනෙකත්ථ	ශ්‍රමණයා
මුණ්ඩකා	මුණ්ඩ + ක	අනෙකත්ථ	මුඩු හිසැත්තා
තතියං	ති + තිය	සංඛ්‍යා	තෙවැනි
දුතියං	ද්වි + තිය	සංඛ්‍යා	දෙවැනි
අච්ඡරියං			ආශ්චර්යයෙන් යුතු
මහිද්ධිකතා	මහිද්ධික + තා	භාව	මහත් ඍද්ධිය ඇති
මහානුභාවතා	මහානුභාව + තා	භාව	මහානුභාවය

WWW.PIRIVENA.LK

04. පහත වගුව සම්පූර්ණ කරන්න.

නාමය	**අර්ථය**	**තද්ධිත පදය**
උදා : අරොග	නිරෝගිකම	ආරොග්‍ය
මෙධා	නුවණ ඇති	මෙධාවී
රාජ	රජ පරපුරට අයත්	රාජඤ්ඤ
මගධ	මගධයෙහි උපන්	මාගධ
සමුද්ද	මුහුදට අයත්	සමුද්දික
පඤ්ච	පස්වැනි	පඤ්චම
සබ්බ	හැම අයුරකින්	සබ්බථා
පුථුජ්ජන	පුහුදුන් බව	පුථුජ්ජනතා
කති	කීවරක්	කතිධා
තප	තපස් ඇති	තපස්සී
මගව	මුව වැද්දා	මාගවික

දහ තුන් වැනි පාඩම

අභ්‍යාසය

1. 'තෙ නමස්සාමි මාතලී' ඡේදය සිංහලට නගන්න.

තෙරසමො පාඨො | තෙ නමස්සාමි මාතලී

භූතපුබ්බං භික්ඛවෙ සක්කො දෙවානමින්දො මාතලිං සඞ්ගාහකං ආමන්තෙසි. යොජෙහි සම්ම, මාතලි, සහස්සයුත්තං ආජඤ්ඤරථං. උය්‍යානභූමිං ගච්ඡාම සුභූමිං දස්සනායාති. එවං භද්දන්තවාති ඛො භික්ඛවෙ මාතලි සඞ්ගාහකො සක්කස්ස දෙවානමින්දස්ස පටිස්සුත්වා සහස්සයුත්තං ආජඤ්ඤරථං යොජෙත්වා සක්කස්ස දෙවානමින්දස්ස පටිවෙදෙසි. යුත්තො ඛො තෙ, මාරිස, සහස්සයුත්තො ආජඤ්ඤරථො යස්සදානි කාලං මඤ්ඤසීති. අථ ඛො භික්ඛවෙ සක්කො දෙවානමින්දො වෙජයන්තපාසාදා ඔරොහන්තො පඤ්ජලිකො පුථුද්දිසා නමස්සති. අථ ඛො භික්ඛවෙ මාතලි සඞ්ගාහකො සක්කං දෙවානමින්දං ගාථාය අජ්ඣභාසි.

තං නමස්සන්ති තෙවිජ්ජා - සබ්බෙ භුම්මා ච ඛත්තියා,
චත්තාරො ච මහාරාජා - තිදසා ච යසස්සිනො,
අථ කො නාම සො යක්ඛො - යං ත්වං සක්ක නමස්සසීති.

අහඤ්ච සීලසම්පන්නෙ - චිරරත්තසමාහිතෙ,
සම්මා පබ්බජිතෙ වන්දෙ - බ්‍රහ්මචරියපරායනෙ.

යෙ ගහට්ඨා පුඤ්ඤකරා - සීලවන්තො උපාසකා,
ධම්මෙන දාරං පොසෙන්ති - තෙ නමස්සාමි මාතලී ති.

(සක්කනමස්සන සුත්ත සංයුත්තනිකාය)

තෙ නමස්සාමි මාතලී

මහණෙනි පෙර වූවක් කියමි. සක් දෙවිඳු මාතලී රියදුරා ඇමතී ය. සගය, මාතලී. දහසින් යුත් ආජඤ්ඤරථය යොදවුව. මනා බිම වූ උයන්බිම දක්නට යමු. මහණෙනි, එසේ ය, නුඹට යෙහෙකි වේවායි, මාතලී රියදුරු තෙමේ සක්දෙවිඳුහට පිළිවදන් දී දහසින් යුතු ආජඤ්ඤ රථය යොදා සක් දෙඳුහට නිදුකානෙනි, දහසින් යුතු ආජඤ්ඤ රථය යොදන ලදි. එයට දැන් කල් දනුවයි සැළ කළේ

WWW.PIRIVENA.LK

ය.මහණෙනි. ඉක්බිති සක්දෙව්රජ විජයොත් පහයෙන් බස්නේ ඇඟිලි බැඳ හැම දිශා නමදියි. මහණෙනි, එකල්හි මාතලී රියුරු සක්දෙව් රජුට ගාථාවෙන් මෙසේ කීවේ ය.

වේදත්‍රය හදාරන සියලු භූ ලෝකවාසීහූ ද ක්ෂතියයෝ ද සතරවරම් දෙව්මහරජහු ද යසස් ඇති දෙවියෝ ද නුඹට වඳිති. ඉඳින් සක් දෙවිඳුනි, නුඹ යමකු වන්දනා කරන්නාහු නම් කියන් සත්ත්වයෙක් ද?

මම ද ශීලයෙන් සමන්විත වූ බොහෝ කලක් මුළුල්ලෙහි එකඟ කළ සිත් ඇති බඹසර විසූයේ තත්පර වූ පැවිද්දන් මැනවින් වඳිමි.

පින් කරන සිල්වත් වූ ගෘහස්ථ යම් උපාසක කෙනෙක් දැහැමෙන් අඹුදරුවන් පෝෂණය කරද්ද මාතලී මම ඔවුන් නමඳිමි.

2. පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. සක්කො දෙවානමින්දො මාතලිං සංගාහකං කිං කථෙසි ?
සක්කො දෙවානමින්දො මාතලිං සංගාහකං 'යොජෙහි සම්ම සහස්සයුත්තං ආජඤ්ඤරථං උය්‍යානභූමිං ගච්ඡාම. සුභූමිං දස්සනායාති' කථෙසි.

ii. මාතලී පන සක්කස්ස දෙවානමින්දස්ස කො අහවි ?
මාතලී පන සක්කස්ස දෙවානමින්දස්ස සඞ්ගාහකං අහවි.

iii. සක්කො දෙවානමින්දො කුතො ඔරොහි ?
සක්කො දෙවානමින්දො වෙජයන්තපාසාදා ඔරොහි.

iv. ගහට්ඨානං කෙ ගුණා භවන්ති ?
ගහට්ඨානං පුඤ්ඤකාරා, සීලවන්තා, උපාසකා, ධම්මෙන දාරං පොසණං ගුණා භවන්ති.

v. සක්කො කෙසං වන්දති ?
සක්කො සීලසම්පන්නෙන චිරරත්තසමාහිතෙ සම්මා පබ්බජිතෙ සීලවන්තාලං උපාසකානං වන්දති.

WWW.PIRIVENA.LK

3. ඡේදය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. සක් දෙව්රජ මාතලී දිව්‍යපුත්‍රයාට පැවසුවේ කුමක් ද?
උයනට යෑම සඳහා රථය සකස් කරන ලෙස.

ii. මාතලී දිව්‍යපුත්‍රයා සක් දෙවිඳුන්ගේ කුමන කාර්යයක් ඉටු කරයි ද?
රිය පැදවීම / රිය ගෙන යෑම

iii. මෙම ඡේදයේ සඳහන් සක් දෙව්රජුගේ සම්පත් මොනවා ද?
ආජඤ්ඤ රථය, මාතලී, විජයොත්පාය

iv. සතරවරම් දෙව්රජවරුන්ගේ නම් ලියන්න.
ධෘතරාෂ්ට, විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණ

v. සක් දෙව්රජුගේ වන්දනා ගරු බුහුමනට පාත්‍රවන්නේ කුමන කටයුතු කරන පිරිස් ද?
සීලවන්ත, එකඟ කළ සිත් ඇත්තවුන්, පින් කරන, බ්‍රහ්මචාරී, අම්මාපියන්ට, අඹුදරුවන් මනාව රකින ආදි ගුණයන්ගෙන් යුතු වූවන්ට.

අභ්‍යාස

1. වර්තමාන කෘදන්ත පද යොදාගෙන තනි වාක්‍ය සේ නිර්මාණය කරන්න.

නිදසුන :

කුමාරො සයති - මාතා කුමාරං පබොධෙති.
මාතා සයන්තං කුමාරං පබොධෙති.

i. කුමාරා කීළන්ති - දායකො කුමාරානං පානීයං දෙති
දායකො කීළන්තානං කුමාරානං පානීයං දෙති.

ii. මිගා ධාවන්ති - සීහො මිගෙ අනුබන්ධති.
සීහො ධාවන්තෙ මිගෙ අනුබන්ධති.

iii. සාමණෙරො විහාරං ගච්ඡති - උපාසකා සාමණෙරං අනුගච්ඡන්ති.
උපාසකො විහාරං ගච්ඡන්තං සාමණෙරං අනුගච්ඡති.

WWW.PIRIVENA.LK

iv. කුමාරිකා ගංගාය සීදති - කුමාරො කුමාරිං උත්තාරෙති.
    කුමාරො ගංගාය සීදන්තිං කුමාරිං උත්තාරෙති.

v. යාචකො ධනං යාචති - සෙට්ඨී යාචකස්ස ධනං දෙති.
    සෙට්ඨී යාචන්තස්ස යාචකස්ස ධනං දෙති.

2 පහත සඳහන් වාක්‍යයන්හි පූර්වක්‍රියා පද යොදා තනි වාක්‍යයක් සේ ලියන්න.

i. සාවත්ථිවාසී කුලපුත්තො ජෙතවනං අගමාසි.
ii. සො භගවතො සන්තිකො ධම්මං සුණි.
iii. සො කාමෙසු ආදීනවං පස්සි.
iv. සො පබ්බජි.
v. සො උපසම්පජ්ජි.
vi. සො සත්ථු සන්තිකෙ කම්මට්ඨානං අග්ගහෙසි.
vii. සො විපස්සනං වඩ්ඪෙසි.
viii. සො අරහත්තං පාපුණි.

සාවත්ථිවාසී කුලපුත්තො ජෙතවනං ගන්ත්වා භගවතො සන්තිකෙ ධම්මං සුත්වා කාමෙසු ආදීනවං පස්සිත්වා/ දිස්වා පබ්බජිත්වා උපසම්පජ්ජිත්වා සත්ථු සන්තිකෙ කම්මට්ඨානං ලභිත්වා/ ගහෙත්වා විපස්සනං වඩ්ඪෙත්වා අරහත්තං පාපුණි.

3. පහත සඳහන් ඡේදයෙන් කිතක පද 30ක් උපුටා දක්වන්න.

අථස්ස එතදහොසි. සත්ථාරා චත්තාරො පුග්ගලා කථිතා, තෙසු මයා පදපරමෙන භවිතබ්බං, නත්ථි මය්හං ඉමස්මිං අත්තභාවෙ මග්ගො වා ඵලං වා, කිං කරිස්සාමි අරඤ්ඤවාසෙන, සත්ථු සන්තිකං ගන්ත්වා රූපසොභග්ගප්පත්තං බුද්ධසරීරං ඔලොකෙන්තො මධුරං ධම්මදෙසනං සුණන්තො විහරිස්සාමීති පුන ජෙතවනමෙව පච්චාගමාසි. අථ නං සන්දිට්ඨසම්භත්තා ආහංසු. ආවුසො, ත්වං සත්ථු සන්තිකෙ කම්මට්ඨානං ගහෙත්වා සමණධම්මං කරිස්සාමීති ගතො, ඉදානි පන ආගන්ත්වා සඞ්ගණිකාය අභිරමමානො චරසි, කිං නු ඛො තෙ පබ්බජිතකිච්චං මත්ථකං පත්තං, අප්පටිසන්ධිකො ජාතොසීති? ආවුසො, අහං මග්ගං වා ඵලං වා අලභිත්වා අභබ්බපුග්ගලෙන මයා භවිතබ්බන්ති විරියං ඔස්සජ්ජිත්වා ආගතොම්හීති. අකාරණං තෙ,

WWW.PIRIVENA.LK

ආවුසො, <u>කතං</u> දළ්හවිරියස්ස <u>සත්ථු</u> සාසනෙ <u>පබ්බජිත්වා</u> විරියං <u>ඔස්සජ්ජනෙන්තන</u>, <u>අයුත්තං</u> තෙ <u>කතං</u>, එහි <u>තථාගතස්ස</u> දස්සෙසමාති තං <u>ආදාය</u> <u>සත්ථු</u> සන්තිකං අගමංසු.

4. ඔබ උපුටාගත් කිතක පද පහත වගුවේ වර්ග කරන්න.

වත්තමාන	අව්‍යය	ත්‍රෛකාලික	අතීත
ඔස්සජ්ජනෙත	ආදාය	භවිතබ්බං	කතං
සුණනෙතා	ඔස්සජ්ජිත්වා		පබ්බජිත
ඔලොකෙනෙතා	පබ්බජිත්වා		ගතො
අභිරමමානො	අලභිත්වා		පත්තං
	ආගනත්වා		කථිතා
			සන්දිට්ඨ
			සමහත්ත
			ආගතො
			රූපසොභග්ගප්පත්තං
			අයුත්තං

5. පහත දී ඇති ධාතුන්ගේ කිතක පද සෑදෙන අයුරු ලියන්න.

ධාතුව	වර්තමාන කිතක	පූර්ව ක්‍රියා	තුමන්ත ක්‍රියා	කිච්ච කිතක භාවකාරක	අතීත
කර	කරොනත	කරිත්වා	කරිතුං/ කාතුං	කත්තබ්බං	කතං
ගච්ඡ	ගච්ඡනත	ගච්ඡිත්වා	ගනතුං	ගනතබ්බං	ගතං
පච	පචනත	පචිත්වා	පචිතුං	පචිතබ්බං	පචිතං

WWW.PIRIVENA.LK

දිස	දිස්සන්ත	දිස්වා	පස්සිතුං	පස්සිතබ්බං	පස්සිතං
කථ	කථන්ත	කථෙත්වා	කථෙතුං	කථෙතබ්බං	කථිතං
ලිඛ	ලිඛන්ත	ලිඛිත්වා	ලිඛිතුං	ලිඛිතබ්බං	ලිඛිතං
පුච්ඡ	පුච්ඡන්ත	පුච්ඡිත්වා	පුච්ඡිතුං	පුච්ඡිතබ්බං	පුච්ඡිතං

6. සිංහලට නගන්න.

i. මයා දීයමාන ආහාරං සො යාචකො න පටිගණ්හාති.

මා විසින් දෙන ආහාරය ඒ යාචකයා පිළිනොගනියි.

ii. කස්සකෙන දණ්ඩෙන පහරියමානං තං බලිවද්දං අහං පස්සිං.

ගොවියා විසින් දණ්ඩෙන් පහර ලබන ඒ ගොනා මම දුටුවෙමි.

iii. සෙනාපතිනා හත්ථෙ ධාරියමානං අසිං දිස්වා චොරා භායිත්වා පලායිංසු.

සෙන්පතියා විසින් අතේ දරන කඩුව දැක සොරු බිය වී පළාගියහ.

iv. චොරො එකස්මිං ගුම්බෙ නිලීයිත්වා ධෙනුං අපහරිතුං උපායං චින්තෙසි.

සොරා එක් බිලක (ලෙණක/ ලැහැබක/ ගොමුවක) සැඟ වී ධේනුව/ දෙන සොරකම් කිරීමට උපායක් සිතුවේ ය.

v. සාමණෙරො යට්ඨියා කොට්ං ගහෙත්වා ථෙරස්ස පුරතො ගච්ඡි.

සාමණේරයන් වහන්සේ හැරමිටි කෙළවර ගෙන තෙරුන්ගේ ඉදිරියෙන් ගියේ ය.

7. පාලියට නගන්න.

i. ඔබ විසින් සිය අතින් කපනු ලබන ගස ගෙය මත වැටුණේ ය.

තයා හත්ථෙන ඡින්දමාන රුක්ඛං ගෙහමත්ථකං පති.

WWW.PIRIVENA.LK

ii. දැහැමි රජහු විසින් රකිනු ලබන රටෙහි ජනයෝ සුවසේ වාසය කරත්.

ධම්මිකෙන භූපාලෙන/ රාජේන රක්ඛන්තං රට්ඨෙ ජනා සුඛෙන වසන්ති.

iii. ඔහු බාල වියෙහි මනාව ශිල්ප ඉගෙන ගෙන පසුව දියුණුවට පැමිණියේ ය.

සො බාලෙ සාධුකං සිප්පං උග්ගණ්හිත්වා පච්ඡා අභිවුද්ධිං පති/ පාපුණි.

iv. වඳුරා ලොකු බල්ලකු දැක බිය වී ගසෙන් බිමට වැටුණේ ය.

වානරො මහන්තං සුනඛං දිස්වා භායිත්වා රුක්ඛම්හා භූමිං පති.

v. සුමේධ තවුසා අහසින් යන්නේ දීපංකර බුදුන් දැක උන්වහන්සේට වැන්දේ ය.

සුමෙධො තාපසො ආකාසෙන ගච්ඡන්තො දීපඞ්කර සම්බුද්ධං දිස්වා තස්ස වන්දි.

8. කෙටි පිළිතුරු සපයන්න.

i. කිතක යනු මොනවා ද?

ධාතුවකට ප්‍රත්‍යය එකතු කරගෙන සකස් කරගන්නා නාම කිතක නමින් හැඳින්වේ.

ii. ත්‍රෛකාලික කිතක යනු මොනවා ද?

අතීත වර්තමාන අනාගත යන කාල තුනටම අයත් කිතක පද මේ නමින් හැඳින් වේ. එහි කිච්ච, කිත් යනු කොටස් දෙකක් ඇත.

iii. අව්‍යය කිතක යනු මොනවාද ? උදාහරණ 05ක් ලියන්න.

වරනොනැගෙන කිතක අව්‍ය කිතක නම් වේ. එනම් පූර්ව ක්‍රියා ය.

වන්දිත්වා, රක්ඛිත්වා, ආගම්ම, පග්ගය්හ, නිපජ්ජ

iv. වුට්ඨ, ආරද්ධ, යුත්ත, ආරූළ්හ, දිට්ඨ යන පදවල ධාතු ප්‍රත්‍යය වෙන්කර ලියන්න.

වුට්ඨ - වුස + ත

WWW.PIRIVENA.LK

ආරද්ධ - ආ + රභ + ත

යුත්ත - යුජ + ත

ආරූළ්හ - ආ + රුහ + ත

දිට්ඨ - දිස + ත

v. 'තෙ නමස්සාමි මාතලී' යන ඡේදයේ එන කිතක පද 5ක් උපුටා ලියන්න.

පටිසුත්වා, යොජෙත්වා, ඔරොහන්තො, පුඤ්ඤකරා,

WWW.PIRIVENA.LK

දාහතර වැනි පාඩම

අභ්‍යාස

01. වරහන් තුළින් සුදුසු වචන තෝරාගෙන හිස්තැන් පුරවන්න.

(අත්ථසාලිනී/ මහානාම/ ධම්මපාල/ සංයුත්ත නිකාය/ සමන්තපාසාදිකා/ දාඨානාග/ මහාවංශය/ මනොරථපූරණී/ රෙවත/ බුද්ධඝොසුප්පත්ති)

i. බුද්ධඝෝෂ මාහිමිපාණන්ගේ ගුරුවරයා වූයේ <u>රෙවත</u> හිමියන් ය.

ii. උන්වහන්සේ ඉන්දියාවේ දී රචනා කරන ලද ග්‍රන්ථයක් වනුයේ <u>අත්ථසාලිනී</u> ය.

iii. <u>මහාවංසය</u> හා <u>බුද්ධඝොසුප්පත්ති</u> උන්වහන්සේගේ ජීවන තොරතුරු ඇතුළත් වේ.

iv. බුදුගොස් හිමි ලක්දිවට වැඩම කරවන ලද්දේ <u>මහානාම</u> රජු දවස ය.

v. බුද්ධඝෝෂ හිමියන්ගේ මනදොළ පූරණය වූයේ <u>මනොරථපූරණී</u> ලිවීමෙන් පසුවය.

vi. විනය පිටකයට ලියන ලද අටුවාව වනුයේ <u>සමන්තපාදාසිකාව</u> යි.

vii. දීඝ නිකාය අටුවාව ලිවීම සඳහා ආරාධනා කරන ලද්දේ <u>දාඨානාග</u> හිමියන් ය.

viii. පරමත්ථදීපනී' නම් අටුවාව රචනා කරන ලද්දේ <u>ධම්මපාල</u> හිමියන් විසිනි.

ix. බණවර 84කින් සමන්විත වනුයේ <u>මනොරථපූරණී</u> අටුවාව යි.

x. 'විසුද්ධිමග්ග' ග්‍රන්ථය රචනා වීමට වස්තු බීජ වූ ගාථා ඇත්තේ <u>සංයුත්ත නිකායේ</u> ය.

02. පාලි අට්ඨකතා පිළිබඳව අවධානය යොමු කරමින් 'බුද්ධඝෝෂ මාහිමියන් වෙතින් පාලි සාහිත්‍යයට සිදු වූ සේවාව' පිළිබඳ වාක්‍ය රචනයක් ලියන්න.

(පහතින් ඇති ලිපිය උපුටා ගැන්මකි)

WWW.PIRIVENA.LK

ශ්‍රේෂ්ඨ අටුවාචාර්ය බුද්ධඝෝෂ ස්වාමීන්ද්‍රයන් වහන්සේ ව්‍යවහාරික වර්ෂ 5 වන සියවසේදී ලංකාවට වැඩම කරන ලද්දේ සිංහලෙන් තිබූ ත්‍රිපිටක ධර්මයන් පාලියට හැරවීම පිණිස නො වේ. එකලත් බුද්ධ භාෂිත ධර්ම විනය පැවතුනේ පාලි භාෂාවෙන් ම ය. මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට වැඩම කොට තථාගත ධර්ම විනය සිංහල භික්ෂූන්ට හැදෑරෙව්වේ, පාලි භාෂාවෙන් ම ය. එම ධර්ම විනයට අදාළ අර්ථ විස්තර සරල ලෙස දීප භාෂාවෙන් තෝරා දුන් සේක. එය 'හෙළ අටුවා' නමින් හැඳින්විණි. හෙළ අටුවා සිංහලෙන් පැවතුනු නිසා අනෙක් රටවල බෞද්ධයන්ට එම අටුවා කියවීමේ භාග්‍යය නොලැබී තිබුණි. එම නිසා එකල සම්බුදු දහම තේරුම් ගැනීමේ ජාත්‍යන්තර භාෂාව ලෙස ජනප්‍රිය වී තිබූ පාලි භාෂාවට, එම හෙළ අටුවා පරිවර්තනය කිරීමේ අවශ්‍යතාවයක් ඇති විය. ලෝකවාසී බෞද්ධ ජනතාවට, හෙළ අටුවා කියවීමේ අවස්ථාව සලසා දීම පිණිසය බුද්ධඝෝෂ හිමියන් විසින් එම හෙළ අටුවා පාළි භාෂාවට පරිවර්තනය කරන ලද්දේ.

එමෙන් ම බුද්ධඝෝෂ හිමියන්ට ඒ සඳහා තමන් තුළ ඇති සුදුසුකම් මහාවිහාරීය භික්ෂූන් ඉදිරියේ ඔප්පු කිරීමට සිදු විය. ඒ සඳහා ලාංකීය භික්ෂූන් වහන්සේලා බුද්ධි පරීක්ෂණයක් ලෙස ගාථාවක් ලබා දී එයට පිළිතුරු සපයන ලෙස බුද්ධඝෝෂ හිමියන්ට පැවරූහ. ඒ වෙනුවෙන් බුද්ධඝෝෂ හිමියන් සම්පාදනය කළ දහම් නිබන්ධනය 'විසුද්ධි මාර්ගය' ග්‍රන්ථය යි. ඒ පිළිබඳ ව සතුටු වූ මහා විහාරීය සංඝයා වහන්සේගෙන් අවසර ලැබුණු පසුවයි බුද්ධඝෝෂ ස්වාමීන්ද්‍රයන් වහන්සේ හෙළ අටුවා පාලියට පරිවර්තනය කරන ලද්දේ. එනමුත් වර්තමානයේ "බුද්ධඝෝෂ හිමියන් සිංහලෙන් තිබූ ත්‍රිපිටකය පාලියට පරිවර්තනය කොට විකෘති කළා." කියමින් මිථ්‍යා දෘෂ්ටික අසත්පුරුෂ පිරිසක් සිය පෞද්ගලික මතවාද සමාජගත කිරීමට උත්සාහ ගනිති. ඒ මිථ්‍යා මතය බැහැරලනු වස් බුද්ධඝෝෂ හිමියන් සිදු කළ සැබෑ ශාසනික මෙහෙය පහදා දීම මෙම ලිපියේ අරමුණයි.

අටුවාචාර්ය බුද්ධඝෝෂ ස්වාමීන්ද්‍රයන් වහන්සේ සිදු කළ ශාසනික මෙහෙය

දඹදිව බෝමැඩට නුදුරු ඝෝෂ නම් ග්‍රාමයේ බ්‍රාහ්මණ කුලයක උපත ලද බුද්ධඝෝෂ හිමියන්, වාදයෙහි දක්ෂ වූ රේවත නම් තෙරුන් වහන්සේ ළඟ පැවිදි වූ බව පිළිගත් මතය යි. බුද්ධඝෝෂ අටුවාචාරීන් වහන්සේ පිළිබඳ ව මහාවංශයෙහි සඳහන් වන්නේ මෙසේ ය. "එකල

WWW.PIRIVENA.LK

දඹදිව බෝමැඩ වෙත උපන් බ්‍රාහ්මණ මාණවකයෙක් විද්‍යා ශිල්ප කලා දන්නේ, ත්‍රිවේදයෙහි පරතෙරට ගියේ, මනා කොට දක්නා ලද සමය ඇත්තේ, සියලු වාදයන්හි විසාරද වූයේ, වාද කැටිව දඹදිව ඇවිදිමින් එක් විහාරයකට ඇවිත් රාත්‍රියෙහි පතංජල මතය සම්පූර්ණයෙන් මනා කොට පිරිවැහී ය. එහි රේවත නම් මහා ස්ථවිර කෙනෙක් ඒ අසා මේ පුද්ගල තෙමේ මහා නුවණැති කෙනෙකැයි දැන මොහු දමනය කළ යුතු යැයි සිතා 'මෙහි කොටළු හඬින් ඝෝෂා කරන්නේ කවරෙක්දැයි' ඇසී ය. හෙතෙම ඒ අසා 'කිමෙක්දැ කොටළු හඬෙහි අර්ථය ඔබවහන්සේ දන්නෙහිදැයි?' තෙරුන්ගෙන් විචාළ කල්හි 'මම දනිමි' යි උන්වහන්සේ කී සේක.

එකල තරුණයා උන්වහන්සේගෙන් ප්‍රශ්න විචාළේ ය. උන්වහන්සේ සියල්ල විසඳූ සේක. වැරදි තැන් ද ප්‍රකාශ කළ සේක. 'එසේ නම් ඔබගේ වාදය විස්තර කරන්නැයි' කී කල්හි තෙරුන් වහන්සේ අභිධර්ම පාඨයක් කීහ. තරුණයාට එය අවබෝධ නො වී 'මේ කාගේ මන්ත්‍රයක්දැ' යි පෙරළා විචාළේ ය. 'එය බුද්ධ මන්ත්‍රයක් ය' යි තෙරුන් වහන්සේ කීහ. 'එසේ නම් එය මට ඉගැන්වුව මැනවැ' යි බමුණු තරුණයා ඉල්ලූ කල්හි 'එසේ නම් පැවිදිව ඉගෙන ගනුව' යි තෙරණුවෝ කීහ. මාණවකයා ඒ අසා පැවිදිව මුළු ත්‍රිපිටකය ම ඉගෙන, එය ධර්මාවබෝධයට ඒකායන මාර්ගය යැයි පිළිගත්තේ ය. බුදුරදුන්ට මෙන් ගැඹුරු කටහඬක් ඇති හෙයින් උන්වහන්සේට 'බුද්ධඝෝෂ' යැයි නමක් ලැබිණ. එතුමන් වහන්සේගේ කීර්තිය හැම තැන පැතිර ගියේ ය." මහාවංශයෙහි එන මේ ප්‍රවෘත්තිය හැරුණු විට බුද්ධඝෝෂ හිමියන්ගේ චරිතාපදානය ගැන කරුණු, සියම් රටේ මංගල නම් තෙරනමක් විසින් රචිත බුද්ධඝෝසුප්පත්ති නම් ග්‍රන්ථයේ ද සඳහන් වේ.

බුද්ධඝෝෂ හිමියන් දඹදිව වසත්දී ම 'ඤාණෝදය' නම් ප්‍රකරණය ද අභිධර්ම පිටකයේ ධම්මසංගණී ප්‍රකරණයට 'අර්ථසාලිනී' නම් අටුවාව ද රචනා කොට අනතුරුව පිරිත් අටුවාව කරන්නට පටන් ගත්තේ ය. එය දුටු ආචාර්යපාද රේවත තෙරණුවෝ තම ශිෂ්‍ය වූ බුද්ධඝෝෂ හිමියන්ට මෙසේ පැවසී ය. "මෙහි පෙළ පමණක් පරම්පරානීත ය. මෙහි අටුවා නැත. එසේ ම නානාප්‍රකාර ආචාර්යවාදයෝ ද නොවෙති. තුන් සංගායනාවට නගන ලද බුද්ධ වචන ද ශාරිපුත්‍රාදී මහතෙරුන් වහන්සේලා වදාරණ ලද කථා මාර්ගය ද මොනවට බලා ප්‍රාඥ මිහිඳු මහතෙරුන් විසින් සිංහල භාෂාවෙන් කරන ලද ශුද්ධ වූ සිංහලාර්ථකථා තොමෝ සිංහලයන් කෙරෙහි වැටෙයි. තෙපි එහි

WWW.PIRIVENA.LK

ගොස් ඒ අසා මාගධී නිරුක්තියට (පාලි භාෂාවට) පෙරලව්. ඕ තොමෝ සියලු ලොවට හිත එලවන්නී වේ.'' (මහාවංශය, 37 පරිච්ඡේදය)

මේ අනුව එවකට ඉන්දියාව තුළ පැවතුනේ පරම්පරාවෙන් රැකගෙන පැවැත්වූ විනය, සූත්‍ර, අභිධර්ම යන පාලි ත්‍රිපිටකය පමණක් බව මැනැවින් පැහැදිලි වේ. එනමුත් බුද්ධකාලීන මහරහතන් වහන්සේලාගේ අර්ථ වර්ණනා ක්‍රමය එහි නොතිබුණු බවත්, මිහිඳු මහරහතන් වහන්සේ විසින් ලක්දිවට දායාද කළ එම අර්ථ වර්ණනා 'හෙළ අටුවා' ලෙසින් ආරක්ෂා වී තිබෙන්නේ ලංකාවේ බවත්, හෙළ බසින් තිබීම නිසා වෙනත් රටක කෙනෙකුට ඒවා ප්‍රයෝජනයට ගත නොහැකි බවත්, පාලි භාෂාවට හෙළ අටුවා පරිවර්තනය කළහොත් ජාත්‍යන්තර භාෂාවක් වන පාලි දත් ඕනෑම රටක කෙනෙකුට ඒවා භාවිත කරන්නට හැකි වන බවත් රේවත තෙරුන් පැවසූ බව ඉහත මහාවංශ පාඨයට අනුව ඉතා හොඳින් පැහැදිලි වේ. ඒ බව විශුද්ධි මාර්ග පුරාණ සන්නය කළ දෙවන පරාක්‍රමබාහු රජතුමා ද මෙසේ දක්වා ඇත. ''මේ ආචාර්යයෝ ජම්බුද්වීප වාස්තව්‍ය මහා ස්ථවිරයන් විසින් සමාරාධිතව හෙළ අටුවා පෙරළා සර්වජනීන මූල භාෂායෙන් තෙවළාවට අටුවා ලියනු සඳහා මේ ලංකාද්වීපයට වැඩ....'' යනුවෙනි. ඒ අනුව බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට පැමිණියේ හෙළ අටුවා පාලියට පරිවර්තනය කිරීම උදෙසා ය. එසේ නොමැතිව අද කරුණු නොදත් ඇතැමුන් පවසන්නාක් මෙන් ත්‍රිපිටකය පරිවර්තනය කිරීම උදෙසා නො වේ. කොටින් ම ත්‍රිපිටකය පරිවර්තනය කිරීමට අවශ්‍යතාවයක් නොතිබූ බවත්, ඒ වන විටත් ඉන්දියාවේ පාලි ත්‍රිපිටකය පැවති බවත් ඉහත විස්තරවලට අනුව සක්සුදක් සේ පැහැදිලි ය. 'බුද්ධඝෝෂ හිමියන් මෙහි පැමිණ බුදුන් වදාළ දෙලක්ෂ පන්සැත්තෑ දහස් දෙසියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් ඇති ආගමයට තුන්ලක්ෂ එක්සැටදහස් සත්සිය පනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් පමණැති අටුවා කථා ලියා ආගමයෙහි පහන් නැගූ සේකැයි දත යුතු' යැයි පූජාවලියේ ද සඳහන්ව තිබෙන්නේ එබැවිනි.

බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට පැමිණියේ අනුරාධපුරය රාජධානිය කර ගත් මහානාම රජ දවස ය. බුද්ධ වර්ෂ (953 – 975) අතර කාලයේ ය. උන්වහන්සේ ලංකාවට වඩින විට, අට්ඨ කථා සංහිතා කීපයක් ම මේ දිවයිනේ පැවති බවත් ඒවා හෙළ බසින් ම උගත් බවත්, මෙයින් සමහරක් ග්‍රන්ථ ස්වරූපයෙන් ද සමහරක් පූර්වාචාරීන්ගේ මතවාද

WWW.PIRIVENA.LK

ඇතුළත් වුණු සාහිත්‍ය වශයෙන් ද පැවති බවත් ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම් මහතා පවසයි.

හෙළ අටුවා යනු කුමක් ද?

තෘතීය දහම් සංගායනාව අවසානයේදී දඹදිව ථේරවාදාචරිය පරම්පරාවේ මොග්ගලීපුත්ත තිස්ස මහරහතන් වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය මිහිඳු මහරහතන් වහන්සේ විසින් තෘතීය සංගායනාවේදී සංග්‍රහ කළ, ථේරවාදී ත්‍රිපිටකය ශ්‍රී ලංකාවට ගෙන එන ලදී. මිහිඳු මාහිමියන් විසින් ලක්දිවට දායාද කළ පාලි ත්‍රිපිටකය මහා අරිට්ඨ මහරහතන් වහන්සේ ප්‍රමුඛ සිංහල මහරහතන් වහන්සේලා පාලි භාෂාවෙන් ම උගත් සේක. පාලියෙන් තිබූ ත්‍රිපිටකයේ ගැඹුරු තැන්වල අර්ථය සිංහල ජනතාවට පැහැදිලි කර දීම අවශ්‍ය විය. බුද්ධ කාලයේ සිට වාචනා මාර්ගයෙන්, ආචාර්ය පරම්පරාවලින් පැවත ආ අර්ථ විවරණ ක්‍රම මිහිඳු මාහිමියන් හෙළ බසින් පහදා දුන් සේක. ඒවා උගත් සිංහල භික්ෂූන් වහන්සේලා ත්‍රිපිටකයේ ගැඹුරු තැන් හෙළ බසින් අරුත් විවරණය කළ සේක. හෙළ අටුවා නමින් හැඳින්වූයේ ඒවායි. එනම් අටුවා වනාහි ත්‍රිපිටකයට අයත් පොත් වහන්සේලාට ලියා ඇති ව්‍යාඛ්‍යාන සංග්‍රහ (අර්ථ විවරණය කිරීම්) සමූහය යි. අටුවාවල පරමාර්ථය පෙළෙහි ඇති දුරවබෝධ වචන සහ ධර්මයේ ගැඹුරු තැන් විස්තර කිරීමත්, අවශ්‍ය අවස්ථාවල දී විස්තරාර්ථ සැපයීමත් ය. “භාග්‍යවතුන් වහන්සේගේ අදහස අනුව ගොස් ඒ ඒ ධර්ම පාඨයන්ගේ අර්ථය විස්තර කරයි, මැනවින් විස්තර කරයි. ඒ ඒ අර්ථයන්ගේ විස්තර කිරීම, මැනවින් විස්තර කිරීම සිදු කරන බැවින් අට්ඨකථා යනුවෙන් පවසනු ලැබේ.” යැයි වජිරබුද්ධි ටීකාවෙහි සඳහන් වන්නේ එබැවිනි. (භගවතෝ අධිප්පායං අනුගන්ත්වා තං තං පාඨේ අත්ථං භාවයති විභාවයති, තස්ස තස්ස වා අත්ථස්ස භාවනා විභාවයනන්ති අනුභවෝ වුච්චති අට්ඨකථා)

බුදුකැලි අටුවා

අප භාග්‍යවතුන් වහන්සේගේ ළය මඬලින් උපන්නා වූ, ධර්මයෙන් උපන්නා වූ සාරිපුත්ත, මහා කස්සප, මහා කච්චාන, ආනන්ද ආදී පටිසම්භිදාලාභී මහා නුවණැති නිකෙලෙස් මහෝත්තමයන් වහන්සේලා ශාස්තෘන් වහන්සේ විසින් පෙන්වා දෙන ලද නය ක්‍රමයෙහි පිහිටා සිටිමින්, ත්‍රිපිටක ධර්මය පිළිබඳ අර්ථ වර්ණනා කළ සේක. එහෙත් එම අටුවා ත්‍රිපිටක බුද්ධ වචනය පිළිබඳ අර්ථ

WWW.PIRIVENA.LK

වර්ණනාවක් බැවින් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද ත්‍රිපිටක පාලියෙන් එය වෙන් කොට තබන ලද බව 'සමන්ත පාසාදිකාවෙහි' මෙසේ සඳහන් වේ. 'ආචාර්යවාදය යනු ප්‍රථම ධර්ම සංගායනාව සිදු කළ පන්සියයක් මහරහතන් වහන්සේලා විසින් තබන ලද, ත්‍රිපිටක බුද්ධ වචන පාලියෙන් වෙන් වූ, බැසගත් විනිශ්චය පවතින්නා වූ අටුවාව යි.' (ආචරියවාදෝ නාම ධම්මසංගාහකේහි පඤ්චහි අරහන්තසතේහි ඨපිතා පාලිවිනිම්මුත්තා ඔක්කන්තික විනිච්ඡයප්පවත්තා අට්ඨකථා තන්ති). තව ද සුමංගල විලාසිනී නම් දීඝ නිකාය අටුවාවේ ද මෙසේ සඳහන් වේ. 'අටුවාව යනු ආචාර්යවාදය යි' (ආචරියවාදෝ නාම අට්ඨකථා). මිළිඳු රාජ ප්‍රශ්නයෙහි මේ ආචරියවාදය හඳුන්වා ඇත්තේ 'ආචරියවංස' යනුවෙන් වන අතර, අනුරාධපුර යුගයේ ලියැවුණු ධම්මපදයට කළ අටුවා සන්‍යයේ එය 'බුදුකැලි අටුවා' හෙවත් බුද්ධකාලීන අටුවා නමින් හඳුන්වා තිබේ. බුද්ධ කාලයේදී ත්‍රිපිටක පාලිය වෙනම ද ත්‍රිපිටක අර්ථ වර්ණනාව වෙනම ද ශ්‍රාවකයන් විසින් ඉගෙනගෙන තිබේ. ත්‍රිපිටකයේ බොහෝ තැන්වල සඳහන් වන 'උද්දේස පරිපුච්ඡා' යන ධර්මය හැදෑරීම පිළිබඳව යෙදෙන වචන දෙක ඊට උදාහරණයන් ය. 'උද්දේසය යනු ත්‍රිපිටක පාලිය ඉගෙනීම යි. පරිපුච්ඡාව යනු එහි අර්ථ අස්වා ගැනීම යි' කියා සමන්තපාසාදිකා ග්‍රන්ථයේ සඳහන් වේ. (උද්දේසති පාළි පරියාපුනනේ, පරිපුච්ඡායති අත්ථ සවණේ) තව ද බුද්ධානුබුද්ධ මහරහතන් වහන්සේලා විසින් සිදු කරන ලද අර්ථ වර්ණනාවත් සංගායනා තුනේදී ම සංගායනාවට පාත්‍ර කොට තිබේ. 'අර්ථය ප්‍රකාශ කරනු පිණිස මුල දී පන්සියයක් රහතන් වහන්සේලා විසින් සංගායනාව කරන ලදුව පසුවත් අනුසංගායනාව කරන ලද යම් අට්ඨකථාවක් වේ ද....' – (අත්ථප්පකාසනත්ථං අට්ඨකතා ආදිතෝ වසීසතේහි පඤ්චහි යා සංගීතා අනුසංගීතා ච පච්ඡාපි). (සාරත්ථප්පකාසිනී)

භාග්‍යවතුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් වසර 236කට පසු අපගේ මාතෘභූමියට වැඩි අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ ලක්වැසියන් හට පාලියෙන් ත්‍රිපිටක ධර්මය ද එකල ලක්දිව ජනයාගේ බස වූ දීප භාෂාවෙන් අට්ඨකථාව ද ඉගැන්වූ සේක. ඒ අනුව ලක්දිවට බුද්ධකාලීන ත්‍රිපිටක අර්ථ වර්ණනාව වූ අටුවාව ද දායාද වූයේ මිහිඳු මාහිමියන් වහන්සේගෙන් ම වන අතර ඒ බව සාරත්ථප්පකාසිනී නම් ග්‍රන්ථයේ මෙසේ සඳහන් වේ.

'ඉක්බිතිව මිහිඳු මහරහතන් වහන්සේ විසින් සීහල දීපයට (ඒ අට්ඨකථාව) ගෙනෙන ලදී. සිංහල දීපවාසීන්ගේ ප්‍රයෝජනය පිණිස (එය) සිංහල භාෂාවෙන් තබන ලදී.' (සීහලදීපං පන ආභතා'ථ වසිනා මහා මහින්දේන ඨපිතා සීහල භාසාය දීපවාසීනමත්ථාය) එතැන් පටන් ලාංකේය භික්ෂූන් වහන්සේලා ත්‍රිපිටක බුද්ධ වචන පර්යාප්තිය සේ ම රහතුන්ගේ අර්ථ විවරණය වූ අටුවාව ද මහත් ගෞරවයෙන් යුතුව වනපොත් කළහ (කට පාඩමින් දරා ගත්තාහු ය). වළගම්බා රාජ සමයේ දී මාතලේ අලුවිහාරයේ දී, ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමේ දී අට්ඨකථාව ද ග්‍රන්ථාරූඪ කරන ලද බව මහාවංශයේ සඳහන් වේ. 'ත්‍රිපිටක පාලිය ද එහි අර්ථකථාව ද මහා ප්‍රඥා ඇති පූර්වික භික්ෂූහු මුඛපාඨයෙන් ගෙන ආවෝ ය. එකල්වැසි වූ භික්ෂූහු සත්වයන්ගේ පරිහානි දැක ධර්මයාගේ චිරස්ථිති පිණිස පොත්හි ලියවූහ.'

පිටකත්තය පාළිඤ්ච – තස්සා අට්ඨකථාපි ච
මුඛපාඨේන ආනේසුං – පුබ්බේ භික්ඛූ මහාමතී

හානිං දිස්වාන සත්තානං – තදා භික්ඛූ සමාගතා
චිරට්ඨිතත්ථං ධම්මස්ස – පොත්ථකේසු ලිඛාපයුං"

(මහාවංශය, 33 පරිච්ඡේදය)

මෙසේ ග්‍රන්ථාරූඪ කරන ලද අට්ඨකථා ග්‍රන්ථ හෙළ අටුවා නම් වේ.

රේවත මහ තෙරුන් වහන්සේ බුද්ධඝෝෂ හිමියන්ට ලංකාවට වැඩම කොට පාලි භාෂාවට නඟන ලෙස දක්වා සිටියේ පොත්ථක සංගීතියේ දී ග්‍රන්ථාරූඪ වූ එම හෙළ අටුවාවන් ය. එබඳු හෙළ අටුවා තුනක් තිබූ බව සඳහන් වේ. එනම් 'මහා අට්ඨ කථාව, මහා පච්චරිය, කුරුන්දිය' යන මේ හෙළ අටුවා තුන ලෙස සමන්තපාසාදිකාවේ සඳහන් වන ග්‍රන්ථ 3 යි.

(මහා අට්ඨකථඤ්ච – මහා පච්චරිමේව ච,
කුරුන්දිඤ්චාති තිස්සෝපි – සීහලට්ඨකථා ඉමා)

1) මහා අට්ඨකථාව

WWW.PIRIVENA.LK

හෙළ අටුවා අතුරින් ප්‍රමුඛ ස්ථානය දැරුවේ මහා අට්ඨකථාව හෙවත් මූල අට්ඨකථාව යි. බුද්ධඝෝෂ හිමියන්ගේ අට්ඨ කථා සියල්ලට ම පාහේ මූලිකව පාදක කරගෙන ඇත්තේ මෙම අටුවාව යි. තුන් පිටකයට ම අයත් අට්ඨකථාවන්හි මහා අට්ඨකථාව ගැන සඳහන් වන නිසා එය තුන් පිටකය ම අලලා සකස් වුණු හෙළ අටුවාවක් බව පැහැදිලි වේ. වස්තු විෂය අතින් සෙසු හෙළ අටුවාවන්ට වඩා පරිපූර්ණ වී තිබුණු මහා අට්ඨකථාවේ ලක්දිව සිදුවීම් පිළිබඳ ව බොහෝ වෘත්තාන්ත ද සඳහන් ව තිබුණු බවට නිදසුන් බොහෝ ය.

2) මහාපච්චරිය අට්ඨකථාව

මෙය පහුරක් මත හිඳගෙන ලියන ලද බැවින් ඒ නමින් හැඳින්වූ බව සාරත්ථදීපනියේ සඳහන් වේ. සද්ධම්ම සංග්‍රහයට අනුව මෙය අභිධර්ම පිටකය උදෙසා කරන ලද හෙළ අටුවාව යි.

3) කුරුන්දි අට්ඨකථාව

කුරුන්දිවේලු නම් විහාරයේදී රචනා කරන ලද බැවින් එනමින් හඳුන්වන ලද අතර සද්ධම්ම සංග්‍රහයට අනුව මෙය විනය පිටකයේ හෙළ අටුවාව යි.

මීට අමතරව හෙළ අටුවා නොවන අන්ධක, චූල පච්චරිය, අරිය, සංඛේප නම්වලින් යුතු අටුවා කිහිපයක් ද පැවති බව සමන්තපාසාදිකාවේත්, වජිරබුද්ධි ටීකාවේත් සඳහන් වේ.

හෙළ අටුවා පාලියට පරිවර්තනය කිරීම පිණිස බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට වැඩම කළේ මහානාම රාජ සමයේ දී ය. (ව්‍ය. ව. 409-431) එසේ වැඩම කොට පළමුව හෙළ අටුවා තුන ඉගෙනගත් බව සමන්තපාසාදිකාවෙහි සඳහන් වේ.

“(ඒ හෙළ අටුවා) යසස් ඇති, විනය දන්නා වූ, ප්‍රාඥ වූ බුද්ධමිත්‍ර නමින් ප්‍රසිද්ධ වූ තෙරුන්ගේ සමීපයෙහිදී අසා ඉගෙනගෙන….”

(බුද්ධමිත්තෝති නාමේන – විස්සුතස්ස යසස්සිනෝ විනයඤ්ඤුස්ස ධීරස්ස – සුත්වා ථේරස්ස සන්තිකේ)

WWW.PIRIVENA.LK

දෙවන පරාක්‍රමබාහු රජු වාර්තා කර ඇති ආකාරයට ඉන් පසු සිදු වී ඇත්තේ මෙය යි. "බුද්ධඝෝෂ තෙරුන් සියලු ස්ථවිරවාද ඉගෙන මහා සංඝයා රැස්කොට අටුවා ලියන්නට පොත් දෙන්නේ යැයි ඉල්ලූ සේක. සංඝයා ද අර්ථ කථා කරනුවට ශක්ති පරීක්ෂා සඳහා තොපගේ සාමාර්ථය මිහි දක්වව. ඒ දැක පොත් දෙම්හයි මේ ගාථා දෙක දුන්හ. එසඳ තදර්ථවර්ණනාද්වාරයෙන් එහි අටුවා සහිත පිටකත්‍රය සංග්‍රහ කොට මේ විසුද්ධිමාර්ගය කළහ යනු පරම්පරාගත වාර්තා යි."

සංඝපාල මහතෙරුන් ප්‍රමුඛ මහාවිහාරීය සංඝයා අටුවා පරිවර්තනය කිරීම උදෙසා බුද්ධඝෝෂ හිමියන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීම උදෙසා ලබා දුන් ගාථා දෙක සංයුත්ත නිකායේ ජටා සූත්‍රයේ සඳහන් ගාථා දෙක ය. ඉන් පසු උන්වහන්සේ,

"සීලේ පතිට්ඨාය නරෝ සපඤ්ඤෝ – චිත්තං පඤ්ඤං ච භාවයං – ආතාපි නිපකෝ භික්ඛු – සෝ ඉමං විජටයේ ජටං"

යන ගාථා රත්නය විස්තර කරමින් ප්‍රශස්ත විසුද්ධි මාර්ගය රචනා කොට මහා සංඝයාට ඉදිරිපත් කළ සේක. "ඉක්බිති හේ තෙමේ බුද්ධ සමයෙහි බුහුටි සංඝයා රැස්කොට මහ බෝ වෙත එය කියවන්නට පටන් ගත. එකල සංඝ තෙමේ වෙසෙසින් තුටු පහටු වූයේ නිසැකින් ම මේ තෙමේ මෛත්‍රී බෝසත්හු යැයි නැවත නැවත කියා අටුවා සහිත පිටකත්‍රයෙහි පොත් දින. එකල්හි උන්වහන්සේ මහා විහාරබද දූරසංකර ග්‍රන්ථාකාර පිරිවෙණ වෙසෙමින් සියලු සිංහල අටුවා කතා සියල්ලන්ගේ මූල භාෂා වූ මාගධ නිරුක්තියෙන් පැවැත්වූ සේක. සර්වභාෂික ඕ තොමෝ හිත පිණිස වී. සියලු ථේරීය ආචාරීහු එය පෙළ සෙයින් ම පිළිගත්හු" (මහාවංශය – 37 පරිච්ඡේදය)

එසේ නම් සංස්කාරකයෙකු හා අනුවාදකයෙකු වශයෙන් බුද්ධඝෝෂ හිමියන්ගේ කාර්යය වූයේ තමන්ට ලබා දුන් හෙළ අටුවාවන්හි අන්තර්ගත වූ විවරණයන් වෙනස් කිරීම නොව ඒවා මනාව සකස් කිරීම සහ අවශ්‍ය ස්ථාන පිඩු කරමින්, අවශ්‍ය ස්ථානවල දී විස්තරාර්ථ දක්වමින් විධිමත් ව සුගම ව පාලි භාෂාවට නැගීම යි. බුද්ධඝෝෂ හිමියන්ට අට්ඨකථා සකස් කරන්නට මහා විහාරයෙන් අවසර ලැබුණේ 'මහා විහාර වාචනා මාර්ගයට විරුද්ධ මත ඒවායේ ඇතුළත් නොවිය යුතු ය.' යන කොන්දේසිය ද සහිතව ය. තව ද 'එම අර්ථ කථාවලින් භාෂාන්තරය පමණක් අත්හැර විස්තර තැන් පිඩු කොට සියලු ම විනිශ්චයන් ඇතුළත් කොට කිසිම තන්හි යුත් අයුත්

WWW.PIRIVENA.LK

නොඉක්මවා සංවර්ණනා කරන්නෙමු’ යි කියා බුද්ධඝෝෂ හිමියෝ පවසති. බුද්ධඝෝෂ හිමියන් විසින් කරන ලද අට්ඨකථා සියල්ල ම මිහිඳු මාහිමියන් විසින් ලක්දිවට ගෙන එන ලදුව මහා විහාරික සංඝයා විසින් ආරක්ෂා කරනු ලැබූ හෙළ අටුවාවන්හි පාලි අනුවාද බවත්, මහා අට්ඨකථාවේ සාරය ගෙන පාලි අට්ඨකථා රචිත බවත් එම අට්ඨකථාවල ම සඳහන් වේ. මේ ක්‍රමයෙන් බුද්ධඝෝෂ හිමියන් විසින් පාලියට නැගූ අටුවා සංඛ්‍යාව 13කි.

බෞද්ධ අට්ඨකථාචාරීන් අතුරින් උන්වහන්සේ ශ්‍රේෂ්ඨතමයා යි. උන්වහන්සේ විසින් කරන ලද්දේ බුදු දහම පිළිබඳ අමුතුවෙන් පොත් ලිවීම නොව හෙළ අටුවාවන් විධිමත් ව, සුගම ව පාලියට පරිවර්තනය කිරීම බව ඉතා ම පැහැදිලි ය. ‘බුද්ධඝෝෂ හිමියන් ත්‍රිපිටක පරිවර්තනයක් සිදු කළේ ය’ යන්න කිසිදු ඓතිහාසික මූලාශ්‍රයකින් සනාථ කළ නොහැකි මිථ්‍යා ප්‍රලාපයකි. අටුවාව පාලියට පරිවර්තනය කිරීමට පවා තමන්ගේ දක්ෂතාව ඔප්පු කොට පෙන්වා මහා විහාරයෙන් අවසර ගන්නට උන්වහන්සේට සිදු විය. පරීක්ෂණයකින් පසුව පැහැදීමට පත් වූ මහා විහාරවාසී සංඝයා අටුවා පරිවර්තනයට අවසර ලබා දුන්නේ එය ලෝකයාට ප්‍රයෝජනවත් වන බව හැඟී ගිය නිසා ම ය. අවසර ලැබුණු පසුවත් බුද්ධඝෝෂ හිමියන්ට අටුවා පරිවර්තනය කරන්නට සිදු වූයේ මහා විහාරික සංඝයාගේ ආශීර්වාදය යටතේ බව ‘මහා විහාරවාසීන්ගේ විනිශ්චයන් නොඉක්මවන බව’ හැම අටුවාවක ම පාහේ උන්වහන්සේ විසින් සඳහන් කොට තිබීමෙන් ම පැහැදිලි වේ. එබඳු තියුණු විමසිල්ලකින් යුතුව වැඩ සිටි මහාවිහාරවාසී උතුමන් ත්‍රිපිටක බුද්ධ වචනය වෙනස් කිරීමට කිසිවෙකුට හෝ ඉඩ ලබා දී සිටියා යැයි සිතීම ම බලවත් මෝඩකමකි.

වර්තමානයේ මෙන් හිතුමනාපේ ධර්මය ලිවීමට හෝ විකෘති කිරීමට කිසිදු ඉඩක් ඒ යුගයේ නොතිබුණි. අද දක්වාත් ත්‍රිපිටකය නිර්මල ව පවතින්නේ ඒ උතුමන් වහන්සේලා ගත් දූරදර්ශී ක්‍රියාමාර්ග නිසා ම ය. එබැවින් බුද්ධඝෝෂ හිමියන් සිදුකරන ලද්දේ හෙළ අටුවා පාලියට පරිවර්තනය කිරීම බව මනාව වටහාගෙන, උන්වහන්සේ ත්‍රිපිටක ධර්මය විකෘති කළා යැයි ඇතැමුන් කුමන්ත්‍රණකාරී ව පතුරුවන අසත්‍ය ප්‍රලාපයන්ට කිසිවකුත් නොරැවටෙත්වා…!

බුද්ධඝෝෂ හිමියන් විසින් පාලියට නොනඟන ලද අට්ඨකථා පාලියට නගන ලද්දේ බුද්ධදත්ත, ධම්මපාල, උපසේන සහ මහනාම යන තෙරවරුන් විසින් ය.

WWW.PIRIVENA.LK

බුද්ධදත්ත හිමි : බුද්ධඝෝෂ හිමියන්ගේ සමකාලීන හිමිනමක් වූ උන්වහන්සේ මධුරත්ථ විලාසිනී නම් බුද්ධවංශ අටුවාව රචනා කර ඇත.

උපසේන හිමි : සද්ධම්මජෝතිකා නම් නිද්දේශ අට්ඨකථාව මහා පරිවේණවාසී උපසේන හිමියන් විසින් කරන ලදී.

මහානාම හිමි : පටිසම්භිදාමග්ග අට්ඨකථාව වන සද්ධම්මප්පකාසනිය උන්වහන්සේ විසින් ලියන ලදී.

ධම්මපාල හිමි : පරමත්ථදීපනී අට්ඨකතා උදාන – ඉතිවුත්තක, විමාන වත්ථු, ප්‍රේත වත්ථු, ථේර ථේරී ගාථා අට්ඨකථා ලියන ලද්දේ මේ හිමියන් ය.

මෙම අට්ඨකථාවන් ඉගෙනගෙන ඒවා ආරක්ෂා කළ අය ‘අට්ඨකථිකා’ නමින් හඳුන්වා ඇත. ‘අට්ඨකථාචරියා’ යනු අට්ඨකථා සම්පාදනය කළ ආචාර්යවරු ය. ආචරියවාද, ආචරිය මත යන නම්වලින් කියැවෙන්නේ ද අට්ඨකතාවන් ගැන ම ය. විශේෂයෙන් ම මෙම අට්ඨකථාවන්හි සඳහන් ධර්ම විනය කාරණා භාග්‍යවතුන් වහන්සේගේ සූත්‍ර දේශනාවල බහා බලා, (සුත්තේ ඕතාරේතබ්බෝ) ශාස්තෘන් වහන්සේගේ විනය පැනවීම් සමඟ සසඳා බලා (විනයේ සන්සන්දිතබ්බෝ) ගැළපේ නම් පිළිගන්නා ලෙසත්, නොගැළපේ නම් බැහැර කරන ලෙසත් ශ්‍රේෂ්ඨ අටුවාචාර්ය බුද්ධඝෝෂ ස්වාමීන්ද්‍රයන් වහන්සේ ම නිර්දේශ කොට තිබේ.

අටුවා විස්තරය :-

අභිධර්ම පිටකය	අටුවාව	කර්තෘ
ධම්මසංගණිප්පකරණ	අත්ථසාලිනී	බුද්ධඝෝෂ හිමි
විභංගප්පකරණ	සම්මෝහවිනෝදනී	බුද්ධඝෝෂ හිමි
කථාවත්ථුප්පකරණ	පරමත්ථදීපනී පඤ්චප්පකරණ අට්ඨකථා	බුද්ධඝෝෂ හිමි
පුග්ගලපඤ්ඤත්ති		
ධාතුකථා		
යමකප්පකරණ		
පට්ඨානප්පකරණ		

WWW.PIRIVENA.LK

විනය පිටකය පෙළ		අටුවාව	කර්තෘ
උභය විභංග	1. පාරාජිකා පාලි 2. පාචිත්තිය පාලි	සමන්තපාසාදිකා විනය අට්ඨකථා	බුද්ධඝෝෂ හිමි
ඛන්ධක	3. චුල්ලවග්ග පාලි 4. මහාවග්ග පාලි	සමන්තපාසාදිකා විනය අට්ඨකථා	බුද්ධඝෝෂ හිමි
පරිවාර	5. පරිවාර පාලි භික්ඛු පාතිමොක්ඛ භික්ඛුණී පාතිමොක්ඛ	කංඛා විතරණී මාතිකට්ඨ කථා	බුද්ධඝෝෂ හිමි

සූත්‍ර පිටකය පෙළ	අටුවාව	කර්තෘ
දීඝ නිකාය	සුමංගලවිලාසිනී	බුද්ධඝෝෂ හිමි
මජ්ඣිම නිකාය	පපඤ්චසූදනී	බුද්ධඝෝෂ හිමි
සංයුත්ත නිකාය	සාරත්ථප්පකාසිනී	බුද්ධඝෝෂ හිමි
අංගුත්තර නිකාය	මනෝරථපූරණී	බුද්ධඝෝෂ හිමි
ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ		
ඛුද්දක පාඨ	පරමත්ථජෝතිකා	බුද්ධඝෝෂ හිමි
ධම්මපද	ධම්මපදට්ඨ කථා	බුද්ධඝෝෂ හිමි
උදාන	පරමත්ථදීපනී	ධම්මපාල හිමි
ඉතිවුත්තක	පරමත්ථදීපනී	ධම්මපාල හිමි
සුත්තනිපාත	පරමත්ථජෝතිකා	බුද්ධඝෝෂ හිමි
විමාන වත්ථු	පරමත්ථදීපනී	ධම්මපාල හිමි
පේත වත්ථු	පරමත්ථදීපනී	ධම්මපාල හිමි
ථේර ගාථා	පරමත්ථදීපනී	ධම්මපාල හිමි
ථේරී ගාථා	පරමත්ථදීපනී	ධම්මපාල හිමි
ජාතක	ජාතකට්ඨ කථා	බුද්ධඝෝෂ හිමි
නිද්දේස (චුල්ල - මහා)	සද්ධම්මජෝතිකා	උපසේන හිමි
අපදාන (ථේර - ථේරී)	විසුද්ධජනවිලාසිනී	මහානාම හිමි
පටිසම්භිදා මග්ග	සද්ධම්මප්පකාසිනී	ධම්මපාල හිමි
බුද්ධවංස	මධුරත්ථප්පකාසිනී	බුද්ධදත්ත හිමි
චරියා පිටක	පරමත්ථදීපනී	ධම්මපාල හිමි
නෙත්තිප්පකරණ	නෙත්ති අට්ඨකථා	ධම්මපාල හිමි
චතුභාණවාර පාළි	චතුභාණවාර අට්ඨකථා	ආනන්දවනරතන හිමි

WWW.PIRIVENA.LK

අභ්‍යාස

01. නිවැරදි පිළිතුර යටින් ඉරි අඳින්න.

i. දිඹුලාගල කාශ්‍යප මාහිමියන් වැඩ සිටියේ (<u>දිඹුලාගල</u>/ මහාවිහාරය/අභයගිරිය) ආරණ්‍යයේ ය.

ii. උන්වහන්සේගේ යුග කාර්යභාරය සමාන වනුයේ (<u>බුද්ධඝෝෂ මාහිමි</u>/ මහානාම මාහමි/ වැලිවිට සරණංකර නාහිමි) ට ය.

iii. පොළොන්නරු යුගයේ දී පාලි සාහිත්‍යයට එක් වූ සාහිත්‍යාංගය වනුයේ (ප්‍රකරණ/ <u>ටීකා</u>/ අටුවා) සාහිත්‍යය යි.

iv. මහාකාශ්‍යප මා හිමියන් හැඳින්වූ අභිධානයක් වනුයේ (සාගරමති/ <u>සංඝ පරිණායක</u>/ සංඝරාජ) යන්නයි.

v. බුද්ධඝෝෂ මා හිමියන් හැරුණු විට වැඩිම පාලි ග්‍රන්ථ සංඛ්‍යාවක් ලියන ලද්දේ (<u>ශාරිපුත්‍ර/</u> ධම්මපාල/ සංඝරක්ඛිත) මාහිමිපාණෝ ය.

පිළිතුරු සපයන්න.

i. දිඹුලාගල කාශ්‍යප මාහිමියන්ට පෙර පොළොන්නරු රාජධානියේ ස්වභාවය කෙටියෙන් පැහැදිලි කරන්න.

- රාජ රාජ, රාජේන්ද්‍ර ආදි චෝලයන් නිසා අනුරාධපුර රාජධානිය විනාශ වී පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය වී පැවතුණේ ය. එසේම දකුණු ඉන්දීය බලපෑම දැඩිව පැවතුණි.
- බොහෝ විහාරාරාම විනාශ වී පැවතුණු අතර විජයබාහු රජු ඒවා ප්‍රතිසංස්කරණය කර තිබිණි.
- ශාසනික වශයෙන් නිකාය සාමග්‍රියට හානි වී තිබිණි.
- මූලායතනවලින් සිදුවන කාර්යභාරය අවම වී තිබිණි.
- රජවරුන්ගේ ඇතැම් අමනෝඥ ක්‍රියා නිසා භික්ෂූන් වහන්සේලා විහාර අතහැර ගියහ. (විජයබාහු රජුගෙන් පසු කාලයේ දී)
- විනය කර්මය කිරීමට උපසම්පදාලාභී භික්ෂූන් වහන්සේලා සොයා ගැනීමට අපහසු විය.

WWW.PIRIVENA.LK

ii. මහාපරාක්‍රමබාහු රජතුමා සිදු කළ ශාසනික සේවාවන් 02ක් ලියන්න.

- භේදභින්නව සිටි භික්ෂූන් වහන්සේලා සමගි කරවීම
- දුශ්ශීලයන් සසුනින් බැහැර කිරීම
- විහාරාරාම ප්‍රතිසංස්කරණය

iii. දිඹුලාගල කාශ්‍යප මාහිමියන් විසින් රචිත ග්‍රන්ථ 3ක නම් ලියන්න.

- අභිධම්මත්ථපුරාණ ටීකාව
- චාන්ද්‍රව්‍යාකරණය
- මොහවිච්ඡේදනී
- අනාගතවංසය

iv. උන්වහන්සේ පිළිබඳ තොරතුරු සඳහන් වන මූලාශ්‍රය ග්‍රන්ථ 02ක නම් ලියන්න.

- සාරත්ථදීපනී නම් විනය ටීකාවේ
- මහාවංසයේ
- පොළොන්නරු සෙල්ලිපියේ

v. දිඹුලාගල කාශ්‍යප මාහිමි ඇති කළ ශිෂ්‍යයන් උන්වහන්සේලා නම්කොට උන්වහන්සේ ලියූ ග්‍රන්ථ දෙක බැගින් ලියන්න.

අභ්‍යාස

01. කෙටි පිළිතුරු ලියන්න.

i. බුද්ධදත්ත නාහිමියන්ගේ පැවිදි ආචාර්ය උපාධ්‍යයෝ කවරහු ද?

ශ්‍රී ධර්මාධාර හිමිපාණන් හා දොඩම්දූවේ පියරතනතිස්ස හිමියන්

ii. උන්වහන්සේ බුරුමයට යෑමට පෙර සම්පූර්ණයෙන් කටපාඩම් කොට තිබූ පොත් මොනවා ද?

WWW.PIRIVENA.LK

පාලි වරනැගිල්ල, බාලාවතාරය, ධාතුමඤ්ජුසාව, පාලි නිඝණ්ඩුව, ධම්මපදය, සතිපට්ඨාන සූත්‍රය, වුත්තෝදය, අභිධම්මත්ථසංගහය, අභිධම්මමාතිකා

iii. බුරුමයේ දී උන්වහන්සේ වැඩ සිටි විහාරයේ නම කුමක් ද? එය පිහිටා තිබුණේ කොහි ද?

සුවණ්ණමණිවිජ්ජෝතරතනසීමාරාම විහාරයේ

iv. බුද්ධදත්ත නාම්හි ලියූ මුල්ම කෘතිය කුමක් ද? එවිට උන්වහන්සේගේ වයස කීය ද?

අභිධර්ම මාතෘකා ස්වරූපය, වයස 18කි.

v. උන්වහන්සේ බුරුමයේ දී ලියූ පාලි පොත් දෙකක නම් ලියන්න.

පාලි නිඝණ්ඩුව (බුරුම බසින් සන්නයක් ද සහිතව), පාලිභාසපපවෙසිනී, රසවාහිනිය මහපිරිත්පොත හා විමුක්ති සංග්‍රහය බුරුම බසින් ලිවීම

vi. කළුවරේ සිට අභිධර්මය උගන්වන ක්‍රමවේදය හඳුන්වන්නේ කිනම් නමකින් ද?

රාත්‍රිවාරය

vii. බණ අසන විට ඉඳින ආකාරය පිළිබඳ ව විස්තර කොට ලියූ පොත කුමක් ද?

ගාරවාගාරවවිනිච්ඡය

viii. 'හෙ සිරිමාවාදය' නමැති පොත ලිවීමට හේතුව කුමක් ද?

සිරිමා යන පදය හෙ යන නිපාතය සමග යෙදීම නිසා ලක්මිණි පහන කර්තෘවරයා උසස් පදවිය සඳහා 'හෙ' යන නිපාතය යෙදීම නොගැළපෙන්නක් බව, නීචාර්ථයක් එමගින් ගම්‍ය වන බවත් දක්වා වාදයක් කළ අතර ඊට පිළිතුරු ලෙස මෙය ලියා ඇත.

ix. පාලි භාෂාව නගා සිටුවීමට උන්වහන්සේ ලියූ ග්‍රන්ථ 05ක නම් පාඩමෙන් තෝරා ලියන්න.

ත්‍රිභාෂාරත්නාකරය, පාලි භාෂාවතරණය කාණ්ඩ 1,2,3, පාළි පාඨාවලී, පඨමපාඨාවලි, පාළි සිංහල අකාරාදිය, ථෙරවාදී බෞද්ධාචාර්යයෝ, භාරතීය බෞද්ධාචාර්යයෝ, හියුංසියං භ්‍රමණවෘත්තාන්තය, පාලි වාක්‍ය විවේචනය

WWW.PIRIVENA.LK

අභ්‍යාසය

i. රීස් ඩේවිඩ්ස් ශ්‍රීමතාණෝ උපත ලද්දේ කොහි ද?

එංගලන්තයේ කොල්චෙස්ටර් හි දී ය.

ii. ඔහු පාලි බස ඉගෙනීමට හේතු වූ සිද්ධිය කුමක් ද?

නීතිඥයෙකු ලෙස කටයුතු කළ ඔහුට ලංකාවේ ගාල්ල ප්‍රදේශයේ විහාරයක දේපළක් පිළිබඳ නඩුවක දී පාලි ලියවිල්ලක් ඉදිරිපත් වීම, එම ලියවිල්ල කියවා තේරුම් ගැනීමට සමතෙකු නොවීම, අපූරු බස ඉගෙන ගැනීමේ ආශාව

iii. ලක්දිව දී ඔහුට පාලි බස ඉගැන්වූ ගුරුවරුන් දෙදෙනෙකුගේ නම් ලියන්න.

හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමිපාණෝ

යාත්‍රාමුල්ලේ ධර්මාරාම හිමිපාණෝ

iv. ඔහු විසින් ලියන ලද 'බුද්ධ ධර්ම සංග්‍රහය' ග්‍රන්ථයේ ඇති වැදගත්කම කුමක් ද?

ක්‍රිස්තියානි නොවන ආගම් ගැන ක්‍රිස්තියානි ලබ්ධිකයන්ගේ දැනුම වඩා වර්ධනය කර ගැනීම සඳහා ලියූවකි.

v. පෙරදිග ශුද්ධ ග්‍රන්ථ මාලාවට ඔහු ලියූ මුල් ම කෘතිය කුමක් ද?

බෞද්ධ සූත්‍ර

vi. රීස් ඩේවිඩ්ස් විසින් පරිවර්තනය කළ කෘති 3ක් හා සංස්කරණය කළ කෘති 3ක් ලියන්න.

දාඨාවංසය,අභිධම්මත්ථසංගහ (සංස්කරණ) මිලින්ද පඤ්හ, පාතිමොක්ඛය, මහාවග්ගපාලි, චුල්ලවග්ග පාලි (පරිවර්තන)

vii. පාලි ග්‍රන්ථ සමාගම ආරම්භ කිරීමේ වැදගත්කම මුල්වරට අනාවරණය කරන ලද්දේ කොහි දී ද?

1881 දී ඇමෙරිකාවේ පවත්වන ලද හිබර්ට් දේශනයක දී

viii. ඔහු මහාචාර්ය ධූර දැරුවේ කිනම් විශ්වවිද්‍යාලයකින් ද?

මැන්චෙස්ටර්හි වික්ටෝරියා විශ්වවිද්‍යාලයේ

ix. සිය ජීවිත කාලය තුළ ඔහු දැරූ උදාර අදහස පාඩමෙන් උපුටා ලියන්න.

WWW.PIRIVENA.LK

අප ඉක්මවා යෑමට අනුන්ට හැකියාව ලබාදීම සඳහා ඔවුන්ට අප විසින් දිය හැකි සියලු ධෛර්යය දිය යුතුය.

x. මහාවංශය පිළිබඳ ඔහු එකතු කළ තොරතුරු ලබා දුන්නේ කාට ද?

එච්. ඕල්ඩන්බර්ග් මහතාට

xi. ඔහු පුස්තකාලයාධිපති හා ලේකම් තනතුර දැරූයේ කිනම් සමිතියේ ද?

රාජකීය ආසියාතික සමිතියේ පුස්තකාලයාධිපති විය. එහි ලේකම් ද විය.

xii. පාලි පොත් සමාගම මගින් සිදු කළ ප්‍රධාන ශාස්ත්‍රීය සේවාවන් 3ක් ලියා දක්වන්න.

- සියලු පාලි නිකාය ග්‍රන්ථ අටුවා හා ප්‍රකරණ ග්‍රන්ථ සංස්කරණය කිරීම
- ත්‍රිපිටකය වෙළුම් 58කින් ඉංග්‍රීසි භාෂාවට නැංවීම
- 1921 දී පාලි ඉංග්‍රීසි ශබ්දකෝෂයේ පළමු කොටස එළිදැක්වීම
- පාලි ත්‍රිපිටක කෝෂය එළිදැක්වීම
- පාලි පුද්ගල නාම ශබ්දකෝෂය එළි දැක්වීම

WWW.PIRIVENA.LK

පසළොස්වන පාඩම

අභ්‍යාසය

01. කෙටි පිළිතුරු සපයන්න.

i. උදානපාළියේ සූත්‍ර ගණන කීය ද? සූත්‍ර 82කි.

ii. උදානපාළියේ වර්ග සංඛ්‍යාව කීය ද? වර්ග 8කි.

iii. උදානපාළියේ බණවර ගණන කීය ද? බණවර

iv. උදානපාළිය ඛුද්දක නිකායේ කීවෙනි ග්‍රන්ථය ද? 3වැනි ග්‍රන්ථය.

v. ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ සංඛ්‍යාව කීය ද? 15කි.

02. සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

i. ඉදානි මයං ධම්මං ච විනයං ච සඞ්ගායෙය්‍යාම.

ii. දෙසෙථ භික්ඛවෙ ධම්මං ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං.

iii. ධම්මචක්කං පවත්තෙතුං ගච්ඡාමි කාසිනං පුරං.

iv. තදඤ්ඤං බුද්ධවචනං නිකායො ඛුද්දකො මතො

v. කිමිදං උදානං නාම. පීතිවෙගසමුට්ඨාපිතො උදාහාරො.

03. දී ඇති වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

කථාවත්ථුප්පකරණය/ වට්ටගාමිණී අභය/ පාටලිගාමිය/ බ්‍රාහ්මණධර්ම/ වොහාර දෙසනා / ජුණ්හ/ උපොසථ/ චාපාලචෛතිය / 95කි. ආණාදෙසනා)

i. උදානපාළියේ ඇති උදානගාථා ගණන 95කි.

ii. පාටලීගාමිය උදානපාළියේ අවසාන වර්ගය යි.

iii. බෝධිවර්ගයේ උදානගාථාවලින් කියවෙන්නේ බ්‍රාහ්මණ ධර්ම ගැනයි.

WWW.PIRIVENA.LK

iv. මුගලන් තෙර දුසිල් භික්ෂුවක උපෝසථාගාරයෙන් නෙරපූ පුවත සඳහන් වන්නේ උපොසථ සූත්‍රයේ ය.

v. යක්ෂයකු සැරියුත් තෙරුන්ගේ හිසට පහර දුන් පුවත සඳහන් වන්නේ ජුණ්හ සූත්‍රයේ ය.

vi. ත්‍රිපිටකය පුස්තකාරූඪ කළේ වට්ටගාමිණී අභය රජ සමයෙහි ය.

vii. මොග්ගලීපුත්තතිස්ස තෙරුන් රචනා කළ ත්‍රිපිටකයට ඇතුළත් ග්‍රන්ථය කථාවත්ථුප්පකරණය යි.

viii. සූත්‍රපිටකය හඳුන්වනු ලබන්නේ වොහාර දෙසනා නමිනි.

ix. ආණා දෙශනා ලෙස විනය පිටකය හඳුන්වයි.

x. බුදුරදුන් ආයුසංස්කාර අත්හැරියේ චාපාල චෛතිය ස්ථානයේ දී ය.

04. පිළිතුරු සපයන්න.

i. ඛුද්දක නිකාය හඳුන්වා ඇති ගාථාව ලියන්න.

ඨපෙත්වා චතුරොපෙතෙ - නිකායෙ දීඝමාදිකෙ
තදඤ්ඤං බුද්ධවචනං - නිකායො ඛුද්දකො මතො

ii. උදානපාළියේ වර්ග පිළිවෙලින් ලියන්න.

- බොධි වර්ගය
- මුචලින්ද වර්ගය
- නන්‍ද වර්ගය
- සොණ වර්ගය
- ජච්චන්‍ධ වර්ගය
- චූල වර්ගය
- පාටලීගාමිය වර්ගය

iii. විනය පිටකයට අයත් ග්‍රන්ථ පහ නම් කරන්න.

පාරාජික පාළි, පාචිත්තිය පාළි, මහාවග්ග පාළි, චුල්ලවග්ග පාළි, පරිවාර පාළි

WWW.PIRIVENA.LK

iv. උදාන පාළියේ ඇතුළත් බුද්ධචරිතයට සම්බන්ධ සිද්ධි 05ක් ලියන්න.

i. බෝධි වර්ගයේ පඨමාභිසම්බෝධි වර්ගයේ බුදුරදුන් පටිච්චසමුප්පාදය මෙනෙහි කිරීම පිළිබඳ පුවත ඇත.

ii. මුචලින්ද වර්ගයේ බුද්ධත්වයෙන් පසු අකාලමේඝයක් පැමිණි කල්හි මුචලින්ද නා රජු බුදුරදුන්ට ආරක්ෂාව සැපයූ අයුරු දැක්වේ.

iii. නන්ද වර්ගයේ නන්ද සූත්‍රයේ බුදුරදුන්ගේ ඥාති සහෝදර නන්ද කුමරුගේ පැවිද්දත් ඔහු පැවිද්දෙහි රුචි නොවී ශ්‍රමණ ධර්මයෙන් තොරව කටයුතු කළ විට බුදුරදුන් ඔහුගේ කණස්සල්ල දුරු කළ අයුරුත් දැක්වේ.

iv. මේඝිය වර්ගයේ නාග සූත්‍රයෙහි බුදුරදුන් පාරිලෙය්‍ය වනයට වැඩම කිරීමේ සිදුවීම අන්තර්ගත වේ.

v. ජච්චන්ධ වර්ගයේ පළමු සූත්‍රයේ බුදුපියාණන් වහන්සේ චාපාල චෛතියස්ථානයේ දී ආයු සංස්කාර අත්හළ බව දැක්වේ.

vi. චූල වර්ගයේ උදපාන සූත්‍රයේ බුදුරදුන් මල්ලරට ථූප නම් බමුණුගමට වැඩම කළ කල්හි උන්වහන්සේට පැන් නොලැබෙන සේ ග්‍රාමයේ සියලු ළිං තණකොළ දමා වැසූ හැටි දැක්වෙන පුවත ඇත.

vii. පාටලී ගාමිය වර්ගයේ බුදුරදුන්ගේ අවසාන දානය, නාගසමාල තෙරුන් බුදුරදුන්ගේ පාත්‍රය බිමදමා අන්‍යතීර්ථකයන් වෙත යාමේ පුවත අඩංගු වේ.

WWW.PIRIVENA.LK

දහසය වැනි පාඩම

අභ්‍යාසය

01. පහත සඳහන් සංවාදය සිංහලට නගන්න.

අඤ්ඤතරා වනිතා : 'අරෙ භගිනි, න ත්වං ජානාසි. හීයො සායණ්හසමයෙ ආයස්මා සාංගාමජී සාවත්ථියං අනුප්පත්තො'ති

එක්තරා කාන්තාවක් : පින්වත් නැගණියනි, නුඹ නොදන්නෙහි ද? ඊයේ හවස් කාලේ ආයුෂ්මත් සංගාමජී තෙරුන් සැවැත්නුවරට වැඩම කළා' යනුවෙනි.

පුරාණදුතියිකා : 'කිං ත්වං සච්චං වදසි. උදාහු මුසා ?

පෙර බිරිඳ :- කිමෙක් ද නුඹ සත්‍යයක් පවසහි ද? නැත්නං බොරුවක් ද?

අඤ්ඤතරා වනිතා : 'අහං කිමත්ථාය මුසා භණාමි ත්වමෙව ජෙතවනං ගන්ත්වා සච්චං ජානෙය්‍යාසි.

එක්තරා කාන්තාවක් : මම කුමක් නිසා බොරුවක් කියමි ද? නුඹම ජේතවනාරාමයට ගොස් සත්‍ය දැනගන්නෙහි නම් හොඳයි.

පුරාණදුතියිකා : භවතු සීඝමෙව ජෙතවනං ගමිස්සාමි (ගන්ත්වා)

පෙර බිරිඳ :- මම ඉක්මනින්ම දෙව්රමට යන්නෙමි. (ගොස්)

අඤ්ඤතරො ථෙරො : 'උපාසකෙ කත්ථ නු බො ත්වං ගච්ඡසි දිවා දිවස්ස'

එක්තරා හිමිනමක් : උපාසිකාවනි කුමක් නිසා නුඹ දහවල් වේලේ පැමිණියෙහි ද?

පුරාණදුතියිකා : 'භන්තෙ එතරහි ආයස්මා සංගාමජී කත්ථ විහරති ?

පෙර බිරිඳ : හාමුදුරුවනේ. දැන් ආයුෂ්මත් සංගාමජී තෙරණුන් කොහි වාසය කරයි ද?

අඤ්ඤතරො ථෙරො : 'පස්සසි ත්වං උපාසිකෙ, තව දක්ඛිණදිසායං චංකමනභූමි තත්ථ ආයස්මා සංගාමජී චංකමති.'

WWW.PIRIVENA.LK

එක්තරා හිමිනමක් : උපාසිකාවනි නුඹ බලන්න ඔබට දකුණු පැත්තට වන්නට සක්මන් බිමෙහි ඇත. එහි ආයුෂ්මත් සංගාමජී තෙරුන් සක්මන් කරයි.

පුරාණ දුතියිකා : 'භනෙත සංගාමජී ඛුද්දපුත්තාම්හි පොස මං'

පෙර බිරිඳ : ස්වාමීනි, ආයුෂ්මත් සංගාමජී හිමියනි, කුඩා පුතෙකු ඇත. මා පෝෂණය කරන්න.

ආයසමා සංගාමජී : තුණ්හී අහොසි.

ආයුෂ්මත් සංගාමජී තෙරුන් : නිහඬ විය.

පුරාණ දුතියිකා : 'න චායං සමණො පුත්තෙනපි අත්‍ථිකො හොති අහමෙව දාරකං ආදාය ගමිස්සාමි.'

පෙර බිරිඳ : මේ ශ්‍රමණයාට පුතාගෙන් අර්ථයක් නැත. මම දරුවා ගෙන යන්නෙමි.

02. පහත සඳහන් යෙදුම් භාවිත කර පාලි වාක්‍යය පහක් ලියන්න.

i. තෙන ඛො පන සමයෙන - තෙන ඛො පන සමයෙන භගවා ජෙතවනෙ විහරති.

ii. තායං වෙලායං - භගවා තායං වෙලායං ඉමං උදානං උදානෙසි.

iii. අවිදූරං ගන්ත්වා - පුරාණදුතියිකා අවිදූරෙ ගන්ත්වා යතො පුන ආගච්ඡති.

iv. එතමත්‍ථං විදිත්වා - බුද්ධො එතමත්‍ථං විදිත්වා ඉමං ගාථං අභාසි.

v. අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ - සංගාමජී භික්ඛු අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසින්නො හොති.

03. කාන්තාවන් හා දරුවන් දැකීමෙන් පෘථග්ජන පුද්ගලයන් තුළ ඇතිවෙන සෞන්දර්යාත්මක හැඟීම් මොනවාදැයි විස්තර කරන්න.

WWW.PIRIVENA.LK

මිනිස් සමාජය කාලාන්තරයක් තිස්සේ නොනැසී පැවැත්මට ඉවහල් වී ඇත්තේ ස්ත්‍රී පුරුෂ සම්බන්ධතාවයි. ප්‍රජනන ක්‍රියාවලියේ දී මේ දෙදෙනාගේ දායකත්වය මත මිනිස් සමාජයේ පැවැත්ම තීරණය වේ.

පුරුෂයාට කාන්තාවගේ රූපය තරම් ඇගේ කටහඬ තරම් ඇගේ සිනහව, ස්පර්ශය තරම් වටිනා වෙනත් දෑ නොමැතිය. කාන්තාවටත් එසේ ම ය.

මේ හේතුවෙන් කාන්තාව පිළිබඳ ඇගේ ඇතුළාන්තය හා පිටස්තර ශරීර වර්ණනා හෝ ගතිගුණ ගැන කියැවෙන ගීත, කාව්‍ය බොහෝමයකින් අපේ සාහිත්‍ය පිරී ඇත.

සීගිරි ගී, කව්සිළුමිණ ආදි මහාකාව්‍යවල, ගාථාවල, නවකතා කෙටිකතා ආදී නොයෙකුත් සාහිත්‍යාත්මක ලියවිලිවල කාන්තාව වර්ණනාවට ලක් වේ. එයින් ඇය පිළිබඳ වන ගතිගුණ, කාන්තා ලීලාව ආදිය වර්ණනා වේ.

සුරූපී කාන්තාවක් දැකීමෙන් කොසොල් රජු ඇගේ සැමියා මැරීමට සැලසුම් කළ අයුරු දීඝා ජාගරතො රත්ති ගාථාව මගින් ඔබ අසා ඇත.

කාන්තාවකගේ ගීත ඇසීමෙන් ඇය කෙරේ ඇළුණු බැඳුණු එක්තරා සාමණේරයන් වහන්සේ නමක් ශීල විපත්තියට පත් වූ අයුරු චක්ඛුපාල මහරහතන් වහන්සේගේ කතාව හා බැඳේ.

නන්ද තෙරුන් පැවිද්ද අතැර දමා ගිහිගෙට පැමිණීමට යොමු වූයේත් ඒ අදහස අතහැර දිව්‍ය අප්සරාවන් කෙරෙහි බැඳුණේත් ඒ කාන්තා පාර්ශ්වයන් නිසා ය.

බුදුරදුන් වැඩසිටි සමයේ නගර ශෝභිනියන් සිටි අතර සමහරුන් රටේ රජුට වඩා බලසම්පන්නව සිටි බව දැක්වේ. රජු පවා ඇලාගේ අදහස් අනුව ක්‍රියා කළ බව දැක්වේ. මෙය ද එක්තරා අන්දමෙන් කාන්තාවන්ගේ රූශ්‍රීය නිසා දැමුණු අයගේ ලක්ෂණ පෙන්නුම් කරන්නෙකි.

අතීතයේත් වර්තමානයේත් අනාගතයේත් එක සේ පවතින ධර්මතාවක් වන්නේ පුරුෂයන් කාන්තාවට ළබැඳි වීමත් කාන්තාව පුරුෂයාට ළබැඳි වීමත් ය.

කුඩා දරුවාත් එසේ ම ය. දෙමාපියන්ට දරුවා තරම් වටිනා වෙනත් කිසිවෙක් ලොව නැති තරම් ය. බොහෝ පිරිස් කුඩා දරුවන්ට ඉතා

WWW.PIRIVENA.LK

ආදරේ ය. ළදරු සිඟිත්තන් දැකීමෙන් ස්පර්ශ කිරීමෙන් හා කතාබහ කිරීමෙන් වැඩිහිටි අය ද කෙටි කලකට හෝ ළමා බවට පත් වේ.

පුංචි ළමයි මල් වගේ කාලාන්තරයක් තිස්සේ ජනහදවත්වල තිබෙන හැඟීමකි. මහ මිනිසුන් මෙන් කුහකකම, අහංකාරකම, උඩඟුකම හෝ වංචාව ළමා සිත්වල නැති බවත් වැඩි දෙනා සිතති.

මේ සැම ගැනම ඉතා චමත්කාර ජනක නිර්මාණ අපේ සිංහල කවි ගීතවල දක්නට ලැබේ.

එවැනි දෑ සොයා ගැනීම ශිෂ්‍ය ඔබගේ වගකීමකි.

04. රහතන් වහන්සේ කාන්තාවන් හා දරුවන් වැනි සාමිස වස්තු පිළිබඳ දක්වන ආකල්පය කෙබඳුදැයි පැහැදිලි කරන්න.

රහතන් වහන්සේ යනු කෙළෙස් ප්‍රහීණ කළ උතුමන් වහන්සේලා ය. උන්වහන්සේලාට ලොව පවතින කිසිවක් ගැන ඇල්මක් බැඳීමක් නැත. ජීවි හෝ අජීවි වශයෙන් එන සැම දෙයක් පිළිබඳව පවතින්නේ බැඳීම් රහිත හැඟීමකි. රහතන් වහන්සේලාගේ ලක්ෂණ පිළිබඳ දැක්වෙන වටිනා ගාථාවකි මේ,

රමණීයානි අරඤ්ඤානි- යත්ථ න රමතී ජනො
වීතරාගා රමෙස්සන්ති - න තෙ කාමගවෙසිනො

ජනයා කැමති නැති

සිත්කලු වන ගහනයෝ

රහතුනට රමණීය වේ

කම්සැප නොසොයන බැවින්

එහි අරඤ්ඤානි යනු පිපුණුමල් ඇති ගස්වලින් යුතු, නිර්මල ජලය ගලා බසින ඇළදොළ ඇති ආරණ්‍යයෝයි. රමණීයානි යත්ථ යනු පිපී ගිය පියුම් වනයන්හි ගම්මැස්සන් නොඇලෙන්නාක් මෙන් කාමයන්ම සොයන අය සිත් නොඅලවති. වීතරාගා යනු පහවූ රාග ඇති රහතන්වහන්සේලා පියුම් වනයෙහි හැසිරෙන බමරමීමැස්සන් මෙන් එබඳු ආරණ්‍යවල රමිස්සන්ති ඇලෙත්. කුමක් නිසාද? න තෙ කාමගවෙසිනො යම්හෙයකින් උන්වහන්සේලා කාමයන් සොයා නොයන්නාහුද එහෙයින්ය යන අර්ථයි.

<u>පහත ලිපිය ද කියවා ගන්න.</u>

පරිසරය පිය කළ විමුක්ති කාමියෝ

මිනිස් ලොව ඇතිවීම පිළිබඳ දීර්ඝ විස්තරයක් දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ සඳහන් වේ. සති මාස ගණනාවක් වැසි වැස ඉන්පසු මනා ලෙස ඉර පායා දිය සිඳී එක් කල්පයක් ඇරඹෙන බවත් ඉන් පැහැදිළි වෙයි. මේ නව කල්පයේ මහ පොළාව මත මිනිසා උපදින්නේ මිනිසාට ඉපදීමට හා ජීවත්වීමට සුදුසු සොබා දහමක් ඇතිවීමෙන් පසුව බව එකී විස්තර මැනවින් පැහැදිලි කරයි. ඒ නැවුම් පොළවේ උපදින මිනිසා වෙහෙස මහන්සියෙන් රැකියාවක් නොකරන ස්වාභාවිකව හට ගන්නා වූ බදාලතා ස්වයංජාත වී වැනි දේ ආහාරයට ගෙන මිනිසා රැකෙන අතර මිනිසා නිසා ස්වාභාවික සම්පත් රැකෙන බව පෙනේ. මිනිසා තුළ ප්‍රශ්න මතුවන්නේ මෙම ස්වාභාවික සම්පත්, පරිසරය විනාශ කිරීම ආරම්භ වූ දා සිටයි. මේ අනුව සොබා දහම, මිනිසා එකට පැවතිය යුතු කරුණු දෙකක් බව විස්තර වේ.

මිනිසුන් අතරින් පරම ශ්‍රේෂ්ඨ උතුම්ම මනුෂ්‍යයා වන බුදුරජාණන් වහන්සේත්, උන් වහන්සේගේ ශ්‍රාවක ශ්‍රාවිකාවෝත් මේ සොබා දහම පරිසරය උකහා ගනිමින් එහි ආශ්වාදය හා ප්‍රයෝජනය ලබමින් සසර කෙටි කර ගත් බව ත්‍රිපිටකය පුරාම විසිරී තිබෙන සූත්‍ර ගාථා ආදියෙන් විස්තර කෙරෙයි.

සිදුහත් කුමරු උපන්නේ සුවිශාල දර්ශනීය සල් වනයක පරිසරයේ ආස්වාදය ලබමිනි. උන්වහන්සේ මහාබිනික්මන් කළේ ඇසළ මසේ පුන් සඳ පායා තිබුණු සඳ පහනේ ගතට සුව එළවන පරිසරයකය. මහබිනික්මන් නිමා වූයේ නේරංජනා නදිය අසලය. ඉන් එහා තිබුණේ සේනානි ගමය. එය දර්ශනීය පරිසරයකි. සොබා දහමින් ඔප් නැංවුණු වන ලැහැබ්, සුදු වැලිතලා ලතාවකට ගලන නේරංජනා නදී දහර, සඳරැස් වැටී කිරි මුහුද මෙන් බබලන දිය දහරාවන්, මනා තොටුපළවල්, නිල්වන් වනරොද, නිදහස් පරිසරය තුළ දිය වැලේ දිය බුං ගහන දණ්ඩි පැටව් ආදි සොබා දහම මගින් මැවුණු අතිශය චමත්කාරජනක පරිසරයක හිසකෙස් කපා සිවුරු පෙරවිය. උන්වහන්සේ පධන් වීර්යය වැඩුවේ මඳ සුලඟින් සිලි සිලි ගා සැලෙන දළුපත් වලින් යුත් ඇසතු ගසේ සෙවන ලබමිනි. බෝ සෙවන යට සෝත්‍රීය බමුණා විසින් දෙන ලද මුදු මොලොක් හරිත වර්ණ කුස තණ අතුරා ඒ මත වැඩ සිට පධන් වීර්යය වඩා සිවුසස් අවබෝධ කර ගත් එතුමා ඒ අසලම සති කිහිපයක් විවේක සුවයෙන්

WWW.PIRIVENA.LK

කල් ගෙවූහ. එසේ ගෙවූයේ කිරිපලු - නුග, මිදෙල්ල ආදී රුක් සෙවන් වල පහස ලබමිනි.

බුදුවීමෙන් පසුව පළමුව මංගල ධර්ම දේශනය පවත්වන්නට වැඩියේ මුවන්ට අභය දුන් සුරතල් මුව පැටවුන් කෙළි දෙලෙන් සිටින මිගදා වනයටය. මෙසේ සොබා දහමට ඇලුම් කළ සොබා දහමින් පරිසරයෙන් කල් යැවූ උන්වහන්සේ පළමුව පිළිගත්තේ වැඩවාසය කළ වේළුවනයේ ය. විවිධ වර්ගයේ උණගස් වලින් සැදුම්ලත් මඳ සිසිලසින් යුතු වේළුවන අරණෙහි සිට උන්වහන්සේ සොබාදහම වර්ණනා කළේය.

රමණීයානි අරඤ්ඤානි - යත්ථ න රමතී ජනො

විතරාගා රමෙස්සන්ති - නතේකාම ගවෙසිනො

රාගී සිත විරාගී කිරීමට, කාමයන් යටපත් කර ගැනීමට අලුතෙන් නො ඉපදීමට රමණීය වූ සිත් කළු වූ තුරුලිය මල් වලින් ගැවසීගත් වන උපයෝගි වන බව වදාළහ.

මෙසේ සොබා සෞන්දර්යයෙන් පහස ලබමින් සිටි තථාගතයන් වහන්සේ සුදොවුන් රජු දැකීම සඳහා කිඹුල්වතට වඩමවාගෙන යනු පිණිස පැමිණි රාජදූත කාලුදායි තෙරුන් උන්වහන්සේට කිඹුල්වතට වැඩම වීමට ආරාධනා කළේ කිඹුල්වතට යන මඟ දෙපස හා කිඹුල්වතෙහි ස්වභාවික සම්පත් හා පරිසරය වර්ණනා කිරීම මඟිනි.

හිමියනි මෙකල රැක්හිස් සහල ගුරු වගේ

පරඬැල් සලා පලදැරුමට ළඟයි වගේ

ඒ රුක් පහන් සිළුමෙන් බබළමින් නැගේ

සැකි කුලවුන්ට අත දෙන මේ කලයි හැගේ

වැඩි සීතලක් නැත වැඩි උණුසුමක් නැත

මහ මඟ යන්ට සුන්දර රිතු ගුණය ඇත

සර්වඥයන් වහන්සේ ධර්ම දේශනා කළේ කිඹුල්වත් වනය හේසකලා වනය, චාලිය පව්වේ සඳුන් වනය, වියල්පුර වන ජීවක අඹ වනය, අඳුන් වනය, වේළුවනය, මිගදා වනය ආදී ස්වභාවික හිතකාමී පරිසරය ආශ්‍රිතවය. හිත නිවීමට තැන්පත් වීමට සොබා දහම රුකුලක්වන බව එතුමෝ දැන සිටියහ. උන්වහන්සේ ධර්ම දේශනා කරන පිරිත් දේශනා කරන අවස්ථාවන්හි දී ද, සූත්‍ර ධර්ම වලද සොබා

WWW.PIRIVENA.LK

දහම වර්ණනා කළහ. රතන සූත්‍රයේ දී වනප්පගුමේබ යන ගාථාවෙන් යම් සේ වන ලැහැබ ග්‍රීෂ්ම ඍතුවෙහි පළමුවන මාසය තුළ දී පිපුණ මලින් බරවේද, එවැනි පරම හිතසුව පිණිස වූ නියන් මග ආදී වශයෙන් පරිසරය උපමාවට ගත්හ. කැලෑබද පරිසරය තුළ සත්තු ජීවත් වෙති. ඒ සතුන් ද ස්වභාව ධර්මයේ දායාදයකි. කරණීය මෙත්ත සූත්‍රයේ දී දිග වූ ද කොට වූද, මහත් වූද, කෙට්ටු වූද, විවිධ ප්‍රමාණ වූද සතුන්ට මෛත්‍රී කරන මෙන් උගන්වූහ. මහාසමය සූත්‍රය දේශනා කළේ කිඹුල්වත්පුර මහවනයේදී ය. මෙලෙස සූත්‍රය දේශනා කළේ ආරාම විහාර නොමැති නිසා නොව පරිසරය සොබාදහම වීතරාගී වීමට උපකාර වන බැවිනි. ආටානාටිය සූත්‍රයේ එන සොබා වැනුම මෙසේය. එහි නිරන්තරයෙන් පලබරින් පිරුණු ගස් ඇත. නොයෙක් කුරුළු සමූහයා එහි වෙති. මොණරුවන්ගේ හා කොස්වාළිහිණින්ගේ නදින් ඒ පෙදෙස නින්නාද වේ. මිහිරි කොවුල් හඬින් යුතුය. ජීවන් ජීවක කුරුල්ලෝද, ඔට්ඨව චිත්තක කුරුල්ලෝද, වලි කුකුලෝද පුෂ්පකර ශාතක පක්ෂීහුද සිටිති. ගිරා සැළළිහිණියන්ගේ නාදය, දණ්ඩ මානවක පක්ෂීන්ගේ නාදය එහි සුන්දර පරිසරය සෝබාවත් කරති. කුවේර පොකුණ සීතල සලීලයෙන් යුක්තව හැම ඍතුවෙහිම ශෝභමානව පවතී. බුදුරදුන් මේ අන්දමට සොබා දහමට සිත ඇල වූ නිසාම උන්වහන්සේ ශ්‍රාවකයෝ වන සෙනසුන්වල සිත් ඇලවූහ. බුදුරදුන් වෙතින් කමටහන් ලබාගත් ශ්‍රාවක (තෙරවරු ධ්‍යාන වැඩීම සඳහා) වැඩම වූයේ සිත්කළු වනසෙනසුන් වෙතය. ඒ බව ශ්‍රාවක චරිත මගින් පැහැදිලි කර ගත හැකිය.

මේඝිය තෙරුණුවෝ ජන්තු ග්‍රාමයේ කිමිකාලා නදියත් ඒ නදිය අසල පිහිටි අඹ වනයත් එහි මතුවන ස්වාභාවික පරිසරයත් දැක බවුන් වැඩීමට යෝග්‍ය ස්ථානය මෙතනැයිය බුදුරදුන් වෙතින් කමහටන් ගෙන එහි වැඩම වූහ. එසේ විවේකීව හිඳ කමටහන් වැඩූ තෙරුන් වහන්සේ ඒ පරිසරයෙන් මත් ව එම පරිසරයේ සිත් අලවා මෙසේ උදන් ඇනූහ. කස්සප තෙරුන් තම සිතෙහි හටගත් පාරිසරික වර්ණනය මෙලෙස ප්‍රකාශ කර ඇත.

- ලුණු වර්ණ රුක් වෙතින් පැතිර ගිය සිත්කළු වූ භූමි භාගයෙන් යුක්ත සතුන්ගේ ගර්ජනාවෙන් රම්‍ය වූ පර්වතය මා සිත් අලවයි.

- නිල් වලාවකට බඳු පැහැපත් වූ සිහිල් දිය දහරින් යුත් පිරිසුදු ඉදි ගොව්වන්ගෙන් සැරසීගත් ඒ පර්වත පාදය මා සිත් අලවයි.

WWW.PIRIVENA.LK

නිල් වලාකුළු වලින් රමණීය වූ කුළු ගෙවලට උතුම් වූ ඇතුන්ගේ තර්ජනාවෙන් රම්‍ය වූ ඒ පර්වතය මා සිත් ගනී.

- බෙහෙවින් වට වැසි ඇති, රම්‍ය වූ වැලි තලාවෙන් යුතු මොණරුන්ගේ නදින් යුතු සෘෂීන් සෙවුනා ලද ිනගි නම් වූ පර්වතය මා සිත් අලවයි. උමා කුසුම් (නිල් කටරොඩු) බඳු පැහැයෙන් යුත් නිල්වලාවෙන් වැසුණු ගුවන් තලයෙන් යුත් නා නා විද පක්ෂීන්ගෙන් ගැවසීගත් පර්වතයන් මා සිත් අලවයි.

- පහන් දිය ඇති, පුළුල් ගල් තලාවෙන් හෙඹි මුවන් වඳුරන් ආදී සතුන් ගැවසුණු දිය සෙවලින් වැසුණු ඒ පර්වත පාද මා සිත් අලවයි.

- සොබා දහමෙන් පරිසරයෙන් උද්දාමයට පත් කාලපුට තෙරුන් මෙසේ පවසති. මොණරුන් විල් ලිහිණින්ගේ නාද ඇති වනයේ දිවි වග වලසුන් විසින් පෙරටු කරන ලදුව වසන්නෙමි. සිරුරෙහි අපේක්ෂාව අත් හළෙමු.

- පැහැදිලි පුර පසලොස්වක සඳ මෙන් කුලයන්හි හා පස්කම් හිද නොඇලුණු සිතෙත්ව වට වැසි ඇති කල්හි සිව් අඟල් තණ පිහිටි කල්හි වැසි වලා බඳු වනය මනාව පිපී ගිය කල්හි පර්වත අතරේ රුක් වදුලේ හුන්නෙමි. ඒ තණ පසතුරුණු අලුත් යහනක් සෙයින් මට දැනේ.

සුනිල් ගෙල පිහිටි මනා සළු පිහිටි මනා පිල් බරින් යුත් විසිතුරු පියාපත් සෙවෙණි යුත් පක්ෂීහු මේඝ ගර්ජනා හේතුවෙන් මිහිරි හඬින් නාද කරන මයුරයෝ ධ්‍යාන කරන අයගේ සිත් අලවයි. වල් ඌරන් ඒණි මුවන් පිවිස සෙවුනා ලද පර්වත ප්‍රාන්තයන් හා ගිරිකුළු පිහිටි ප්‍රකෘතියෙන්ම සුන්දර වූ භූකඩම් භාගයෙන් යුත් අළුත් වැසි දියෙන් තෙත් වූ ඒ වනයේ ගුහා කොට පැමිණෙමි.

මේ සොබා සෙඳිරියාව ඇසුරින් මේ මහෝත්තමයෝ අනිත්‍යය මෙනෙහි කළේ මෙසේය.

- පර්වත සමුද්‍ර පෘථුවිය නදී හා සිව් දෙස අනුදිසා ද දේව ලෝකද අනිත්‍යයහ එම්බා චිත්තය කොහි ගියේ ද කෙසේ සුවසේ රමණය කරන්නේද,

ඒක විහාරික තෙරහු හුදෙකලා වාසයෙහිත්, වන වාසයෙහිත් ඇඳුණු අන්දම මෙසේ සිතුවම් කරති.

WWW.PIRIVENA.LK

- සපිපි සිහිල් වෙනෙහි සිහිල් වූ ගිරි කඳුරෙහි සිරුර සෝදා හුදෙකලාව වෙසෙමි.

- සිහිල් වූ මිහිරි වූ සුවඳැති සිහිල් පවන් හමන කල්හි, කඳු මුදුන්හි හිඳ අවිද්‍යාව පළවා හැරිමි. මලින් ගැවසුණු එකුනින් සිහිල් වූ බෑවුම් සහිත කඳු වළලු වෙනෙහි විමුක්ති සුවයෙන් සුඛිත වූයෙමි. සිත් අලවා වෙසෙමි.

ධ්‍යාන වඩන තෙරුන් පමණක් නොව මහා ප්‍රාඥ වූ අර්හත් වූ අගසවු සැරියුත් තෙරුණුවෝ ජේතවන, වේළුවන, මිගාර මාතු ප්‍රාසාද ආදී සුවපහසු විහාරාරාම තිබියදීත් බොහෝ කලක් වාසය කළේ ගෝසිංග සාලවනී නම් වන පෙදෙසකය. මහා මුලගන්, ආනන්ද, කාශ්‍යප ආදි මහා රහතන් වහන්සේ එහි වැඩමකර ධර්ම සාකච්ඡා කළ බව ගෝසිංග සූත්‍රයේ සඳහන් වේ. ධානා‍ය වඩන, අභිධර්මය හදාරන සුපේශල තෙරවරුන්ගෙන් ගෝසිංගසාල වනය බබළන බව මෙම සූත්‍රයෙන් හෙළි කර ඇත.

බුදුරදුන් මෙන් ශ්‍රාවක තෙරවරුන්ද ධර්ම දේශනා, ධර්ම සාකච්ඡා පවත්වා ඇත්තේ චාලිය පවුවේ සඳුන් වනය ආදී ස්ථානවල බව ත්‍රිපිටකයේ සඳහන් සූත්‍ර වල පැහැදිලි වේ. මහා+සමය සූත්‍රය දේශනා කළ ලක්ෂ ගණනින් වූ මහා දේව සමාගම පැවතියේ කිඹුත්වත් මහ වනයේය. රෝහිණී නදියේ දිය බෙදා ගැනීම පිණිස ඇති වූ අරගලය සංසිඳ වූ දා බුදු සසුනෙ පැවිදි වූ ශාක්‍ය කෝලිය පන්සියයක් දෙනා රහත් බව ලැබුවේ කුණාලවිල සමීපයේ රන්සිරියෙල් ගල්තලාවේ දෙසූ කුණාල ජාතිකය ඇසීමෙනි. එමෙන්ම ඉසිගිළ - වේභාර පර්වත භික්ෂූන්ගේ නිත්‍ය වාසස්ථාන විය. බුදු හිමියන් ලක්දිව වැඩම කොට නවාතැන් ගත්තේ මිහිඳු ගුහාවෙහිය. ජලස්නානය කළේ කළුදිය පොකුණ වැනි ස්වභාවික ජලශවලය. අපේ පැරණි රජවරු භික්ෂූන් වහන්සේට පූජා කළේ ස්වාභාව සෞන්දර්යයෙන් යුතු ස්ථානයන්ය. හත්ථී කුච්ඡි විහාරය පිහිටියේ රමණීය වන පෙදෙසකය. මහ රහතුන් වැඩ සිටි වාරණ - දඹුල්ල වැනි තැන්පිහිටා ඇත්තේ වනවාසභූමී කඳු ප්‍රාන්තවලය. පිරිත් දේශනාවලදී ද මෙම ස්වාභාවික පරිසරය උපයෝගී කරගන්නා අයුරු පෙනේ. පිරිත් මණ්ඩපය තුළ යුගාසන දෙක ඒකාබද්ධ කොට ඉන්ද්‍රඛිලය පිහිටවනු ඇත. ඒ සඳහා ගන්නේ සූරිය ආදි අමු ලීයකි. සූරිය වනාහි ශස්ත්‍රයෙහිදී ගෙමිදුලෙහි වවාගත යුතු රුක් වෙසෙසකි. සාරදාරු යුක්ත රෝගබීජ නාශක ලී වර්ගයකි. පිරිත් මණ්ඩපයේ උඩ එල්ලීමට නාග ලතා, නාග වල්ලී, නාග පල්ලව, යන නම් ඇති බුලත් කැනති, නා දළු, ආදී යද පුවක් මල්ද යොදා ගනී. පුවක් මල් නා දලු ආදිය යොදා ගන්නේ සතියක් පමණ කල්

WWW.PIRIVENA.LK

වුවද නොමැලවී තබාගත හැකි නිසාය. බුලත් වෛද්‍ය ශාස්ත්‍රයේ විෂ හා රෝග බීජ නාශක කාරකයකි. පුවක් මල් හා නා දළු හන්දි පුරුද්දන, හන්දි සවිකරන ආනුභාව සම්පන්න බෙහෙත් වර්ග දෙකකි. මෙම පුෂ්පලතා පලු පල්ලව ආදියෙන් මණ්ඩපය සරසන්නේ ස්වභාවික පරිසරය පිරිත් මණ්ඩපය තුළද වර්ධනය කර ගැනීම සඳහාය.

මේ අන්දමට නික්ලේෂී වීතරාගී රහතුන් බිහිකළ බුදුදහම හැදුනේ වැඩුනේ, පැවතුනේ සොබාදහමත් සමඟ එකට බද්ධ වීමෙනි. මේ නිසාම බුද්ධ ශාසනය එල බරිත ගසකට උපමා කර ඇත. ඒ උපමාව අනුව ලාබ සත්කාර ගසේ කොළ අතු සමානය. සීලය ගසේ පොත්ත හා සමානය. ධ්‍යාන ගසේ සිවිය හා සමානය. ලෞකික අභිඥා ගෙඩි හා සමානය. සෝවාන් අර්හත් ආදිය ගසේ හරය අරටුව හා සමාන වේ.

බෞද්ධ දර්ශනයේ හේතුඵල වාදයට අනුකූලවම පරිසරය ද විග්‍රහ වන්නේ රමණීය කාව්‍යෝත්ති අලංකාරයෙනි.

- පරිසරයට අනුව මිනිසා ඇතිවේ.
- මිනිසා ඉපදීමෙන් පරිසරය ඇතිවේ
- මිනිසා නැතිවිට පරිසරය ද නැත.
- පරිසරය නැතිවීමෙන් මිනිසා ද නැතිවේ.

අභ්‍යාසය

01. පහත සඳහන් වාක්‍ය පාලියට නඟන්න.

i. එසමයෙහි එක්තරා රජ කෙනෙකුන්ගේ තරුණ බිරිඳක් ගැබ් ගත්තී වැදීමට ආසන්න වූවා ය.

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස රඤ්ඤො දහරා මාණවිකා (මහෙසී) ගබ්භිණී උපවිජඤ්ඤා හොති.

ii. සුමනා ඔබ යන්න, පහන පත්තු කිරීම සඳහා තෙල් ගෙනෙන්න'

ගච්ඡ ත්වං සුමනා, තෙලං ආහර යං පදීපං ජාලෙස්සතුං

WWW.PIRIVENA.LK

iii. මම තෙල් ගෙනෙන්නේ කොහෙන් ද?

අහං කුතො පන තෙලං ආහරාමි ?

iv. එක්තරා තරුණයෙක් රෝගී වී දරුණු කටුක වේදනාවෙන් යුතුව වැළපෙයි.

අඤ්ඤතරො යොබ්බනො රොගිං හුත්වා දුක්ඛාහි තිබ්බාහි ඛරාහි කටුකාහි වෙදනාහි ඵුට්ඨො විලපති.

v. බල්ලා තණකොළ ගොමුවෙහි ඒ මේ අත පෙරලෙයි.

සුනඛො තිණගුම්බෙ ආවට්ටති පරිවට්ටති.

02. පහත පදයන්ට අර්ථ විවරණ සපයන්න.

i. පරිබ්බාජකො

බුද්ධ කාලීන භාරතයේ ශ්‍රමණ කණ්ඩායම් අතර සිටි එක් කණ්ඩායමක් වන්නේ පරිබ්‍රාජක කණ්ඩායමයි. බොහෝ පිරිස් සහිතව සිටි ඔවුන් බමුණන්ගේ යාගහෝමාදි බොහෝ කටයුතු විවේචනය කළහ. ශ්‍රමණ පක්ෂය නියෝජනය කළහ. පරිබ්‍රාජකයන් වශයෙන් පිරිමියෝත් කාන්තාවෝත් සිටියහ.

සැරියුත් මුගලන් ආදි අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලා ගිහි කල පරිබ්‍රාජකයෝ ය. සංජය බෙල්ලට්ඨිපුත්ත නම් තැනැත්තා සමීපයේ ඔවුන් ශ්‍රමණ සම්ප්‍රදාය වැඩූ බව ශාසන ඉතිහාසය කියයි. එසේම සුන්දරී පරිබ්‍රාජිකාව ගැන ද අසා ඇත.

භද්දකච්චායනා ඇතුළු පිරිස ලංකාවට පැමිණියේ පරිබ්‍රාජිකාවන් වශයෙන් වෙස් ගෙන බව කියැවේ. භාරතයට සාපේක්ෂව ලංකාවේ ද පරිබ්‍රාජකයන් සිටි බව මහාවංසය කියයි.

ii. රාජා පසෙනදි කොසලො

කෝසලයේ රජු මොහු ය. බුදුරදුන්ට බෙහෙවින් සමීප රජ කෙනෙකු ලෙස මොහු සැලකිය හැකි ය. දිනකට එක් වරක් හෝ බුදුන් හමුවට යෑම සිරිත ය. බුදුන් සරණ ගිය තැනැත්තෙකි. ත්‍රිපිටකයේ කොසල සංයුත්තය නමින් කොටසක් වෙන් කිරීමෙන් ම පෙනී යන්නේ මෙතුමා සමග බුදුරදුන් අතර වූ සමීපතාවයි.

කෝසල රාජ්‍යයේ අගනුවර සැවැත්නුවරයි. පූර්වාරාමය, ජේතවනාරාමය ආදි විහාර පිහිටියේ ද මෙහි ය. මේවා ඉදිකිරීමට

රජුගෙන් කිසිදු බාධාවක් නොවූ බව නිතැතින්ම හඳුනාගත හැකිය. කොසොල් රජුගේ දේවිය වූයේ මල්ලිකා බිසවයි. විඩූඩභ ලෙසින් පුතෙක් ද විය.

අසදෘශ මහා දානය දුන්නේ මේ රජතුමා ය. ශාක්‍ය වංශික තරුණියක විවාහ වීම සම්බන්ධයෙන් ඇති වූ යම් අමනාපකමක් නිසා රැවටීමක් නිසා විඩූඩභ කුමරු ශාක්‍ය වංශිකයන් සමූල ඝාතනය කළ බව ද ඉතිහාසයෙන් කියැවේ.

iii. වෙදගුනො

වෙදගු යනු වේද ශාස්ත්‍රයයි. වෙදගුනො යනු වේද ශාස්ත්‍රය මැනවින් දත් තැනැත්තා ය. ත්‍රිවේදය ගැන අසා ඇත. ඍග්, යජුර්, සාම යනු ත්‍රිවේදයයි. බුදුන්ගේ කාලයේ මෙම ත්‍රිවේදය මැනවින් දත් පිරිස් සිටියහ.

ඍග් වේදය - ප්‍රධාන පූජක ගායනා කරන ලද භක්ති ගීත

ඍජු වේදය - පාලක පූජක විසින් ගායනා කළ සූත්‍ර

සාම වේදය - සංගායනා කරන පූජක විසින් ගායනා කළ සූත්‍ර

ත්‍රිවේදයෙන් පරතෙරට ගිය බමුණන් ගැන හා බුදුන් සමග වාදයට එළඹුණු අය ගැන ත්‍රිපිටකයේ තැන් කිහිපයකින් හමු වේ. සච්චක එවැන්නනෙකි.

තථාගතයන් වහන්සේ වැඩ විසූ කාලයේ වෛශාලිපුරයෙහි **සච්චක** නම් නිගණ්ඨපුත්‍රයෙක් විසී. ඔහුගේ මාපිය දෙදෙන වාද පන්සියය බැගින් දැන සිටි උගතුන් ය. සච්චක ඒ දෙදෙනා දත් සියල්ල ද නොයෙක් ශිල්පශාස්ත්‍ර හා බාහිරසමයයන් ද උගෙන කීර්තිමත් පඬිවරයෙක් විය. ඔහු වෛශාලියෙහි **ලිච්ඡවී** කුමාරයන්ට උගන්වා ගුරුවරයා ද විය. “තමා තරම් දත්, තමා හා වාදකථා කිරීමට සමත් අනිකකු ලෝකයේ නැතය” කියා සිතා ඔහු පණ්ඩිත මානයෙන් මත්ව සිටියේ ය.

ඔහු වෛශාලියෙහි ජනයා මැද සිට මා වාද කළ හොත් වෙවුලා නො යන, කිසිලිවලින් ඩහදිය නො වැගිරෙන පණ්ඩිතයෙක් ගණාචාර්‍යයෙක් නැත. සම්‍යක් සම්බුද්ධය යි කියා ගෙන සිටින්නකු වුව ද මා වාද කළ හොත් වෙවුලා යන්නේ ය. ඔහුගේ කිසිලිවලින් ඩහදිය ගලන්නේ ය”යි පුරසාරම් බස් දොඩන්නේ ය

ත්‍රිවේදයේ පරතෙරට පත් උප්පජය බමුණු කුමරු සිය නිවසේ උඩු මහලේ කුටියට වී කල්පනා කරමින් සිටියේය. අහසේ පාවෙන වලා කැටි ඔහුගේ ඇසට හසුවිය. සුළඟක් පැමිණියේය. වලා විසිර ගියේය. යළි වලා කැටි

WWW.PIRIVENA.LK

ගැසිණි. වලා කුළු රහිත අහස නිලෙන් බබලයි. පැහැදිලියි. වලා පැමිණෙයි. අහස අවුල් වෙයි. පැහැදිලි නිල දුරුවැ යෙයි.

උජ්ජය දෑස වසා ගත්තේය. සුව පහසු අසුනේ සුවය දුරුව ගියේය. ඉරියව්ව වෙනස් කොට සිතිවිලිවලට ඉඩ දුන්නේ ය.

ඔහුට සිය පියා සිහිවිය. රජගහනුවර සොත්ථිය බමුණු මහ වියතකු ලෙස පිදුම් ලැබුවෙකි. ඔහුට අවශ්‍ය වූයේ සිය පුතු ද ත්‍රිවේදයෙහි පරතෙරට පත් මහ වියතකු වනු දැකීමය. දැන් එය ඉටුව තිබේ. තුරුණු බමුණන් අතර උජ්ජය තරමට ත්‍රිවේදය දැන උගත් අයෙක් නොවීය. සොත්ථිය බමුණා පුතු පිළිබඳ පසුවූයේ මහත් ආඩම්බරයෙනි. මා මෙන් මගේ පුතා ද, නැහැ මටත් වඩා ජන සමාජයෙන් පැසසුම් ලබාවි. ඔව් දැනටමත් ඔහු පැසසුම් ලබනවා. අපේ පරපුරට බ්‍රාහ්මණ වංශයට අහෝ ඔහු කොපමණ ගෞරවයක්ද? පියා සිය සගයන් සමග පුතුගේ දස්කම් කීවේය. සගයෝ ද ඒ බසට එකඟව උජ්ජයට ගරු කළහ. හිස නැමූහ. පැසසුම් වැඩි වත්ම වැඩිවත්ම උජ්ජයගේ හිස බිමට නැමිණි. පසසන්නන්ගේ මුහුණු බැලීම ඔහුට අප්‍රිය විය " මම උගත් මන්ත්‍ර ජප කරමි. ධ්‍යාන වඩමි. සිත සන්සුන් ව තබා ගනිමි. ධ්‍යානයෙන් මිදෙමි. යළි නොසන්සුන් ලොවට පිවිසෙමි. මා උගත් වේදයෙන් ඇති ඵලය කිම? තොර නොවූ නිවීමක් ඇති සිතක් මට වුවමනායි."

උජ්ජය දෑස හැර බැලුයේය. ඔහුට ඈත කඳු පෙනිණි. ගිජුකුළු පව්ව ඔහුට හඳුනා ගත හැකිවිය. කහ පැහැ රෑ රැසක් ඔහුගේ ඇස ගැටිණි. ගිජු කුළු පව්ව ඇසුරු කොට වැඩ සිටින්නේ බුදු සව්වෝය. බුදු රජාණන් වහන්සේ ගේ ශ්‍රාවකයෝය. වේළුවනාරාමයේ වැඩ සිටින උන්වහන්සේ ගැන වරක් දෙවරක් අසන්නට ලැබුණ ද උජ්ජය උන්වහන්සේ ගැනවත්, උන්වහන්සේ ගේ ධර්මය ගැනවත් උනන්දු වූයේ නැත. ත්‍රිවේදය දන්නා මට අන් දහමක් කුමටද? ඔහු සිතුයේ එසේය. දැන් මට ත්‍රිවේදයෙන් ඇති ඵලය කිමැයි සිතෙනවා. මා වේළුවනාරාමයට ගොස් ඒ ධර්මය කුමක්දැයි සොයා බැලිය යුතු යි. උජ්ජය උඩු මහලෙන් බිමට බැස්සේය. අස් රියකට නැගුණේය. වේළුවනාරාමය ඈත පෙනෙනු දැක රියෙන් බැස්සේය. පයින් යන සැදැහැවතුන් පිරිසකට එක් වූයේය.

උණ ගස්වලින් පිරුණු ඒ සොඳුරු වන පෙත ඔහුගේ සිත ශාන්ත හැඟීමෙන් පිරවූයේය. නිල් තණ පතින් පිරුණු පුළුල් තැනි බිමක මහ පිරිසක් හිඳගෙන සිටිති. ඒ පිරිස ඉදිරියේ තණ ඇතිරිල්ලක් සහිත ගල් තලාවක වැඩ සිටින බුදුරජාණන් වහනසේ දහම් දෙසති.

පිරිස අග හිඳගත් උජ්ජය සවන් දී සිටියේය.

" ගතද්ධිනෝ විසෝකස්ස
විප්පමුත්තස්ස සබ්බධි
සබ්බ ගන්ථ පහිනස්ස
පරිළාහෝන විජ්ජතී "

WWW.PIRIVENA.LK

“ සසර ගමන අවසන් කළ, සසර මුල් කොට ඇති ශෝකය දුරු කළ, ඡන්ද රාගය නැති නිසා මිදුණු සියලු කෙලෙස් ගැට දුරු කළ රහතන් වහන්සේට කෙලෙස් දැවිල්ලක් නැත.

ඒ පද ඔහුගේ සිතෙහි ගැඹුරින් කා වැදිණි.

“ මා උගත් ත්‍රිවේදයෙන් ඒ කෙලෙස් දැවිල්ල නැතිවෙන්නේ නැහැ. මා පැතූ සැනසිලි දායක දහම ඇත්තේ මෙතන ...” දහම් දෙසුම අවසන පිරිස ඉවත්ව ගියද ඔහු හිඳ ගත් තැනම සිටියේය. සිතේ දැවිල්ලෙන් තොර වීමට ඡන්ද රාගයෙන් මිදිය යුතුයි. එය සිදු කළ යුත්තේ කෙසේද? බුදු රජාණන් වහන්සේ එය දන්නවා. මා උන්වහන්සේගෙන් එය ඉගෙන ගන්නවා.

ඔහු නැඟී සිටියේය. වේළුවනාරාමයෙන් පිටතට පැමිණියේය.

“ මා පයින් එනවා. රිය ගෙන යන්න “ ඔහු අස් ගොව්වාට අණ කෙළේය.

රහතන් වහන්සේට කෙලෙස් දැවිල්ලක් නැත. ඒ පද ඔහුගේ සිතට දෝංකාර දුන්නේය. ඔහු රැය පහන් කෙළේ නොඉවසිල්ලෙනි. පසු දා උදෑසනම වේළුවනාරාමයට ගියේය.

“ මා ආයේ පැවිදිවන්නටයි” ඔහු තුරු සෙවණක වැඩ සිටි හිමි නමකට කීවේය.

උජ්ජය පැවිදි විය. සිතේ කෙලෙස් කසට උදුරා දමන්නේ කෙසේදැයි උජ්ජය හිමි ඒ හිමිවරුන්ගෙන් අසා දැන ගත්තේය. ඉන්පසු විදසුන් වැඩීම සඳහා ගිජුකුළු පව්වට වැඩම කෙළේය. වැඩි කලක් නොගෙස් උජ්ජය හිමියෝ රහත් බව ලැබූහ.

රහතන් වහන්සේ නමක් කෙලෙස් දැවිල්ලෙන් තොරව ලබන ශාන්ත සුවය, උන්වහන්සේට ද දැනෙන්නට විය. ඒ සුවයෙන් සිත පිරී ගිය මොහොතක උජ්ජය රහතන් වහන්සේගේ මුවින් මේ උදානය පළ විය.

සියල් සකර දම් කෙරෙන් මිදී ආ
බුදු විරුවාණනි, ඔබ පා නමදිමි.
ඒ පිළිවෙත් මඟ ගමන් කෙළෙමි මම
කෙලෙස් නසා දැන් සුවසේ පසුවෙමි.

iv. සමණස්ස වා බ්‍රාහමණස්ස

සමණ හෝ බ්‍රාහ්මණ

ශ්‍රමණ යනු ලෞකිකත්වයෙන් මිදී ආධ්‍යාත්මිකත්වය කෙරෙහි එල්බ ගත් අරමුණුවලින් යුතු තැනැත්තා ය.

WWW.PIRIVENA.LK

බ්‍රාහ්මණ මතවාදයන්ට එරෙහිව නැගී සිටි පිරිස ශ්‍රමණ කණ්ඩායමයි. ෂට් ශාස්තෘවරුන් අයත් වන්නේ ද මේ ගොණුවට ය.

ඔවුන් වෛදික සම්ප්‍රදායට විරුද්ධ ය.

ඒකදේවවාදය හෙවත් ඊශ්වර නිර්මාණවාදය

යාගය ඇතුළු කර්ම මාර්ගය

බ්‍රහ්ම සහව්‍යතාව

ස්වධර්ම හා ආපද් ධර්ම

කාන්තාව කෙරෙහි බමුණන් දැක්වූ ආකල්පය

ශුද්‍රයාට තිබූ සමාජ තත්ත්වය

වේදය ශුද්ධ ග්‍රන්ථ වන බව

ආදිය ශ්‍රමණ කණ්ඩායම් ප්‍රතික්ෂේප කළහ.

ශ්‍රමණ කණ්ඩායම්වල විශිෂ්ටතම හා නිවැරදි මගට පිළිපන් පිරිස වූයේ භික්ෂූන් වහන්සේලා ය. අනෙකා විවිධ මිථ්‍යා ආගමික ඇදහිලි හා දර්ශන උලුප්වමින් පෙන්වා දෙමින් සමාජය නොමග යැවී ය.

බ්‍රාහ්මණ යනු බමුණන් ය. මහාබ්‍රහ්මයා ලෙසින් බමුණන් හැඳින්වූයේ ලෝකය මවන තැනැත්තා ඔහු බවයි. එහි දී බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ක්ෂුද්‍ර ලෙස මහාබ්‍රහ්මයාගේ ශරීරයේ විවිධ ඉන්ද්‍රියන් මගින් අදාළ වර්ණ නිර්මාණය කරන බවත් ඒ අනුව උසස් පහත් බව තීරණය කරන බවත් පෙන්වා දී සමාජ බෙදීමක් ඇති කර තිබිණි. වෛදික යුගය යනු මෙකී යුගයයි.

බුදුදහමේ මහාබ්‍රහ්මයා යනු විශිෂ්ට චරිත ලක්ෂණයන්ගෙන් පිරුණු චරිතයකි. මහා බ්‍රහ්මයා සතු ලක්ෂණ අතර මෙත්තා මුදිතා කරුණා උපේක්ෂා දි ගුණ දහම් ඇති බව දක්වයි.

වසල සූත්‍රයේ දී වසලයෙක් හෝ බමුණෙක් වන්නේ ක්‍රියාව අනුව බව දක්වා ඇත.

03. බුද්ධකාලීන භාරතීය සමාජය පිළිබඳ ගබ්භිනී සූත්‍රය ඇසුරින් විස්තර කරන්න.

WWW.PIRIVENA.LK

ගබ්භිනී සූත්‍රය බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩවෙසෙන සමයේ දේශනා කළ උදාන වාක්‍යයකින් සමන්විත උදාන සූත්‍රයකි.

ජේතවනය අසල වූ එක්තරා පිරිවැජියෙකුගේ බිරිඳක් ගැබ් ගෙන දරුවා ප්‍රසූත කිරීමට ආසන්න කාලයේ දී ඇයට ඇති වූ ප්‍රසූත වේදනාව දුරු කර ගැනීමට ගිතෙල් අවශ්‍ය විය. එහෙත් පිරිවැජියාට එවැනි දෑ ලබාදීමට තරම් ශක්තියක් නැත. රජතුමාගේ ගබඩාවේ බොහෝ දෑ තිබේ. ගිතෙල්, තලතෙල් ආදිය මහණ බමුණන්ට රිසි සේ අනුභව කිරීමට අවස්ථාව ලබා දී තිබිණි. එහෙත් පිටතට රැගෙන යාම තහනම් ය. මේ තැනැත්තාත් ගබඩාවට ගොස් බොහෝ සේ පානය කොට තම බිරිඳ හමුවෙහි වැමෑරීම ඔහුගේ අදහසයි. එහෙත් එසේ බොහෝ සේ පානය කළත් නැවත වැමෑරීමට ඔහුට නොහැකි විය. තදබල වේදනාවකට පත් විය. මේ සිදු වීම දැන බුදුරදුන් සුඛිනො වත යෙ අකිඤ්චනා යනාදි උදාන ගාථාව දේශනා කළ සේක.

මෙම කතා පුවතින් තත්කාලීන සමාජය ගැන ද යම් අදහසක් ලබා ගත හැකි ය.

පරිබ්‍රාජක නමින් වූ ශ්‍රමණ කණ්ඩායම ගෘහීය ජීවිතයක් ගත කළ කොටසක් බව පෙනේ. එය විශේෂ කරුණකි.

සැවැත්නුවර සුවිසල් සිටුමැදුරු හා දියුණු සමාජ ක්‍රමයක් තිබුණත් ගිතෙල් බිඳක් හෝ මිළට ගත නොහැකි තරමින් දිළිඳු මට්ටමෙන් ජීවත් වූ පිරිසක් සිටි බව කියැවේ. එසේම අවශ්‍ය අවස්ථාවල දී ගිතෙල් සොයා ගැනීමට අපහසු වී ඇති බව ද මෙයින් කියවේ.

කොසොල් රජතුමා පැවිදි මහණ බමුණන්ට සංග්‍රහ සම්මාන කළ බව කීමට කදිම නිදසුනක් මෙහි වේ.

ශ්‍රමණයන්ටත් බමුණන්ටත් පමණක් ගිතෙල් අනුභව කිරීමේ අවස්ථාව ලබා දී ඇති බව පෙනේ. 'සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා' යන්නෙන් කියැවෙන්නේ එයයි.

අවශ්‍ය ප්‍රමාණයට ආහාර කෑමට හැකි වුවත් රැගෙන යාම තහනම් කර ඇත. දන්සැලක ස්වරූපයක් ඉන් අප මතකයට නැගේ. මුදල් අය කිරීමක් ගැන ද නොකියවේ.

04. ගබ්භිනී සූත්‍රයෙන් ප්‍රකට වන තත්කාලීන සිරිත් විරිත් කවරේදැයි හඳුන්වා දෙන්න.

WWW.PIRIVENA.LK

දරුවන් ප්‍රසූත කිරීමේ දී තම බිරිඳට අවශ්‍ය කරන සියලු පහසුකම් සැමියන් විසින් ලබා දීමට වෙහෙස ගත් බව කියවේ.

අවශ්‍ය තරම් කැඹිය හැකි වුවත් රැගෙන යාමේ තහනම පණවා ඇති බව පෙනේ.

ගිතෙල් වැනි පානයක් අනුභව කොට නැවත එය වමාරා පානය කිරීම හා එකී වැමෑරූ ගිතෙල් නැවත පානය කිරීමට යෙදීම මැතකාලීනව දැකිය නොහැකි ක්‍රියාවකි.

අභ්‍යාසය

01. පහත අර්ථය දෙන සූත්‍ර පාඨය උද්ධෘත කර ලියන්න.

i. ඇවැත්නි, මම සසුනට ඇල්මක් නැතිව බඹසර හැසිරෙමි.
''අනභිරතො අහං ආවුසො බ්‍රහමචරියං චරාමි''

ii. ආර්ය පුත්‍රය වහාම යන්න.
''තුවටං ඛො අය්‍යපුත්ත ආගච්ඡෙය්‍යාසී'ති

iii. නන්දයෙනි, ඔබ මේ අප්සරාවන් පන්සියය දක්නෙහි ද?
''නන්‍ද, ත්‍වං පඤ්ච අච්ඡරාසතානි පස්සසි ?

iv. ආයුෂ්මත් නන්ද තෙම බැල මෙහෙවරකරුවෙකි.
ආයස්මා නන්‍දො භතකො.

v. ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ එම පොරොන්දුවෙන් මුදවමි.
භන්තෙ, අහං භගවන්තං එතස්මා පටිස්සවා මුඤ්චාමි.

02. සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න. අර්ථය ද ලියන්න.

(භික්ඛූනං, භික්ඛ, භික්ඛුං, ත්‍වං, පච්චක්ඛාය, පාටිභොගො, අච්ඡරාසතානං)

i. න සක්කොමි <u>බ්‍රහමචරියං</u> සන්‍ධාරෙතුං.

ii. එහි ත්‍වං <u>භික්ඛු</u> මම වචනෙන නන්‍දං <u>භික්ඛුං</u> ආමන්තෙහි.

iii. සච්චං කිර <u>ත්‍වං</u> නන්‍ද සම්බහුලානං <u>භික්ඛූනං</u> එවමාරොචෙසි.

WWW.PIRIVENA.LK

iv. සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සාමි.

v. අහං තෙ පාටිභොගො පඤ්චන්නං අච්ඡරසතානං පටිලාභාය.

03. පාලියෙන් පිළිතුරු සපයන්න.

i. කස්ස පන භික්ඛුනො අනභිරතො පාතුරහොසි ?
නන්දො භික්ඛු අනභිරතො පාතුරහොසි.

ii. කො නන්දං බාහාය ගහෙත්වා දෙවලොකං අගමාසි ?
භගවා නන්දං බාහාය ගහෙත්වා දෙවලොකං අගමාසි.

iii. නන්දො තාවතිංසෙසු කානි අපස්සි ?
නන්දො තාවතිංසෙසු පඤ්ච අච්ඡරාසතානි අපස්සි.

iv. නන්දො කස්ස භාතා අහොසි ?
නන්දො භගවතො භාතා මාතුච්ඡාපුත්තො අහොසි.

v. නන්දස්ස සහායකා භික්ඛූ නන්දං කථං සමුදාචරිංසු ?
නන්දස්ස සහායකා භික්ඛූ නන්දං භතකවාදෙන ච
උපක්කිතකවාදෙන ච සමුදාචරිංසු.

04. පහත සඳහන් අර්ථය දෙන පාලි වාක්‍යාංශය සූත්‍රයෙන් තෝරා ලියන්න.

i. පුළුටු වැඳිරිය - පළුට්ඨකමක්කටී

ii. අඩක් පීරූ කෙස් ඇතිව - උපඩ්ඪුල්ලිඛිතෙහි කෙසෙහි

iii. පරවී පා බඳු පා ඇති - කකුටපාදානං

iv. ගිහිබවට යන්නෙමි - හීනායාවත්තිස්සාමි

v. ළඟින් තැබීමට නොසුදුසු - උපනිධිං (අපි) න උපෙති

vi. පොරොන්දුව - පටිස්සං

vii. විකුණාගනු ලැබූවෙකි - උපක්කතිකො

viii. ඇපවීම - පාටිභොග

05. විවරණ සපයන්න.

WWW.PIRIVENA.LK

i. බ්‍රහ්මචරියං

බ්‍රහ්මචාරී යනු බඹසර විසීමයි. එනම් කාමභෝගී ජීවිතයෙන් මිදී ලෝකෝත්තර විමුක්තිය පිණිස කටයුතු කිරීමයි.

අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං යනුවෙන් අබ්‍රහ්මචාරීත්වයෙන් මිදීම හෙවත් බ්‍රහ්මචාරීව හැසිරීම ගැන දසසික්ඛාපදවල අන්තර් ගත වේ.

බ්‍රාහ්මණයන්ගේ ආශ්‍රම ධර්මවල දී බ්‍රහ්මචාරී, ගෘහස්ථ, වානප්‍රස්ථ, සන්‍යාසි වශයෙන් කොටස් 4කින් යුක්ත ය. එහි බ්‍රහ්මචාරී අවදිය යනු අධ්‍යාපනය හදාරන කාල වකවානුවයි.

මෙහි අදහස් කරන්නේ කාමභෝගී දිවියෙන් මිදී ආධ්‍යාත්මික ගුණ වර්ධනය විෂයයෙහි කටයුතු කිරීමේ ස්වභාවය බව පැහැදිලි කරගන්න.

අචරිත්වා බ්‍රහ්මචරියං අලද්ධා යොබ්බනෙ ධනං ආදි වශයෙන් ළමා කාලයේ අධ්‍යාපනය හැදෑරීම කළ යුතුම බව දක්වා තිබේ.

ii. අභිඤ්ඤා සච්ඡිකත්වා

අභිඤ්ඤා යනු විශිෂ්ට වූ දැනීමයි. පඤ්ච අභිඤ්ඤා හා ෂළභිඤ්ඤා ආදි වශයෙන් විශිෂ්ට දැනීමෙන් යුතු වීමයි. සච්ඡිකත්වා යනු අවබෝධ කරගැනීමයි. මනා දැනීම අවබෝධ කරගැනීම යනුවෙන් හැඳිනිය හැකිය.

iii. ඛීණා ජාති

ඛීණ යනු ක්ෂය කළ යන අදහසයි. ජාති යනු ජාතියයි, ඉපදීමයි. ඛීණා ජාති යනු ඉපදීම ක්ෂය කළ යන අදහසයි. එනම් රහත්, පසේබුදු, සම්බුදු යන උතුමන් වහන්සේලා ය.

iv. දෙවෙසු තාවතිංසෙසු

තාවතිංසය යනු දෙව් ලෝ සයෙන් එක් දිව්‍ය ලෝකයකි. බුද්ධත්වය ලබන බෝධිසත්ත්වයන් වහන්සේ තවුතිසා දිව්‍යලෝකයෙන් ච්‍යුත ව මනුෂ්‍ය ලෝකයේ උපදින බව සඳහන් වේ. මනුෂ්‍ය ලෝකයේ පින්කම් කරන බොහෝ පිරිස් කළුරිය කොට දිව්‍ය ලෝකයේ උපත ලබන බව දැක්වේ. මුගලන් මහතෙරුන් වහන්සේ දිව්‍යලෝකයේ ගොස් එහි තතු මිනිස් ලොවේ අයට පෙන්වා දී ධර්ම දේශනා කරන බව ද පේතවත්ථු විමානවත්ථුවල දැක්වේ.

WWW.PIRIVENA.LK

v. සාවත්ථියං

සැවැත්නුවරයි. කොසොල් රාජ්‍යයේ අගනගරයකි. බුදුරදුන් ජීවමානව බොහෝ කලක් වැඩ සිටි දෙව්රම්වෙහෙර පිහිටියේ මෙහි ය. එසේම පාවාරිකාරාමය, පූර්වාරාමය, කුක්කුටාරාම ආදි විහාරස්ථානත් පැවතියේ මෙහි ය.

අනේපිඬු, විශාඛා ආදි පිරිස ද ජීවත් වූයේ මෙහි ය.

06. සිංහලෙන් පිළිතුරු සපයන්න.

i. පළමු අවස්ථාවේ දී නන්ද තෙරුන්ගේ ජනපද කල්‍යාණිය පිළිබඳ ආකල්පය විස්තර කරන්න.

නන්ද තෙරුන් ගිහි කල දැක තිබූ සුන්දරම කාන්තාව සුන්දරිය යි. නන්දා කුමරිය යි. ඔහු ඇය කෙරෙහි බැඳී සිටියේ එබැවිනි. ඔහුට පැවිදි දිවියේ බ්‍රහ්මචාරීව මහණදම් පිරීමට නොහැකි වූයේ නන්දා ගැන සිතා සිටි නිසා ය.

ii. නන්ද තෙරුන් දෙවඟනන් දුටු පසු ජනපද කල්‍යාණිය පිළිබඳ දක්වන ලද ආකල්පය විස්තර කරන්න.

බුදුරජාණන් වහන්සේ නන්ද තෙරුන් දිව්‍ය ලෝකයට වැඩම කරවා ගෙන දිව්‍ය අප්සරාවන් සම්මුඛ වීමෙන් මෙතෙක් වේලා සිත විපිළිසර කැරගෙන සිටි ස්වරූපය ඉවත් කරගෙන දිව්‍ය අප්සරාවන් කෙරෙහි සිත බැඳිණි. බුදුහිමියන් ජනපදකල්‍යාණිය පිළිබඳ ඇසූ කල්හි දෙව්ලෝ වඩින මොහොතේ පිළිස්සූ හේනක පිලිස්සී කරවී සිටි වැදිරිය බඳු යැයි කීවේය. ජනපද කල්‍යානිය ගැන එතෙක් තිබූ අදහස ඉවත හැරිණි.

iii. නන්ද සූත්‍රයේ ඇතුළත් චරිත ගණන නම් කරන්න.

- බුදුරජාණන් වහන්සේ
- නන්ද තෙරුන්
- ජනපද කල්‍යාණිය
- නන්ද හිමියන්ගේ හිතවත් භික්ෂූන් වහන්සේලා
- දිව්‍ය අප්සරාවන්

WWW.PIRIVENA.LK

iv. දෙවඟනන් පතා මහණදම් කරන නන්ද තෙර ඔබ යැයි උපකල්පනය කොට ඔබට දොස් නගන යහළුවන්ගේ කියමන් දක්වන්න.

මෙවැනි අදහස් ප්‍රායෝගිකව ලබා ගැනීම වටී.

v. නන්ද තෙරුන්ගේ කථාව තේමා කොටගෙන රචිත නිර්මාණ එකතු කරන්න.

(පොත්/ ගීත/ චිත්‍ර)

නවදැලි හේනක පැව වැදිරි රුව - සෝමතිලක ජයමහ

සෞන්දරානන්දය

(තවත් නිර්මාණ සොයන්න)

07. නන්ද සූත්‍රය ආශ්‍රයෙන් පාලි සංවාදයක් ලියන්න.

ඔබ ඔබටම අනන්‍ය සංවාදයක් ගොඩ නගන්න.

WWW.PIRIVENA.LK

දාහත් වැනි පාඩම

අභ්‍යාසය

i. අපදාන යන්නෙහි අර්ථය ලියන්න.

පූර්වයේ කරන ලද කුශලානුභාවයෙන් ජනිත වූ උදාර චරිතයක් පූර්වේනිවාසානුස්මෘතියෙන් හෙවත් පෙරවිසූ කඳ පිළිවෙළ දක්නා නුවණින් දැක අතීත වෘත්තාන්තය වශයෙන් ගෙනහැර පෑම අපදාන නම් වේ.

ii. අපදානපාළිය ඛුද්දක නිකායේ කී වැනි ග්‍රන්ථය ද?

13වැනි ග්‍රන්ථයයි.

iii. අපදාන වර්ග කීය ද? ඒ මොනවාද ?

4කි. බුද්ධාපදාන, පච්චේක බුද්ධාපදාන, ථේරාපදාන, ථේරී අපදාන වශයෙනි.

iv. අපදානපාලියෙහි ඇතුළත් සියලු අපදාන සංඛ්‍යාව කීය ද?

සියලු අපදාන 592කි.

v. අපදානපාළියෙහි ඇතුළත් ගාථා ගණන කීය ද?

ගාථා 7619කි.

vi. අපදානපාළියෙහි අටුවාවෙහි නම කුමක් ද?

විසුද්ධජනවිලාසිනී

vii. අපදානට්ඨකථාවේ කතුවරයා කවුද?

මහානාම හිමි

viii. අපදානපාළියෙහි ථේරී අපදාන කීයක් ඇතුළත් ද?

ථේරී අපදාන 40කි.

ix. නවාංගසත්ථුසාසනය නම් කරන්න.

සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල

x. මහා ප්‍රජාපතී ගෝතමී අපදානයෙහි ඇතුළත් ගාථා ගණන කීය ද?

ගාථා 190කි.

WWW.PIRIVENA.LK